
ඒ. බෙලායෙෆ් ගේ
කුංචනාදූ
අනුවාදය-
ජේ.ර්. ගුණසේකර

බල පත්‍රය

කුංම නාද
ජේ. ඊ. ගුණසේකර

යොමු අංකය : අ.ප්‍ර.ම. /2/2463

1952 පෙබරවාරි මස 29 වැනි දින නිකුත් කරන ලද ලංකාණ්ඩුවෙහි ගැසට් පත්‍රයෙහි පළවූ උපකෘත, ස්වභාෂා හා ඉංග්‍රීසි පාඨශාලාවන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ '19/ඒ' ඡේදය යටතේ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්තුමන් විසින් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කරන ලදී.

විල්සන් කරුණාරත්න
ලේකම්
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන
උපදේශක මණ්ඩලය.

1981 මාර්තු මස 24 දින,
කොළඹ 2,
මැලේ වීදියේ,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන
උපදේශක මණ්ඩලයේදීය.

අනුවාදකගේ වෙනත් කෘති :

භාෂාව :

රචනාදර්ශය – (ආදර්ශ රචනා සංග්‍රහය)

පරිවර්තන :

කැතී සහ කිඹුලා – ළමා චිත්‍රපටි කතාවකි.

නව සඳ සහ වෙනත් කතා – චීන කෙටි නවකතා තුනකි.

උභය ජීව – විද්‍යාත්මක නව කතාවකි. (1983 සාහිත්‍ය සම්මානය)

විස්කම් දැරිය – විද්‍යා ප්‍රබන්ධයකි.

මරුට අත වැනූ මැවුම්කරු – විද්‍යාත්මක නව කතාවකි.

එලෝ අමුත්තෝ – ළමා විද්‍යා ප්‍රබන්ධයකි.

අයිය මලෝ – සෝවියට් ළමා කතාවකි.

ළමා පොත් :

මුතු මාලය
ඔටුවාගේ සිහිනය
කුංවා
හැංගිමුත්තං

සෝවියට් විද්‍යා ප්‍රබන්ධ ලේඛක
ඇලෙක්සැන්ඩර් බෙලායෙව්ප් ගේ

කුංචි නාද

අනුවාදය :
ජේ. ර්. ගුණසේකර

මිහිර ප්‍රකාශකයෝ
56, රණාල පාර,
හබරකඩ - හෝමාගම.
ටෙලි : 074-443055

පළමුවන මුද්‍රණය – 1980
දෙවන මුද්‍රණය – 1983
තුන්වන මුද්‍රණය – 1985
සිවුවන මුද්‍රණය – 1998

කවරය සහ සැකසුම : - සංජීව ගුණසේකර

මුද්‍රණය
තිලක් මුද්‍රණාලය
විර මාවත,
දෙපානම – පන්නිපිටිය.

හැඳින්වීම

කල්පිතය ඉවත ලන නවින විද්‍යාව පිළිගන්නේ ප්‍රත්‍යක්ෂ සත්‍යය පමණකි. විද්‍යා ප්‍රබන්ධය (Science Fiction) කල්පිතයක් වුවද ප්‍රත්‍යක්ෂය ගුරු කොට ගත් විද්‍යාත්මක චින්තන ක්‍රමය අනුව නිර්මාණය කරන ලද්දක් නිසා එය සත්‍යයට පටහැනි නොවෙයි. සැබැවින් ම විද්‍යා ප්‍රබන්ධය, විද්‍යාව විසින් කවර ද හෝ බිහි කරනු ලබන ලෝකයේ චිත්‍රයක් අප හමුවෙහි මවා පායි.

විද්‍යාවේ සීඝ්‍ර දියුණුව නිසා ඇතැම් විද්‍යා ප්‍රබන්ධයක් යථාර්ථයක් බවට පත්වීමට එතරම් දිගු කලක් අවශ්‍ය නොවෙයි. අජටාකාශ විද්‍යාවේ පියා වශයෙන් සලකනු ලබන 'කොන්ස්ටන්ටයින් ෂියොල්කොව්ස්කි' (Constantin Tsiolkovesky) 1893 දී 'සඳ තලය මතදී' (On The Moon) නම් විද්‍යා ප්‍රබන්ධයක් ලිවීය. සඳ ගැන බොහෝ තොරතුරු සොයාගත් විද්‍යාඥයකු වූ ෂියොල්කොව්ස්කි තමා සොයාගත් එම කරුණු පාඨකයනට දීම සඳහා තාරකා විද්‍යාව හදරන තරුණයකු සහ ඔහුගේ මිතුරු හෞතික විද්‍යාඥයකු සිහිනෙන් සඳට යවයි. ඔවුන් සඳ මත යාම් – ඊම්, විද්‍යා පර්යේෂණ සහ වික්‍රම ක්‍රියාවන් කරන්නේ ෂියොල්කොව්ස්කි සහ ඔහුට පෙර විසූ විද්‍යාඥයන් විසින් සඳ ගැන සොයාගෙන තිබූ භෞතික තත්වයන් තුළ ය. ඔහු මෙම විද්‍යා ප්‍රබන්ධය ලියා අවුරුදු 80 ක් ගතවීමටත් පෙර, 1969 ජූලි මස 21 වැනිද නීල් ආම්ස්ට්‍රෝං සඳට ගොස් සඳ තලය මත වූ එම තත්වයන් හැබැහින් ප්‍රත්‍යක්ෂ කෙළේය.

මින් පෙර නුවූ විරූ පරිදි අද විද්‍යාවේ ඒසු වර්ධනයක් සිදු වෙමින් පවතී. මිනිසා ගේ භෞතික පරිසරය කෙරෙහි මෙන්ම ඔහුගේ සිතුම් පැතුම් කෙරෙහි ද විද්‍යාව අසීමිත බලයක් පායි. මේ නිසා දියුණු රටවල විද්‍යා ප්‍රබන්ධය ඉතා දියුණු සාහිත්‍යාංගයක් බවට පත් වී තිබේ. එහෙත් සිංහල පාඨකයාට කියවීමට සුදුසු විද්‍යා ප්‍රබන්ධ එතරම් සුලභ නොවේ. සිංහලයෙන් ලියැවුණු විද්‍යා ප්‍රබන්ධ ඇත්තේම නැතැයි කිව යුතු තරම් ය. ඒ නිසා බටහිර සාහිත්‍යයන්හි ඇති හොඳ විද්‍යා ප්‍රබන්ධ හෝ සිංහලට නහා පළ කිරීම කාලීන අවශ්‍යතාවක්ව ඇත. කුංච නාද නම් මේ කුඩා විද්‍යා කථාව අප විසින් සිංහලට නහන ලද්දේ – ඉංගිරිසියෙන් කියවන චමත්කාර ජනක දේ අවකාශ ලැබෙන පරිදි සිංහලෙන් ලිවීම අපගේ විනෝදාංශයක් නිසා වුවද මෙයිනුදු අර අවශ්‍යතාව යන්තමින් හෝ පිරිමැසෙතොත් අපි සතුටු වෙමු.

සෝවියට් විද්‍යා ප්‍රබන්ධයේ ආදිතමයා වශයෙන් සැලකෙන ඒ. බෙලායෙෆ් ගේ මේ කථාව අපූර්ව ජීව විද්‍යාත්මක පරීක්ෂණයක් ගැබ්කර ලියන ලද්දකි. එය කුමන දැනුමක හෝ කුමන වයසක හෝ පාඨකයකුට වුවද කියවා නොමඳ රසයක් සහ දැනුමක් ලැබිය හැකි කෘතියකි. එහෙත් ආකෘතිය විසින් සුරංගනා කථාවක් මෙන් සුන්දර වූ මේ පොත පාසල් සිසුනට නව ආරක රසයක් දීමට වෙසෙසින් සමත් වනු ඇත.

ජේ. ර්. ගුණසේකර

හෝමාගම,
හබරකඩ දී ය.

පටුන

			පිට
1.	අද්භූත ක්‍රීඩකයා.	...	09
2.	පමණට වැඩි අවමානය.	...	15
3.	යුද්ධ ප්‍රකාශයක්.	...	25
4.	විද්‍යාඥයා සහායට එයි.	...	28
5.	'රිං' ට මිනිහකු වෙන්න බෑ.	...	38
6.	ගොරිල්ලෝ පන්දු ගසති.	...	44
7.	නොපෙනෙන විලංගු.	...	59
8.	මත් වූ ඇත්තු.	...	64
9.	රිං ඇතකු වෙයි.	...	70
10.	ඇනා ගේ කතාව.	...	80
11.	අලි රංචුව සමග . . .	...	95
12.	අලියා අලිමරුවනට මෙහෙ කරයි.	...	102
13.	කට්ටියා ගේ කට්ටකම්.	...	112
14.	මරුවෝ මරාගෙන මැරෙති.	...	120
15.	වාසනා උදව.	...	124

පරිවර්තනයේ හිමිකම්
ඇවිරිණි.

කුංච නාද

1

අද්භූත ක්‍රීඩකයා

බර්ලින් නුවර බුෂ් සර්කස් ක්‍රීඩාංගනය නරඹන්නන්ගෙන් පිරී ඉතිරී තිබුණි. ඔවුන් ඇසිපිය නොහෙළා මේ බලා සිටින්නේ හොයිටි-ටොයිටි, වේදිකාවට එන තුරු ය.

හොයිටි-ටොයිටි අස්වාභාවික හැකියාවන් ඇති විශාල ඇතෙකි. ඌ සර්කසයට ආ දා සිට නගරයේ ප්‍රධාන කතා බහට ලක් වූයේ මේ අරුම පුදුම ක්‍රීඩකයා ය. සෑම දර්ශනයකදීම ප්‍රවේශ පත්‍ර ඉවර වීම නිසා

බොහෝ දෙනකුට ආපසු යාමට සිදු විය. කවදාවත් සර්කස් බලන්නට නොා යන ඉහළ පෙළේ උගත්තු පවා ඉස්සරහ පේළියේ ආසන අල්ලාගෙන දැහැනට සමවැදුණාවුන් මෙන් හොයිටි-ටොයිටි එන තුරු නිහඬ ව බලාගෙන සිටියහ.

තිරයට පිටුපසින් ගැඹුරු කුංච නාදයක් ඇසුණි. සර්කස් සේවකයෝ රතු ඉරි වැටුණු විසිතුරු ඇඳුම් ඇඳගෙන පෙළ ගැසී සිටියහ. දොරටුවේ තිරය දෙකඩ වී සම්පූර්ණයෙන් ඇරුණේය. නරඹන්නන් කෙරෙන් කන් බිහිරි කරවන ප්‍රීති ඝෝෂා නැහෙද්දී හොයිටි-ටොයිටි තේජස්වී ලෙස හෙමින් හෙමින් ඉදිරියට පා නැගුවේය. රන් නූලෙන් ගෙත්තම් කර සේද පල්ලු එල්ලූ රෙදි කඩක් උගේ හිසේ දමා තිබුණේය. ලෝම කබායක් ඇඳගෙන දෙපැත්තට නැමි නැමී ගමන් කළ පුංචි මිනිහකු වූ ඇත්ගොව්වාත් සමග රහ මඩල වටේ කීප වරක් ගමන් කළ ඇනා එහි හරි මැදට අවුත් සහාවට මූණ ලා නිශ්චල ව හිටගත්තේ ය.

'නෝනාවරුනි, මහත්වරුනි, සත් කීර්තිමත් හොයිටි-ටොයිටි නම් හස්ති රාජයා තමුන්නාන්සේලා වෙත ඉදිරිපත් කිරීමේ ගෞරවය මට හිමි වී තිබෙනවා. උගේ ශරීරය අඩි දහතරහමාරක් දිගයි. උස අඩි එකොළහමාරයි. හොඬ වැලේ අග සිට වලිගයේ අගට මීටර් නවයයි....'

මෙහි දී ඇනා වහාම හොඬවැල ඔසොවා ඇත් ගොව්වා ගේ විස්තරයට බාධා කෙළේය.

'ආ... සමාවන්න, මට වැරදුණා. හොඩවැල මීටර් දෙකයි. වලිගය මීටර් එකහමාරයි. එතකොට වලිගයේ අග සිට හොඩවැලේ අගට මීටර් හතකුත් දසම නවයයි. ඌ ඵළවලු කිලෝග්‍රෑම් හත්සිය හැට පහක් කනවා. වතුර බාල්දි දෑසයක් බොනවා.'

'මදි නෑ. නරඹන්නෙක් කී ය.

'දැක්කද, ඇතා ඇත් ගොව්වගෙ වැරැද්ද හරිගස්සපු හැටි?' එක් මහාචාර්යවරයෙක් තවෙකෙකුට කීය.

ඇත් ගොව්වා නැවතත් කතාව පටන් ගත්තේය.

'හොයිටි-ටොයිටි ලෝකයෙන් ම පුදුම ඇතා. සමහර විට සදකාලයෙහි ම සතුන් අතර පහළ වූ ශ්‍රේෂ්ඨ බුද්ධිමතා. ඌට ජර්මන් භාෂාව හොඳට පුළුවන්. නේද හොයිටි-ටොයිටි?' යි ඔහු ඇතා දෙසට හැරී ඇසුවේය. ඇතා සන්සුන් ලෙස හිස වැනුවේය. නරඹන්නෝ අත් පොළසන් දුන්හ.

'වල් බූත' මහාචාර්ය ෂීමිඩ් කීය.

'හොයිටි-ටොයිටි ට ගණන් කරන්නත් ඉලක්කම් අඳුනන්නත් පුළුවනි.' ඇත් ගොව්වා කියාගෙන ගියේය.

'විස්තර ඇති. අපිට පෙන්වනවා.' ගැලරියෙන් හඬක් ආවේය.

'මෙහි කිසි හොරයක් බොරුවක් නැති බව පැහැදිලි වීමට නරඹන්නන් දෙන්නෙක් වේදිකාවට එන්න.' ඇන් ගොව්වා ආරාධනා කෙලේය. ෂිමිඩ් සහ ස්ටොල්ෂ් එහි ගියහ.

හතරැස් කාඩ්බෝඩ් කැලිවල ඇඳපු ඉලක්කම් ඇතා ඉදිරියේ තබන ලදී. එකතු කිරීමේ, අඩු කිරීමේ, බෙදීමේ සහ ගුණ කිරීමේ ගණන් ඌට කිව් කල ඌ ඒවා විසඳා උත්තර සොඩින් රැගෙන පෙන්වීය. මුලින් පහසු ප්‍රශ්න ද පසුව අමාරු ප්‍රශ්න ද ඇසූ නමුත් හොයිටි-ටොයිටි එකකුත් නොවරද්ද උත්තර දුන්නේය.

'දැන් ඔබ මොකද කියන්නේ?' ස්ටොල්ෂ් ඇසී ය.

'හරි හරි, අපි බලමු.' කියමින් ෂිමිඩ් සාක්කුවෙන් ඔර්ලෝසුව රැගෙන 'දැන් වෙලාව කියද හොයිටි-ටොයිටි?' කියමින් ඇතාට දුන්නේය. ඇතා එය ඇහැට අල්ලා බලා මහාචාර්යවරයාට ආපසු දී ඉලක්කම් එකතු කොට 10.25 සැදුවේය. වේලාව විනාඩියට නිවැරදි වූ නිසා ෂිමිඩ්ට පුදුම නොවී බැරි විය.

ඊළඟ පාඩම් කියවීමය. සතුන් ගේ ලොකු පින්තූර රාශියක් ඇතා ඉදිරියෙහි විය. සිංහයා, වඳුරා, අලියා ආදී වශයෙන් ඔවුන් ගේ නම් ලියූ සන කඩදාසි කැලි ගොඩක් තව තැනෙක විය. ඇතාට පින්තූරයක් පෙන්වූ කල ඌ නිවැරදිව එහි නම සොයා පෙන්වීය. ෂිමිඩ් සතා ගේ නම පළමුව පෙන්වා ඊට අදළ පින්තූරය පෙන්වන්නට ඇතාට කීය. ඌ සියල්ල නිවැරදිව කෙලේය.

අන්තිමේ දී හෝඩියේ අකුරු සියල්ල හොයිටි-ටොයිටි ඉදිරියේ තබන ලදී. දැන් ඌ අකුරු තෝරා වචන හදා ප්‍රශ්නවලට උත්තර දිය යුතු ය.

මහාචාර්ය ෂිම්ඩ් ප්‍රශ්න ඇසී ය.

'ඔබේ නම කුමක් ද?'

'දැන් හොයිටි-ටොයිටි' ඇතා අකුරු එකතු කර උත්තරය හැදුවේය.

'මොකද දැන්? කලින් වෙන නමක් තිබුණාද?'

'ඔව්'

'මොකක් ද ඒක?'

'සාපියන්ස්'[1] ඇතා උත්තර දුන්නේය.

'හෝමෝ සාපියන්ස්'[2] වෙන්න ඇති' ෂිම්ඩ් සිනා සෙමින් කීය.

'වෙන්න පුළුවන්' ඇතා ගුප්තාර්ථවත් උත්තරයක් දුන්නේය.

හොයිටි-ටොයිටි ඊට පසු 'අදට මේ හොඳට ම ඇති' යන වාක්‍යය සෑදෙන සේ වචන එකතු කොට සෑම අතට ම හිස නමා ආචාර කර, ඇත්ගොව්වා ගේ කෑගැසීම ද නොතකා රඟ මඩලෙන් පිට වී ගියේය.

---

1 නුවණක්කාරයා යන තේරුම ඇති ලතින් වචනය.

2 මුල්ම මනුෂ්‍යයා හඳුන්වන ලතින් විද්‍යා වචනය. – තේරුම : 'නුවණැති මිනිසා'

මහාචාර්ය ෂිමිඩ් සිය සගයා වූ ස්ටොල්ෂ් අමතා මෙසේ කී ය.

'ඔබට මතක නැද්ද, පසුගිය ද හිටපු හැන්ස් කියන අශ්වයා ගැන? ඌට ඕනෑම ගණනක වර්ග මූලය සෙවීමට හැකියාව තිබුණා. ඌ අමාරු ගණිත ප්‍රශ්න විසඳුවා. ඌ උත්තරය දුන්නේ අඩිය පොළොවේ හැප්පීමෙන්. පස්සෙ එළිදරව් වුණා ස්වාමියා දෙන රහස් සංඥාවලට කීකරු වීමේ පුරුද්ද මිසක් ඌට තිබුණු ගණිත ඥානයක් නැති බව. මේකත් ඒ විදියේ ප්‍රෝඩාවක් තමයි.'

'හොඳයි ඔබ කොහොමද ඔර්ලෝසුවේ සිද්ධිය විස්තර කරන්නෙ?'

'ඇයි? ඇතා ඔර්ලෝසුව ගැන කිසිවක් දැන සිටියේ නෑ. ඌ ඒක නිකං ඇහැ ළඟට ඇල්ලුවා විතරයි. අංක තෝරන විට ඇත් ගොවිවා විසින් දෙන ලද අපට නොතේරෙන රහස් සංඥා වගයකට ඇතා කන් දී සිටි බව පැහැදිලියි. ඌ තමාගේ දිග නිවැරදි කළ තැන පටන් සිදු වූ ඔක්කෝම ප්‍රයෝග.'

'සර්කස් මැනේජර් ගෙන් අපට අවසර ලැබිල තියෙනවා දර්ශනයෙන් පස්සෙ නැවතිලා පරීක්ෂණයක් කරන්න. ඔබත් එනවද?'

'සත්තකින් ම මම එනවා. 'ෂිමිඩ් උත්තර දුන්නේය.

2

පමණට වැඩි අවමානය

දර්ශනය හමාර වී නරඹන්නන් විසිර ගිය පසු විද්‍යාඥයන් ගේ පරීක්ෂණය සඳහා හොයිටි-ටොයිටි නැවතත් වේදිකාවට කැඳවාගෙන එන ලදී. මහාචාර්ය ෂිම්ඩ් ඇන් ගොව්වා දෙස බලා මෙසේ ඇසී ය.

'සමාවන්න.... අ..... ඔබේ නම?'

'මගෙ නම ජුං සර්, ෆ්‍රෙඩ්රික් ජුං.'

'මෙහෙ බලන්න ජුං මහත්මයා, අපි පරීක්ෂණය කරන්නෙ කිසිම සැකයක් ඇති වෙන්න ඉඩක් නැති විදියට. කරුණා කර ඔබ මෙහෙන් ඉවත් ව සිටියොත් හොඳයි.'

'ඔව්... කරන්න.... කරන්න.... ඇතා ආපසු ගෙන යන්න ඕනෑ වෙලාවට මට කතා කරන්න.' කියමින් ඇන් ගොව්වා ඉවත්ව ගියේය.

විද්‍යාඥයෝ පරීක්ෂණය පටන් ගත්හ. ඇතා හොඳින් ඇහුම්කන් දුන්නේය. ඌ භාෂාව සහ ගණිතය පිළිබඳ සෑම ප්‍රශ්නයක් ම නිවැරදිව විසඳුවේය. උගේ දක්ෂ කම මවිතකර විය. ඒවා ප්‍රයෝගකාරී ලෙස කරවන ලද බව කිසි සේත් කිව හැකි නො වී ය. මිනිහා ගේ බුද්ධි බලයට බොහෝ දුර සමාන අස්වාභාවික බුද්ධි මහිමයක් ඌට ඇති බව පැහැදිලි විය. එහෙත් පරාජය එක වර ම පිළිගැනීමට අකැමැති වූ ෂිමිඩ් එයට විරුද්ධ ව තර්ක කිරීමට උත්සාහ කෙළේය.

මේ කෙළවරක් නැති විවාදවලට ඇහුම්කන් දීමෙන් ඇතා වෙහෙසට පත් ව සිටියේය. ඌ හිටිහැටියේ ම ෂිමිඩ් ගේ සාක්කුවට හොඬ යවා ඉන් ඔර්ලෝසුව ගෙන එය ඇහැට අල්ලා බැලී ය. වේලාව රාත්‍රී දොළහ විය. ඔර්ලෝසුව ආපසු ෂිමිඩ් අතට දුන් ඇතා ඔහු පිටිකරින් අල්ලා ඔසොවා පිට වීමේ දෙරටුව කරා ගෙන ගොස් තැබුවේය. ෂිමිඩ් තරහෙන් කෑගැසුවේය. ඔහු ගේ මිත්‍රයෝ සිනාසුණාහ. ජූං සතුන් ගේ නිවාස පැත්තේ සිට කෑ ගසමින් දුව ආවේය. එය ගණනකට නොගත් හොයිටි-ටොයිටි ෂිමිඩ්ට පිට වෙන පාර පෙන්නා ආපසු පැමිණ වේදිකාවේ සිටි අනෙක් විද්‍යාඥයන් දෙස ද නපුරු බැල්මක් හෙළී ය.

මහාචාර්ය ස්ටොල්ෂ් මිනිහකුට කතා කරන්නාක් මෙන් 'ඔබ කළ වැඩේ අපූරුයි. හොයිටි-ටොයිටි අපව පිටත් කරන්න කරදර වෙන්න එපා. මෙන්න අපි යනවා' කියමින් පිටත්ව ගියේය. සෙසු උගත්තු ද ඔහු අනුව ගියහ.

'උඹ හරි අගෙයි හොයිටි-ටොයිටි පංඩිතයන්ට පාර පෙන්නපු එක...' ජුං කීවේය. ඔහු අනෙක් සේවකයනට මෙසේ අඩගැසුවේය.

'අපිට බොහොම වැඩ තියෙනවා. ජොහාන් පේදුක්. විල්හෙල්ම්, කෝ උඹලා, හනික වරෙල්ලා.'

'කම්කරුවෝ කීප දෙනෙක් පැමිණ රහ හල අස් පස් කරන්නට පටන් ගත්හ. ඔව්හු පොලු, ඉණිමං, ලණු ආදිය ඉවත් කර රහ බිම අතුගෑහ. ඇතා ලොකු උපකරණ ඉවත් කිරීමට ජුංට උදව් විය. එහෙත් ඌ වැඩ කිරීමට අකමැති බවක් දැක්විය. ඌ වෙහෙස වී සිටින බව පෙනුණේය. නුපුරුදු වේලාවක තවත් දර්ශනයකට පෙනී සිටීමට සිදු වීම නිසා නොසන්සුන් ව සිටි ඌ පිඹින්නටත් නිස වනන්නටත් සැරසිලි කඩා බිඳ දමන්නටත් පටන් ගත්තේය. ඇත් ගොව්වා ඇතා ගේ හැසිරීම ගැන කෝපයට පත් විය. ඔහු ඇතාට බැණ වදින්නට පටන් ගත්තේය.

'පරෙස්සම් වෙයන් හොර අලියා. උඹ ගානට වැඩියි. උඹට ලියන්න - කියන්න පුළුවන් නිසා උඹ වැඩ කරන්න අකමැති ද? මේක පිනට කන්න දෙන දන් සැලක් නෙමෙයි, සර්කස් එකක්. මේකෙ ඉන්න කවුරුත් වැඩ කරන්න ඕනෑ...

ජුංගේ බැණ වැදීම නිසා හොයිටි-ටොයිටි ගේ තරහ ඇවිස්සුණේය. ඌ තදින් පිඹ රහ හල හරහා පාර පැත්තට දිව්වේය.

'ඒයි කොහෙද යකෝ උඹ යන්නෙ? නැවතියන් පරයා' කියා කෑ ගසමින් ඔහු ඉදලක් රැගෙන ඇතා පස්සේ එළවා ගොස් එහි මිටෙන් උගේ පසු පසට පහර කීපයක් දුන්නේය. පහර කෑමෙන් පසු ඇතා ගේ විලාසය අති දරුණු විය. ඔහු මහ හඬින් කෑගැසුවේය. එම ශබ්දය දරාගත නුහුණු ජුං බඩ අල්ලාගෙන බිම පෙරළුණේය. ඇතා ආපසු හැරී ජුං බලු පැටවකු මෙන් හොඬින් ගෙන පන්දුවක් මෙන් උඩට විසිකර ආපසු එන විට අල්ලාගත්තේය. මෙසේ කීප වරක් කළ ඇතා අන්තිමේ දී ඔහු සොඬින් ගෙන බිම තබා, ඉදල ගෙන වැල්ලේ මෙසේ ලිවිවේය :

'මට තළන්න එපා. මම තිරිසනෙක් නෙමෙයි. මමත් උඹ වගේ ම මනුස්සයෙක්.'

ඊට පසු ඇතා ඉස්තාල අතරින් දුව ගොස් රහ බිමේ දෙරටුවට ළඟා විය. තමාගේ දැවැන්ත ශරීරය ගේට්ටුවට හේත්තු කොට තෙරපුවේය. ගේට්ටුව දෙදරා බිම ඇද හැළුණේය. ඇතා ගේට්ටුවෙන් පිට වී ගමන් කෙළේය.

* * * *

ඉතා අවිවේකී රූයක් ගත කළ සර්කසයේ කළමනාකරු වූ ලුඩ්විග්-ස්ට්‍රෝම් නින්දට ගියා පමණි. ප්‍රධාන මෙහෙකරුවා දෙරට තට්ටු කර හදිසි වුවමනාවක් සඳහා හමුවීමට ජුං පැමිණ ඇති බව දැන්වීය. ඉතා බරපතල කාරණයක් නැත්නම් මෙබඳු වේලාවක දී තමා

ගේ තින්ද කැඩීමට සර්කසයේ කවුරුවත් ඉදිරිපත් නොවන බව ස්ට්‍රෝම් දනී. ඒ නිසා ඔහු වහාම සිය නිදන ඇඳුම් ඉවත විසිකර සෙරෙප්පු යුවල දමාගෙන අමුත්තන් ගේ කාමරයට දිව්වේය.

'මොකද ජුං හදිස්සිය?' ස්ට්‍රෝම් ඇසුවේය.

'හරි භයානක දෙයක් සර්. හොයිටි-ටොයිටි පිස්සු වැටිලා.' කියමින් ජුං පිස්සකු මෙන් අත් දෙක වැනුවේය.

'ඔබේ මොළේ නරක් වෙලා ද ජුං?'

'මට පේනවා සර්ට මාව විශ්වාස නැති බව. මගේ මොළේ වැරැද්දක් නැහැ. මගෙ කල්පනාව බොහොම හොඳයි. මාව අවිස්වාස නම් ජොහාන් ගෙන් හරි පේදිත් ගෙන් හරි අහන්න. ඒ ඔක්කොම සාක්කි. හොයිටි-ටොයිටි මාව දහසය වාරයක් උඩ විසි කළා. ඊට පස්සේ ඉදල අරන් 'මම තිරිසනෙක් නෙමෙයි මමත් මනුස්සයෙක්' කියල වැල්ලෙ ලිව්වා. ලියල ඉස්තාල අතරින් දුවල ගේට්ටුවත් කඩා දල පිටවෙලා ගියා.

'මොනව... පිටවෙලා ගියා.... ඇයි යෝදයො ඒක මෙච්චර වෙලා නොකිව්වෙ? මෝඩයා, තත්පරයක් අපතේ හරින්න බෑ. අපි ඌව අල්ලල ආපසු ගේන්න වහාම වැඩ කරන්න පටන් ගන්න ඕනෑ. නැත්නම් ඌ අලි විනාසයක් කරාවි.'

ඇතා නිදැල්ලේ හැරීම ගැන රජයෙන් ලොකු දඩයක් ගසා එවන ලියවිල්ල දැන් ස්ට්‍රෝම්ට පෙනේ. ඌ කරන නොයෙක් ආලාපාලු ගැන වන්දි ඉල්ලා මහ

ජනයාගෙන් එන ලිය කියවිලි සිය ගණනින් ඔහුට පෙනේ.

'කවුද සර්කස් එක බාරව හිටියෙ? පොලිසියට දැන්නුවද? අල්ලන්න මොකද කළේ?'

'අද වැඩ බාරව හිටියෙ මමයි. මට පුළුවන් හැම දෙයක් ම කළා සර්. මම පොලිසියට නං කීවෙ නෑ. ඒත් මෙලොකට ඒගොල්ලො දන්නව ඇති. මම ඌ පස්සෙ ගිහින් ආපසු එන ලෙස ඉල්ලා සිටියා. මහත්මයා, හාමුදුරුවනේ, උතුමාණනි, ආදී ගරු පදවලින් කතා කළා 'ස්වාමීනී ආපසු එන්න. දේවයන් වහන්ස ආපසු වඩින්න. ඔබ වහන්සේ අඳුනාගන්න බැරි වීම ගැන සමා වන්න. රහ මඩල කළුවරේ තිබුණ නිසා මම ඔබ වහන්සේ අලියෙකැයි සිතා ගත්තා. දැන් සමා වී ආපසු වඩින්න' මෙහෙම යාඥා කළා. ඌ මා දිහා හොරැහින් බලා මහ හඬ නහමින් තවත් ඉක්මනින් ගියා. ජොහාන් සහ විල්හෙල්ම් මෝටර් සයිකල්වල නැගී ඌ පස්සේ යනවා, ඌ 'අන්ටර් ඩෙන් ලින්ඩන්' පහු කරල ''ටියන්ගාටර්' පාර දිගේ ගිහින් 'ග්‍රූන් වෝල්' පෙදෙසට ඇතුළු වුනා. දැන් මේ මොහොතේ ඌ 'හාවෙල්' වගුරු බිම්වල පෙම් කෙළිමින් ඉන්නවා.

එවිට ම ටැලිපෝනය නාද විය. ස්ට්‍රෝම් රිසීවරය ගත්තේය.

'හලෝ... ඔව් ස්ට්‍රෝම් තමයි... මම දන්නව. බොහොම ස්තුතියි... ඔව් අපට පුළුවන් දේ කළා... ගිනි නිවන හමුදුව...? මම හිතන්නෙ නැහැ.... වැඩිය හොඳයි

සතාට වැඩිපුර කරදර නොකර ඉන්න එක.'

'ඒ පොලිසියෙන්' ස්ට්‍රෝම් රිසීවරය තබමින් කී ය. 'පොලිසිය හිතනවා ගිනි නිවන හමුදාව කැඳවලා වතුර පොම්පවලින් ඇතාව ආපසු හරවන්න. ඒත් අපි, හොයිටි-ටොයිටි එක්ක බොහොම පරෙස්සමෙන් වැඩ කරන්න ඕනෑ.'

'පිස්සොා... මේක තවත් බරපතල කරාවි' ජුං කීය.

'අන්න හරි ජුං, උඹ දන්නවා කාටත් වැඩිය ඇතා ගැන. උඹ ගිහින් ඌට කිට්ටු කරල යාප්පුවෙන් කියල ආපසු එන්න පොළඹවාපන්.'

'ඔව් සර්, මම උත්සාහ කරන්නම්, බාගෙදී මම ඌට කතා කරන්නම් 'ජනාධිපති තුමනි' කියල.

ජුං පිටත් වූයේය. ස්ට්‍රෝම් රෑ තිස්සේ ම ටැලිපෝනය ළඟ සිට පණිවුඩ ගනිමින් උපදෙස් නිකුත් කෙළේය. ටික වේලාවකට පසු ඇතා 'පෝනිසල්' දූපත්වලින් එපිට දිය නැවේය. ඊළඟට ඒ අසල තිබුණු එළවලු වතුවලට වැදී ගෝවා, කැරට් ආදිය සහමුලින් කෑවේය. පළතුරු වතුවල ඇපල් කෑවේය. ඊටපසු 'ප්‍රිඩන්ඩෝර්ප්' කැළෑවට වැදුණේය.

ඇතා මිනිසුනට අනතුරු නොා කෙළේය. නිකරුණේ දේපල විනාශ නොා කෙළේය. එලවලු සහ පලතුරු වතුවලට ගියේ බඩගිනි වූ විට පමණි. ගෝවා ගස් පේළියෙන් පේළිය උදුරා කෑවේය. පලතුරු ගස්වල ගෙඩි කෑවා මිස අතු කඩා දැම්මේ නැත. උදේ හයට ජුං නැවත

ස්ට්‍රෝම් ඉදිරියේ පෙනී සිටියේය. වෙහෙසට පත්ව සිට මහු ගේ ඇඳුම්වල මඩ තැවරී තිබුණේය. මුහුණින් ඩාදිය වැගිරුණේය. ඇඳුම් නෙත්බරියන් වී තිබුණේය.

'කොහොමද ජුං තොරතුරු?'

'කිසිම අමුත්තක් නැහැ සර්. හොයිටි-ටොයිටි කිසිම ඉල්ලීමකට කන් දෙන්නෙ නෑ. මං ඌට 'ජනාධිපති තුමනි' කියාත් කථා කලා. ඒත් ඌ මාව විලට තල්ලුකළා. අහංකාර පිස්සුව සතුන්ට හැදුනාම මිනිසුන්ට වඩා වෙනස්. යාප්පුවෙන් බැරි තැන මම තර්ක කරලා ඌව නම්මාගත්න උත්සාහ කලා. 'බාගෙදා ඔබ හිතනවා ඇති මේ අප්‍රිකාවෙයි කියලා. නෑ. මේ උත්තරාක්ෂ 52.5. මේ අගෝස්තු මාසයෙ නම් මෙහෙ එළවලුත්, පලතුරුත් ඕනෑ තරම්. ඒත් ශීත සෘතුව ඇවිල්ල හිම වැටෙන කොට ඔබ මොකද කරන්නෙ? ඔබට ගස්වල පොතු කන්න වේවි. එළවන්ට වාගෙ. ඔබට ඒවා කාලා ජීවත් වුණුකිද? ඔබ අහල නැද්ද ආදි කාලෙ යුරෝපයේ වාසය කළ ඔබේ මුතුන් මිත්තන් වන මැමත් නම් ඇත් වර්ගයා ශීතලෙන් මැරි වඳ වී ගිය බව? ඔබටත් ඒ සන්තෑසියම වෙන්න බැරිද? ඉතින් ඔබට නරකද සර්කස් එකට ආපසු යන එක? එහෙ ඔබට ඕනෑ කරන සෑම සැප පහසු කමක් ම ලැබෙනවා ඇති' හොයිටි-ටොයිටි මගේ දේශනාව හොඳට අහගෙන හිටියා. මොහොතක් කල්පනා කලා. ඊළඟට එක පාරට ම හොඬ වැලෙන් ලොකු වතුර පාරක් විදල මාව නෑව්වා. මම මේ පාන්දර විනාඩි පහක් තුළ දෙපාරක් නාල.... මට ජල සන්තිය නොහැදුණොත් ඇති.'

3

යුද්ධ ප්‍රකාශයක්

හොයිටි-ටොයිටි ට හොඳින් කියා නම්මා ගැනීමට කරන ලද උත්සාහයන් සියල්ල නිශ්ඵල විය. අන්තිමේ දී ස්ට්‍රෝම් ට තද බල තීරණයක් ගන්නට සිදුවිය. ගිනි නිවන හටයන් කණ්ඩායමක් වනයට යවන ලදී. පොලිසියේ මග පෙන්වීම යටතේ ගිනි හටයෝ ඇතාට යාර දහයක් පමණ ඈතින් අඩ කවයක ආකාරයට සිට තමන්ගේ බල සම්පන්න නලවලින් ඇතා වෙත ජල ධාරා එල්ල කළහ. ඌට මෙය ලොකු විනෝදයක් විය. කලෙකින් වතුර මලෙන් නෑමක්.... ඌ පැත්තෙන් පැත්තට හැරෙමින්, හොඬෙන් පිඹිමින් හොඳ හැටි නෑවේය. ඊට පසු නල දහය ම එකට සම්බන්ධ කර සදගත් වේගවත් ජල ධාරාවක් ඇතා ගේ ඇහැට එල්ල කරන ලදී.

මෙය ඇතා ගේ සතුටට හේතු නො වී ය. ඌ මහ හඬින් කෑ ගසමින් ගිනි හටයන් දෙසට පැන්නේය. හයට

පත් හටයෝ පැන දිවූහ. ඇතා ක්ෂණයකින් රබර් නළ ඉරා දමා ගිනි නිවන යන්ත්‍ර පෙරළා දැමුවේය.

මේ මොහොතේ සිට තමාට ගෙවන්නට සිදු වෙනැයි ස්ට්‍රෝම් බලාපොරොත්තු වූ අලාභ ඉල්ලීම් ගලා එන්නට පටන් ගත්තේය. ඇතා ගේ ක්‍රෝධය තදින් ඇවිස්සී තිබුණේය. හොයිටි-ටොයිටි සහ මිනිසුන් අතර යුද්ධය ප්‍රකාශ කරන ලදී. තමා සමග යුද්ධ කිරීම මිනිසුනට බොහෝ වියදම් යන වැඩක් බව පෙන්වා දීමට හැකි සෑම උත්සාහයක් ම ඌ කළේය. ඌ ගිනි හමුදාවේ කාර් සහ ට්‍රක් රථ රාශියක් විලට තල්ලු කෙළේය. කැළෑ නිළධාරියාගේ නිවාසය බිඳ හෙළුවේය. පොලිසියේ උසස් නිලධාරියකු අල්ලා ගහක් උඩට විසි කෙළේය. කළින් එතරම් පරිස්සමෙන් ක්‍රියා කළ නමුත් ඌ දැන් කරන විනාශයෙහි නම් සීමාවක් නොවී ය. සාමාන්‍ය පිස්සු වැටුණු ඇතකුට වඩා බරපතල විනාශයක් ඌට කළ හැකි බව පැහැදිලි විය.

ප්‍රීඩන්ඩෝර්ෆ් කැළයෙහි සිදුවීම් පිළිබඳ වාර්තාවක් පොලිස් පතිවරයාට ලැබුණු කෙනෙහි ඔහු ඇතා මරා දැමීම සඳහා ආයුධ ගත් පොලිස් කණ්ඩායමකට එම කැළෑවට යාමට අණ කෙළේය. මෙයින් ස්ට්‍රෝම් ගේ සියලු බලාපොරොත්තු සුන් විය. මෙවැනි ඇනකු ඔහුට කවදාවත් සොයා ගැනීමට හැකි වේයැයි සිතන්නට බැරි ය. උගේ විනාශකාරී වැඩ නිසා තමාට වන්දි මුදල් ගෙවීමට සිදු වන බව ඔහු දැන සිටියේය. එහෙත් උගේ පිස්සුව සුව වී ඌ ආපසු ආ දක ඒ සියලු මුදල් පොලිත්

සමඟ තමාට ආපසු ලැබෙන බව ද ඔහු දැන සිටියේය. ඒ නිසා පොලිස් පති ගේ නියෝගය කොහොම හරි කල් දමා ගැනීමට ඔහු උත්සාහ කෙළේය.

'හොඳයි මම තව පැය දහයක් දෙන්නම්' යි පොලිස් පති කී ය. 'තව පැයකදී මම මුළු කැළෑව ම වට කරන්නට සේනාංකයක් යොදවනවා. ඕනෑ වුණොත් පොලිසියේ ආධාරයට යුද්ධ හමුදාවත් කැඳවනවා.'

ස්ට්‍රෝම් වහාම සර්කස් කණ්ඩායමේ සම්පූර්ණ කාර්ය මණ්ඩලයේ රැස්වීමක් කැඳවීය. සත්වෝද්‍යානයේ පාලක තැන ඇතුළු ඔහු ගේ උප නිලධාරීහු සෑම දෙනා ම එයට පැමිණියහ. රැස්වීමේදී ගත් තීරණ අනුව එය කැඳවා පැය පහක් යාමට පෙර කැළෑව පුරා තැනින් තැන බොරු වලවල් කපා උගුල් අටවා තබන ලදී. එතරම් දක්ෂ ලෙස මැනූ උගුලකින් සාමාන්‍ය ඇතකු ටික වේලාවක දී අල්ලාගැනීම ඉතා පහසු දෙයකි. එහෙත් හොයිටි-ටොයිටි මේ බාධකයන් දක්ෂ ලෙස මගහැර ගියේය. වලවල් උඩ දමා තුබූ ආවරණ පරෙස්සමෙන් ඉවත් කෙළේය. ගස්වල අතු උඩ ඇටවූ ලොකු කොටවලට සම්බන්ධ කර බිම දමා තුබූ ලෑලි නොපෑගෙන සේ අඩිය තිබ්බේය. එබඳු ලෑල්ලක් ඇතකුට පැගුණොත් උඩ අටවා ඇති ලී කොටය උගේ ඇහට පෙරළුණ කල ඌ බිම ඇද වැටෙයි.

නියමිත කාලය දැන් අවසාන වේගෙන යයි. අලුත් හට පිරිස්වලින් බලවත් වූ හට වළල්ල තව තවත් දැඩි

වෙයි. ආයුධ ගත් පොලිස් කංඩායම විල ළඟට ම ආහ. අඩක් ජලයෙන් වැසුණු ඇතා ගේ විශාල ශරීරය ගස් අතරින් පෙනුණේය. හොඬට වතුර පුරවා හිසට උඩින් ඔසොවා පිඹින විට ජලධාරාව උගේ පිට මත වැගුරුණේය.

'සැරසෙන්'.... අණ දෙන නිලධාරියා තියුණු හඬින් විධානය දුන්නේය. භටයෝ තුවක්කු එල්ල කළහ.

'වෙඩි තබනු...'

වෙඩි හඬ කැළෑව දෙවනත් කරගෙන පිළිරැව් නැංවීය. ඇතා ඔළුව ඉස්සුවේය. ඉන් රුධිර ධාරා ගලා ගියේය. ඌ පොලිස් භටයන් දෙසට දුව ගියේය. භටයෝ දිගට ම වෙඩි තැබූහ. ඇතා වෙඩි උණ්ඩ ගැන නොතකා ඉදිරියට දිව්වේය. පොලිස් භටයෝ හොඳ ඉලක්ක කාරයෝ ය. එහෙත් ඔවුහු ඇතා ගේ ශරීරය පිළිබඳ හොඳ දැනුමක් ඇති අය නො වූ හ. ඒ නිසා ඇතාට පහර දිය යුතු හොඳ ම තැන් වූ මොළයට හෝ හදවතට හෝ පහර එල්ල කිරීමට ඔවුනට බැරි විය. ඇතා වේදනාව සහ භය නිසා වරින් වර හොඬ වැල විහිදූ නමුත් යලි වහාම අකුලාගත්තේය. හොඬ වැල ඇතා ගේ වැදගත් ම ඉන්ද්‍රිය ය. හොඬ වැලට අනතුරක් සිදු වුවහොත් ඌට මිය යාමට සිදුවෙයි. ඒ නිසා ඌ ඉතා අවදනම් අවස්ථාවක සතුරාට පහර දීමට පමණක් එය පාවිච්චි කරයි. හොයිටි-ටොයිටි හිස පහත් කරගෙන තමා ගේ විශාල දළවලින් සතුරාට පහර දුන්නේය.

පොලිස් භටයන් වෙඩි සැර නිකුත් කරමින් තමන් ගේ ස්ථානවල රැඳී සිටියේ ඔවුන් තුළ වූ දැඩි ශික්ෂණය නිසාය.

එතකුදු වුවත් ඇතා හට පවුර බිඳගෙන ගොස් බාධකයන් සුණු විසුණු කොට දමා පළා ගියේය.

ඇතා ලුහු බැඳ යාමට කංඩායමක් පිළියෙල කරන ලදී. එහෙත් ඌ ඇල්ලීම තබා පේනතෙක් මානයේ පස්සෙන් යාම වත් ලෙහෙසි වැඩක් නො විය. පා ගමනින් උගේ වේගයට කිට්ටු කිරීමට වත් බැරිවිය. වාහනවලින් යන පොලිස් භටයනට පාරවල් ඔස්සේ ම යාමට සිදු විය. එහෙත් ඇතා එළවළු කොටු, පලතුරු වතු සහ කැළෑ පෙදෙස් හරහා දිවීමේදී කිසිවකින් නතර කරණු නො ලැබී ය.

4

විද්‍යාඥයා සහායට එයි

කඩ වූ බලාපොරොත්තු ඇති ස්ට්‍රෝම් කාර්යාලයෙහි එහාට මෙහාට සක්මන් කෙළේය. 'මාව කම්මුතුයි; ඔක්කොම ඉවරයි.' ඔහු තමාට ම කියාගත්තේය. 'ඇතා කරපු අලාභ ගෙවන්න මගේ මුළු සේසත ම යාවි. අන්තිමේ දී උන් මගේ ඇතාන් මරා දමාවි.'

එවිට ම සේවකයෙක් ඇවිත් බන්දේසියක තැබූ ලියුමක් ඔහුට පිළිගැන්වීය.

'මෙන්න සර්.... කේබල් එකක්.'

'කේබල් එකක්.... අඩමාන නෑ. ඇතා මරාදලා ඇති.' කියමින් ඔහු කවරය විවෘත කෙළේය.

'ආ... සෝවියට් දේශයෙන්.... මොස්කව් නුවරින් කව්ද එවන්න ඇත්තෙ?'

ඔහු කේබලය කියවීය.

'කළමනාකාර – ස්ට්‍රෝම් – බුෂ් සර්කස් – බර්ලින්. ඇතාගේ – ආරංචිය – මේ දැන් – කියෙව්වා. මරා දැමීමේ – ආඥව – නවත් වන්නැයි – පොලීසියෙන් – ඉල්ලන්න. ඇතාට – මේ පණිවුඩය – දෙන්න; 'සාපියන්ස් – වැග්නර් – බර්ලිනයට – අහසින් – එනවා. බුෂ් සර්කසයේදී – ඔහු – හමුවන්න.' – ඇතා – කීකරුවේවි. නුනොත් වෙඩි තියන්න.'

මහාචාර්ය – වැග්නර්.

ස්ට්‍රෝම් තව වරක් කේබලය කියවීය. 'මේක තේරුම් ගන්න බෑ. ප්‍රොෆෙසර් වැග්නර් ඇතා ගැන දන්න බව නම් පැහැදිලියි. ඔහු භාවිතා කරන්නෙත් සාපියන්ස් කියන ඇතාගෙ පරණ නම මයි. ඒත් තමා එන බව කීවම ඇතා ආපසු එනැයි වැග්නර් හිතන්නෙ මොකද? කොයි හැටිත් ඇතා ගැන පොඩි බලාපොරොත්තුවක් ඇති කර ගන්න කේබලය අපට උදව් වෙනවා.'

ස්ට්‍රෝම් මොහොතකුදු අපතේ නොහැරියේ ය. ඇතා මරාදැමීමේ වැඩ පිළිවෙල නවතා දැමීමට පොලීසිය කැමති කරවාගත් ඔහු උෆ හමු වෙන්නට යාම සඳහා ජූං වහාම ගුවන් යානයෙන් පිටත් කර හැරියේය.

අහස් නැවින් බට ජුං හොයිටි – ටොයිටි දුටු වහා ම නියම සාම දූතයකු ගේ විලාසයෙන් සුදු ලේන්සුවක් වැනුවේය. ඔහු ඇතාට කිට්ටු කර මෙසේ කී ය.

'අති ගෞරවාර්හ වූ සාපියන්ස් තුමනි, මහාචාර්ය වැග්නර් ඔබට සුබ පැතුම් එවයි. ඔහු ඔබ තුමා දැකීමට බර්ලිනයට ගුවනින් එයි. හමු වීම බුෂ් සර්කසයේ දී යි. එහි දී ඔබට කිසි හානියන් නොවන බවට මම සහතික වෙමි.'

ඇතා පණිවුඩය ඉතා ඕනෑකමින් අසා සිට මොහොතක් කල්පනා කෙළේය. ජුං හොඬින් ගෙන පිට උඩ තබාගත්තේය. සතුටු සිතින් කුංචා නාද කරමින් බර්ලිනයට මුහුණ ලා ගමන් ගත්තේය. ජුං සාම දූතයා පමණක් නොව ඇතා ගේ ආරක්ෂකයා ද වූයේය. ඔහු පිට උඩ සිටියදී කිසිවකු ඇතාට වෙඩි තැබීමට නිර්භය නොවූ හෙයිනි.

හොයිටි–ටොයිටි තමා ගේ උපරිම වේගයෙන් ගමන් කෙළේය. එහෙත් ඌට පෙර බර්ලිනයට ළඟා වූ මහාචාර්ය වැග්නර් සහ ඔහු ගේ සහායකයා වූ ඩෙනිසොව් කෙළින් ම බුෂ් සර්කසයට ගොස් ස්ට්‍රෝම් හමු වූහ. එවිට ම ස්ට්‍රෝම් ට තව විදුලි පුවතක් ලැබුණේය. වැග්නර් ගේ නම ඇසුණ හැටියේ හොයිටි–ටොයිටි අවනත ව කීකරු වූ බවත් දැන් ඌ ජුං පිට උඩ තබාගෙන බර්ලිනය බලා එන බවත් ඉන් කියැවුණේය.

මේ අතර මහාචාර්ය වැග්නර් කළමනාකරු ඇමති ය.

'ස්ට්‍රෝම් මහත්මයා, කරුණාකර අපට කියනව ද ඔබට මේ ඇතා හම්බ වුණු හැටි – ඔබ උගෙ යටගියාව දන්නවද?'

'මම ඌ නික්ස් කියන පාම් තෙල් වෙළෙන්දෙකු ගෙන් මිලට ගත්තා. නික්ස් ඉන්නෙ අප්‍රිකාවෙ කොංගෝ රටේ මතාඩි නගරය අසලයි. දවසක් නික්ස්ගෙ ළමයින් වත්තෙ සෙල්ලම් කරමින් සිටින විට ඇතා එතැනට ආවලු. ළමයින්ට අරුම පුදුම සෙල්ලම් පෙන්නුවලු. පස්සා ගාත් දෙකෙන් හිටගෙන නැටුවලු. දළ දෙක පොළොවට තද කර ඉස්සරහ ගාත් දෙකින් හිටගෙන පස්සා ගාත් උස්සා වන වනා වල්ගය කෙළින් කරගෙන හිටියලු. ඌට හොයිටි–ටොයිටි යන හුරතල් නම තිබ්බෙත් නික්ස්ගෙ ළමයිලු. මෙන්න මිළට ගැනීම පිළිබඳ ලියවිලි. ඒවා ඔක්කොම පිළිවෙලට ඇති. ගනුදෙනුව ගැන කාටවත් ආරවුලක් ඇති කරන්න බෑ.'

'මම අදහස් කරන්නෙ ගනුදෙනුව ගැන ආරවුලක් නෙමෙයි. ඇතා හඳුනාගන්න උපකාර වෙන විශේෂ සලකුණු කිසිවක් නැද්ද?'

'උගෙ ඔළුවෙ ලොකු කැළල් වගයක් තියෙනවා. ඒවා ඇතා අල්ලද්දී වෙච්ච තුවාලවලින් ඇති වුණ ඒවලු. අපි ඒ කැළැල් වැහෙන්න ඌට රෙදි හිස් වැස්මක් දැම්මා.'

'එහෙනම් කිසිම සැකක් නෑ. මේ ඒ ඇතා තමයි.' වැග්නර් තමාට ම කියාගත්තේය.

'මොකද මහාචාර්ය තුමා එයින් අදහස් කරන්නෙ? මොන ඇතාද?' ස්ට්‍රෝම් ඇසී ය.

'ඌ සාපියන්ස් – මගේ නැති වෙච්ච ඇතා. බෙල්ජියන් කොංගෝවේ විද්‍යා පර්යේෂණ ගමනක දී මම ඌ ඇල්ලුවා. ඌ හීළෑ කරල පුරුදු කෙරුවෙත් මමයි. එක් රාත්‍රියක කැළෑවට ගිය ඌ ආපහු ආවෙ නෑ. බොහොම උත්සාහ කළත් අපට ඌ සොයා ගන්න බැරි වුණා.'

'ඔබ එහෙනම් ඇතාට අයිතිවාසිකම් කියනවද?'

'මම අයිතිය ඉල්ලනව නෙමෙයි. නමුත් ඇතා එහෙම කරන්න පුළුවනි. ඇතා ගෙ මානසික හැකියාව ගැන ඔබ හොඳට දන්නවා ඇති. ඒ ඔක්කොම මගෙ වැඩ. ඔබේ සර්කසයේ රහ පාන ඇතාගෙ අරුම පුදුම හැකියාවන් ගැන පුවත්පත්වලින් කියවූ මට තේරුම් ගියා මගේ සාපියන්ස්ට හැර වෙන මොනම ඇතෙකුටවත් මේ දස්කම් කළ නොහැකි බව. ඒත් ඌ බර්ලින් පුරවැසියනට ප්‍රීතිය ගෙන දෙමින් තමනුත් ප්‍රීතියෙන් වසන තුරු මෙයට මැදිහත් වෙන්න මම හිතුවෙ නෑ. අන්තිමේදී ඇතා පෙරලි කරන්න පටන් ගත්තෙ ඌට කිසියම් කරදරයක් ඇති වීමෙන් වෙන්න ඕනෑ. ඒ නිසා මම උගේ ආධාරයට එන්න සිතුවා. මම වෙලාවට ආවෙ

නැත්නම් මෙලොකටත් ඌ මරා දමා ඉවර බව අමතක කරන්න එපා. අපි දෙන්නට ම ඌ නැති වෙන්න තිබුණා. මම ඌ එක්ක කතා කරල බලන්නම්. උගෙ ඉරණම ඌ ම තීරණය කරාවි. සමහර විට තමා මේතරම් කෝපයට පත් කළ කාරණය ඉවත් කළොත් ඌ ඔබ සමඟ නැවතීමට වුණත් අකමැති වෙන එකක් නැතැයි මම සිතනවා.'

'මොනවා.... ඇතා එක්ක කතා කරන්න.... කවුද එහෙම දෙයක් අහල තියෙන්නෙ?'

හොයිටි-ටොයිටි වගේ ඇතෙක් මීට ඉස්සර හිටල නෑ. ඉතින් කොහොමද එහෙම දෙයක් අහල තියෙන්නෙ? ඒක නෙමෙයි, ඇතා ඉක්මනට මෙහාට ඒවි ද?'

'අද හැන්දෑවට ඒවි. මට ටැලිග්‍රෑම් එකක් ලැබිල තියෙනවා ඌ පැයට සැතපුම් පහළොවක විතර වේගයෙන් එනවයි කියලා.'

හැන්දෑවේ දර්ශනයෙන් පසු වැග්නර් සහ හොයිටි-ටොයිටි හමු වූහ. ස්ට්‍රෝම් සහ ඩෙනිසොව් රහ මඩලට පැමිණ සිටියහ. ඇතා ගේ පිට උඩ ජුං හුන්නේය. වැග්නර් දුටු වහාම ඔහු වෙත දුව ගිය ඇතා හොඬ වැල උස්සා මහාචාර්ය වරයාට 'අතට අත' දී ජුං හොඬින් ගෙන බිම තබා වැග්නර් උස්සා පිට උඩ තබා ගත්තේය. වැග්නර් උගේ කනට කිසිවක් කොදුරා කී ය. ඇතා හිස වනා හොඬ වැල ඔහු දෙසට ඔසොවා එහි අග ඇති ඇඟිල්ලක් වැනි තුඩ වේගයෙන් සොලවන්නට පටන්

ගත්තේය. වැග්නර් ඕනෑ කමින් එහි වලනය දෙස බලා සිටියේය.

ස්ට්‍රෝම්ට මේ රහස් ඇල්ලුවේ නැත. ඔහු නොඉවසිල්ලෙන් මෙසේ ඇසී ය.

'කියන්න. දැන් මොකක්ද ඇතාගෙ තීරණය?'

'කරුණු රාශියක් කීමට ඇති බවත් ඒ සඳහා දිග නිවාඩුවක් ඕනෑ බවත් ඇතා කියනවා. නිවාඩුවෙන් පසු ඌ සර්කසයට එන්න කැමතියි. හැබැයි ඇත්ගොවි ජුං උගෙන් සමාව ගෙන මින් පසු තමාට ශාරීරික බල පෑම් නොකරන පොරොන්දුව පිට. ඌට ගැහුවට නොරිදෙන බව ඇත්තයි. ඒත් කිසිම විදියක අවමානයක් ඉවසන්න ඌ කැමති නෑ.'

'මහාචාර්ය තුමා කියන්නෙ මම ඇතාට ගැහුවයි කියලද?' ජුං ඇසී ය.

'ඔව්. ඉදල් මිටකින්' වැග්නර් කීය. 'ඔබ අවංක වෙන්න ඕනෑ ජුං. ඇතා බොරු කියන්නෙ නෑ. ඔබ ඇතාට සළකන්න ඕනෑ හරියට....'

'ජනාධිපතිතුමාට වගේ' ජුං කීය.

'ආත්ම ගෞරවය ඇති ඕනෑම මිනිහකුට වගේ' වැග්නර් කීය.

'සාම්වරයකුට වගේ ද?' ජුං උපහාසයෙන් ඇසීය.

'ඔය කතාව ඇති.' ස්ට්‍රෝම් කෑගැවේය. මේ බලපන් ජුං. මේ ඔක්කොම කරදරවලට වගකිව යුත්තා උඹයි. මම ඒ අලාබ ඔක්කොම උඹෙන් අයකර ගන්න බලන්නම්.... එතකොට හොයිටි-ටොයිටි කවද ද නිවාඩුව ගන්න අදහස් කරන්නෙ? නිවාඩුව ගත කරන්නෙ කොහෙද?'

'අපි ඇතා එක්ක විනෝද සවාරියක් යනවා. උගේ පිට උඩ මටයි ඩෙනිසොවිටයි සැප පහසු ඇතිව ගියෑකි. අපි යනවා දකුණට. ස්විට්සර්ලන්තයේ තණ බිම්වල ලපලු කැමට තමා කැමති බව හොයිටි-ටොයිටි දැනටමත් මා සමඟ කියල තියෙනවා' වැග්නර් කීය.

වැග්නර් ගේ සහකාරයා වූ ඩෙනිසොවිට තවම වයස විසි දෙක ය. එහෙත් ඔහු ජීව විද්‍යාත්මක සොයාගැනීම් රාශියක් කර ඇත. වැග්නර් ඔහුට ද ඔහු වැග්නර්ටද බොහෝ සේ ඇලුම් කරයි. ඔහුගේ සම්පූර්ණ නම අකිම් අයිවනෝව්විච් ඩෙනිසොව් ය.

'අකිම් අයිවනෝව්විච් ඩෙනිසොව් – නම බොහොම දිග වැඩියි. ඔබ අමතන සැම විට ම මම අකිම් අයිවනෝව්විච් කීවොත් අවුරුද්දක දී මගේ කාලයෙන් මිනිත්තු හතළිස් අටක් ඒ වැඩේට යනවා. ඒ නිසා මම ඔබට ඩෙන් කියනවා. ඔබ මටත් වැග් කියන්න.' කාලයෙන් නියම ප්‍රයෝජනය ගැනීමට දන්නා මහාචාර්යවරයා කීවේය.

පසු ද උදේ වන විට ගමනට සියල්ල සූදානම් විය. ඇතා ගේ පිටේ විද්‍යාඥයන් දෙදෙනාට ම ඉඩ කඩ

තිබුණේය. ඔවුන් ගෙන ගියේ ඉතා අවශ්‍ය උපකරණ පමණකි.

ඔවුන් පිටත් වනු දැකීමට හිමිදිරි උදෑසන බව වත් නොසලකා ස්ට්‍රෝම්ද පැමිණ සිටියේය.

'ඔබ කොහොමද ඇතාට කෑම දෙන්නෙ?' ඔහු ඇසී ය.

'අපි සංදර්ශන පවත්වනවා. නරඹන්නන් ඇතාට ආහාර සපයාවි – සාපියන්ස් අපි තුන් දෙනාට ම කන්න හම්බ කරාවි. ආයුබෝවන්.'

ඇතා විදිය දිගේ හෙමින් හෙමින් ඉදිරියට ගියේය. එහෙත් ප්‍රධාන පාරට වැටුණු වහා ම වැඩි කළ ඔහු ගේ ගමන් වේගය පැයට සැතපුම් හතක් පමණ විය.

වැග්නර් සිය සහකාරයා ඇමති ය. ඩෙන්, දැන් ඉතින් ඔබ ඇතා හසුරුවන්න ඕනෑ. ඒ වගේ ම ඇතාගෙ අපූර්ව අතීතය ඔබ දැනගන්න ඕනෑ. මෙන්න මේ දින පොත කියවන්න. ඒක ඔබට පෙර මගේ සහකාරයා ව සිටි පැස්කොව් ලියපු දින පොතක්. අපි දෙන්නා කොංගෝවේ සංචාරයක දී කළ ජීව විද්‍යාත්මක පර්යේෂණයක ප්‍රතිඵලය වූ මේ ඇතා ගේ සම්පූර්ණ ඉතිහාසය එහි තියෙනවා.'

වැග්නර් ඇතා ගේ ඔළුව ළඟින් ම හිදගෙන තමා ඉදිරියෙහි තැබූ පුවරුවක සටහන් පොත් දෙකක් තබා දෙකේ ම එකවර ලියන්නට විය. වැග් එක වර වැඩ දෙකක් කිරීමට හැකියාව ඇත්තෙකි.

'දැන් ඉතින් කියන්න ඔබේ කතාව.' වැග්නර් ඇතාට කී ය. ඇතා උගේ හොඬ වැග්නර් ගේ කනට ළං වන තුරු උස්සා ඉන් කෙටි ශබ්ද සහ දිග ශබ්ද උපදින සේ වේගයෙන් හුස්ම යැවීමට පටන් ගත්තේය.

'ෆ්ප් ෆ්ප් – ෆ්ප් ෆ්ප් – ෆ්ප් ෆ්ප් – ෆ්ප් ෆ්ප්'

ඩෙනිසොව් දින පොත පෙරළන ගමන් 'හරියට මෝස් කෝඩ් එක[1] වගෙයි' සිතී ය.

වැග්නර් දකුණතින් විද්‍යා විවරණයක් ලියූ අතර වමතින් ඇතා තමාට කියන කතාව ලිවිවේය. වැඩිපුර ගැස්මක් නැති ව හැල්මේ ගිය ඇතා ගේ ගමන නිසා ඔහු ගේ ලිවීමට බාධාවක් නො වී ය. වැග්නර් ගෙන් වෙන් වූ පසු උෟට මුහුණ පාන්නට වූ සිදුවීම් ඇතා ගේ කථාවෙන් කියැවිණ.

මේ අතර ඩෙනිසොව් ඇතා ගේ ප්‍රභවය දැක්වෙන පැස්කොව් ගේ දින පොත ආසාවෙන් කියැවූයේ ය. මේ ඔහු කියැවූ දේ ය.

---

1. විදුලි සංදේශ යැවීම සඳහා මෝර්ස් විසින් නිපදවන ලද සංඥ ක්‍රමය.

5

"රිං" ට මිනිහකු වෙන්න බෑ.

මාර්තු 27.

මහාචාර්ය වැග්නර් ගේ රසායනාගාරය අරුම පුදුම තැනෙකි. භෞතික විද්‍යාව, රසායන විද්‍යාව ජීව විද්‍යාව සහ ඒවායේ නොයෙකුත් උපාංග විද්‍යාවන් ගැන වැග්නර් විශේෂඥයෙක් විය. පියවි ඇසට නොපෙනෙන හැම රූපයක් ම දැකිය හැකි වූ ද පියවි කනට නොඇසෙන ඕනෑ ම සියුම් ශබ්දයක් ඇසිය හැකි වූ ද ඉතා තියුණු උපකරණ එහි විය. විවිධ අවස්ථාවන්හි වූ වීදුරු, ඇලුමිනියම්, රබර්, පිහන් මැටි, ප්ලැටිනම්, රිදී, තඹ, වානේ ආදියත් ඒවායේ විවිධ සංයෝගත් එහි විය. රසායනාගාරයක ක්‍රියාකාරිත්වයට ඕනෑ කරන ප්ලාස්කු, දහර, පරීක්ෂණ නළ, ලාම්පු, යතුරු, බොත්තම් ආදී දහසක් උපකරණ එහි විය. මේ සියල්ල මහාචාර්යවරයා ගේ මොළයෙහි සංකීර්ණ භාවය මනාව පෙන්නුම් කෙළේය.

රසායනාගාරයට යාබද කාමරයේ සජීවී ශරීරාංග ප්‍රදර්ශනයක් විය. මෙහිදී වැග්නර් සත්ත්ව ශරීරවලින් ඉවත් කරගත් පටකයන් (tissues) වගා කරයි. මහාචාර්යවරයා විසින් ම තනාගන්නා ලද රසායනික ද්‍රවයක් ආහාර කොට ගෙන මේ පටක වැඩෙයි. මිනිසකු ගේ ශරීරයෙන් වෙන් කර ගත් ඇඟිල්ලක්, හාවකු ගේ කනක්, බල්ලකු ගේ හදවතක්, බැටළුවකු ගේ හිසක් වැනි සජීවී ශරීරාංග අතර මිනිස් මොළයක් ද විය. ශරීරයෙන් වෙන් කර ගන්නා ලද නමුත් තවමත් ජීවත් වන – තවමත් වැඩෙන – තවමත් ක්‍රියා කරන මිනිස් මොළයක්.... මෙය තමා වැග්නර් වැඩිම උනන්දුවක් දැක්වූ විද්‍යා ආදර්ශය. මහාචාර්යවරයා මේ මොළය සමග අදහස් හුවමාරු කරගන්නට ඕනෑ වූ විට මොළයේ බාහිර පටලයට සිය ඇඟිල්ල තබයි. මොළය ඔහුගේ අදහස් තේරුම් ගෙන ඔහු අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.

මේ මොළය බලා කියා ගැනීම මගේ ප්‍රධාන කාර්යය විය. එය විශේෂ රසායන ද්‍රවයකින් පෝෂණය කරන ලදී. ද්‍රවය නිතර අලුත් ව තැබීම මවිසින් කළ යුතු විය. වැග්නර් මීට ටික කලකට පෙර එහි සංයුතිය වෙනස් කෙළේය. ප්‍රතිඵලය මවිතකර විය. මොළය ඉක්මනින් මහතින් වැඩෙන්නට විය. දැන් එය දිය කොමඩු ගෙඩියක් තරමට ලොකු ය.

මාර්තු 30.

අද සවස වැග්නර් මා අමතා මෙසේ කිය. 'මේ මොළය 'රිං' නමින් සිටි තරුණ ජර්මන් විද්‍යාඥයකු ගේ.

රිං ඇබිසීනියාවේදී මළා. නමුත් ඔහු ගේ ශරීරයෙන් මොළය ඉවත් කර එය තව දුරටත් ජීවත් කරවීමට මා සමත් වුණා එයට තවමත් කල්පනා කරන්න පුළුවන්. මැත දී රිංගේ මොළය සිය උදෑසීන ජීවිතය ගැන ටිකක් කණස්සල්ලට පත් වුණා. එයට අහන්නත්, දකින්නත්, එක තැන වැතිර නොසිට එහෙ මෙහෙ යන්නත් ඕනෑ වුණා. අවාසනාවකට වගේ මේ අදහස් මා සමග ප්‍රකාශ කරන කොට වෙලාව පහුවෙලා. වේලාපහින් කීවා නම් මට ඒ සැම දෙයක් ම ඉටු කර දෙන්න හැකියාව තිබුණා. ව්‍යවච්ඡේද විද්‍යාගාරයෙන් සුදුසු මළ සිරුරක් තෝරා ගෙන එයට රිංගේ මොළය ඇතුළු කරගන්න තිබුණා. මොළයේ අසනීපයෙන් මළ අයකුගේ හිසේ සනීපවත් මොළයක් රෝපණය කර පණ දෙන්න මට පුළුවනි. එතකොට රිං ගේ මොළයට ජීවයෙන් පිරුණු අලුත් සිරුරක් ලැබෙන්න තිබුණා. දැන් ඔබට පේනවා ඇති රිංගේ මොළය මිනිස් කපාලයක මොළ කුඩුවට නොගැළපෙන තරම් ලොකු වෙලා බව. රිංට ඉතින් කවදවත් මිනිහකු වෙන්න නම් බැහැ.

'එහෙනම් ඔබ කියන්නෙ රිංට මිනිහකු නොවී වෙන මොකෙක් හරි වෙන්න පුළුවන් කියලද?'

'ඔව් ඔව්, සමහර විට ඔහු ඇතෙක් වෙන්න වුවත් පුළුවනි. තවම ඔහුගේ මොළය ඇත් මොළයක් තරමට වැඩී නැති බව හැබැයි. නමුත් එය කල්යාමේදී වැඩේවි. අපි කරන්න ඕනෑ එයට ඇත් මොළයක හැඩහුරු කම දෙන එක විතරයි. ඒ සඳහා මම දැනටම ඇතකු ගේ

හිස් කබලක් ඇණවුම් කර තිබෙනවා. ඉක්මනින් ම ඒක ගෙනැවිත් එහි මොළ කුඩුවේ රිං ගේ මොළය තැන්පත් කරලා කුහරය පිරෙන තුරු වැඩෙන්නට සලස්වනවා. එවිට ඒක ඇත් මොළයක හැඩය ගනීවි.'

'එහෙනම් ඔබ අදහස් කරන්නෙ රිං ඇතකු කරන්නද?'

'සත්තකින් ම, රිං ඒ ගැන කැමැත්ත දීලත් ඉවරයි. ඔහුට දකින්නත් අහන්නත් ගමන් කරන්නත් හුස්ම ගන්නත් කොච්චර ඕනෑකම තියෙනවාද කිව්වොත් ඔහු බල්ලකු හරි ඌරකු හරි වෙන්න වුවත් කැමතියි. ඒත් ඇතා උතුම් – ශක්තිමත් – දිගුකලක් ජීවත් වන සතෙක්. ඉතින් ඔහු – ඒ කියන්නේ රිංගේ මොළය – ඇතකු හැටියට තව අවුරුදු සීයක් හරි දෙසීයක් හරි ජීවත් වේවි. ඒක නරක වැඩක් ද?'

මෙතැන දී ඩෙනිසොව් දින පොතින් ඇස් ඉවතට ගෙන වැග්නර් ගෙන් ප්‍රශ්නයක් ඇසී ය.

'එතකොට මහාචාර්ය තුමනි, ඔබ කියන්නේ දැන් අපි මේ නැගල යන්නෙ ඒ ඇතාගෙ පිට උඩය කියල ද?'

'ඔව්... ඔව්... ඌට මිනිස් මොළයක් තියෙනවා.' වැග්නර් උත්තර දුන්නේය. 'මට කරදර නොකර දිගට ම කියවනවා.'

ඩෙනිසොව් නිශ්ශබ්ද ව දින පොත කියවීමෙහි යෙදුනේය. එහෙත් තමන් නැඟී යන මේ ඇතාට මිනිස්

මොළයක් ඇත යන්න අරුම පුදුම දෙයක් ලෙස ඔහුට හැඟුණේය. ඔහු තුළ ඇතා කෙරෙහි බියක් ද වකිතයක් ද කුතුහලයක් ද ඇති විය.

මාර්තු 31.

අද අලි හිස් කබල ලැබුණේය. මහාචාර්ය තුමා එහි නළල් ඇටය දිග අතට කියතකින් ඉරුවේය.

'මේ සිදුර මොළය ඇතුළු කරන්නයි. මෙහි දී එය ඇත් මොළයක හැඩය ගනීවි. පස්සෙ වෙන ඇතකු ගේ හිස තුළ රෝපණය කරන විට මෙතැනින් ම ඉවතට ගන්නත් පුළුවනි.' ඔහු කීවේය.

මොළ කුහරය පිරික්සා බැලූ මම එහි කුඩා කම ගැන පුදුම වීමි. පිටට පෙනෙන සැටියට නම් ඇතා විශාල මොළයක් සහිත සතෙකි. වැග් මට මෙසේ පැහැදිලි කෙළේය. 'හිස් කබලේ උඩ කොටස නිකම් ම හිස් කුහරයක්. ඇතා ගේ ප්‍රමාණයේ හැටියට ඉතා කුඩා වූ මොළය එහි යට කොටසේ – කනට කිට්ටුවෙන් – පිහිටා තිබෙනවා. ඉදිරියෙන් සිට ඵල්ල කරන වෙඩි පහරකින් ඇතාට හානියක් නොවන්නේ ඒකයි. උංඩය ඇට පසා කරගෙන ගියත් මොළයට වදින්නෙ නෑ.'

රසායනික ද්‍රව්‍ය මොළයට සැපයිය හැකි පරිදි අපි මොළ කුඩුවේ සිදුරු කීපයක් සෑදුවෙමු. ඉන් පසු රිං ගේ මොළය ගෙන පරෙස්සමෙන් මොළ කුඩුවට ඇතුළු කෙළේය. නියමිත කොටසින් අඩක් වත් පිරුණේ නැත.

'කමක් නැහැ. ගමනේ දී ඒක වැඩේවි.' හිස් කබලේ ඉවත් කළ කොටස සවි කරමින් වැග් කී ය.

වැග් සතු අසාමාන්‍ය හැකියාවන් ගැන මා හොඳින් දැන සිටි නමුත් මේ අත්හද බැලීම සාර්ථක වීම ගැන නම් මම සැකෙන් සිටියෙමි. මෙය ඉතා පටලැවිලි සහිත වැඩකි. පණ පිටින් ඇතකු සොයා ගත යුතු ය. අප්‍රිකාවෙන් හෝ ඉන්දියාවෙන් හෝ එකකු ලබාගත හැකි වුවත් එය බොහෝ වියදම් යන වැඩකි. යම් විදියකින් ලබාගත්තත් කිසියම් හේතුවක් නිසා ඌ වැඩේට නුසුදුසු වෙන්නත් පුළුවනි. රිං ගේ මොළය අප්‍රිකාවේ කොංගෝවට ගෙන යන්නට වැග් තීරණය කෙළේ ඒ නිසා ය. ඔහු මීට පෙරත් එහි ගොස් ඇත. එහි දී ඇතකු අල්ලා මොළය රෝපණය කිරීමේ ශල්‍යකර්මය ඔහු එතැන දී ම කරනු ඇත. පණ පිටින් ඇතකු ගේ මොළය ඉවත් කර වෙන මොළයක් රෝපණය කිරීම.... ඒක කරනවාට වඩා කියන එක නම් ලේසියි. ඒක අත් මේස් ජෝඩුවක් හෝ ලෙන්සුවක් හෝ එක සාක්කුවකින් අනෙකට මාරු කිරීම වැනි වැඩක් නොවෙයි. නහර කොන් සියල්ල – ධමනි සහ ශිරා – නිවැරදි ව එකතු කර මැසිය යුතුයි. තිරිසනකු ගේ ශාරීරික ව්‍යුහය මිනිස් සිරුරට බොහෝ දුරට එකඟ වෙන නමුත් තද බල වෙනස් කම් ද ඇත. මේ සිරුරු දෙකේ ඉන්ද්‍රියයන් එකක් ලෙස ගැළපීමට වැග් සමත් වේ ද? සමත් වුවත් ඔහු මේ ශල්‍යකර්මය කළ යුත්තේ පණ පිටින් සිටින වල් අලියකුටයි.

6

ගොරිල්ලෝ පන්දු ගසති.

ජූනි 27.

දැන් දවස් ගණනක සිදුවීම් එක් වාරයක දී ලියන්නට සිදු වී තිබේ. එහෙත් ඒ සියල්ල ප්‍රීති දායක ඒවා නොවේ. නැවේදීත් – විශේෂයෙන් පාරුවේදීත් මදුරුවෝ අප වටකරගෙන පහර දෙන්නට පටන් ගත්හ. විලක් තරමට පළල් වූ ගඟේ මැද හරියෙන් යාත්‍රා කරන විට උන් ගේ හිරිහැරය ටිකක් අඩු වූ බව හැබෑ ය. එහෙත් ඉවුරට කිට්ටු වන විට ම වලාකුළු වැනි විශාල මදුරු රංචු අවුත් අප වසාගත්හ. මේ කළු පාට කෘමීහු අපේ සිරුරු විද ලේ උරා බීවෝ ය. ගොඩ බිමට අඩිය තැබූ සැණෙකින් කඩි, කුහුඹුවෝ සහ කුඩැල්ලෝ අප දෂ්ට කරන්නට පෙල ගැසී ආහ. සර්පයෝ ද පත්තෑයෝ ද දෙබර මැස්සෝ ද අපට හිරිහැර කරන්නට සැරසී සිටිය හ.

සන වනයේ ඉදිරියට යෑම පහසු කාරියක් නොවී ය. එහෙත් එලිමහනෙහි ගමන් කිරීම ඊටත් වඩා අපහසු විය. එහි අඩි දෙළහකටත් වඩා උස ශක්තිමත් කඳන් ඇති තණවර්ග වැවී තිබුණේය. අප කිසිවක් නොපෙනෙන බිත්ති දෙකක් අතරින් යාමක් බඳු මේ ගමන අති භයංකාර විය. තියුණු මුවාත ඇති තණ පත්වලට අපේ මුහුණු සහ අත් කැපුණේය. අඩිය තද කළ විට ඒවා අපේ කකුල්වල එතුණේය. වැස්සට එකතු වූ වතුර බාල්දිවලින් වත් කරන්නාක් මෙන් අප මත වැගුරුණේය. කැළෑවල මෙන් ම තණ බිම්වල ගමන් කරද්දී ද අපට පේළියට එකා පස්සේ එකා යාමට සිදු විය. අපි විසි දෙනෙක් වීමු. අනෙක් දහ අට දෙනා බඩු ගෙන යාමට සහ මඟ පෙන්වීමට බඳවා ගත් අප්‍රිකානු ගෝත්‍රික මිනිස්සු ය.

අන්තිමේ දී නියමිත ස්ථානයට ළඟා වීමු. 'තුම්බා' විල් තෙර ඉතා සිත්කලු උස් බිමක් තෝරාගෙන එහි අපේ වාඩිය තැනුවෙමු. එතැනට සෑම අතින් ම බොහෝ දුර පෙනේ. ආරක්ෂා සහිතව එහි ළඟා වුණු රිං ගේ මොළය ද රූ-සද-ගඳ-රස පහසින් යුතු ජීව ලෝකයට ඇතුළු වීමට නොඉවසිල්ලෙන් සිටියේය. රිං ගේ බලාපොරොත්තු ඉටු වීමට එතරම් පමා විය යුතු නොවන බව කියමින් වැඟ ඔහු සැනසී ය. ඔහු කිසියම් අබිරහස් මිශ්‍රණයක් සූදානම් කරමින් තමාගේ කුඩාරම තුළට වී සිටියේ ය.

ජූනි 29.

වාඩිය කිට්ටුව ම සිංහයකු ගේ අලුත් අඩි සටහන් වගයක් ස්වදේශිකයනට දක්නට ලැබීම නිසා අප අතර විශාල කැළඹීමක් ඇති විය. මම තුවක්කු මිටිය ලිහා වෙඩි තියන්නට පිළිවන් බැවි කී සෑම අයකුට ම තුවක්කුව බැගින් දුනිමි. රෑ කෑමෙන් පසු අපි පුරුදු වෙන්නට වෙඩි තැබුවෙමු. එය හරි භයානක අත් දැකීමක් විය. ඇතැම් ස්වදේශිකයකු තුවක්කු කඳ බඩට හෝ දණ හිසට හෝ තද කරගෙන පිතුම් ගසමින් වෙඩි තියන විට උංඩය ඉලක්කයෙන් අංසක 180 ක් තරම් ඇතටත් පියාඹයි. ඔවුන් ගේ ප්‍රීතියෙහි ද කෑ ගැසීමෙහි ද සීමාවක් නැත. කොංගෝ නිම්නයේ බඩගින්නෙන් පීඩිතව සිටින සෑම රුදුරු වන සතකු ම පෙළඹවීමට ඔවුන් ගේ කෑගැසීම සමත් යැයි මට සිතිණ.

ජූනි 30.

ඊයේ රෑ සිංහයා වාඩිය අසලට ම ආවේය. ඌ වල් ඌරකු මරා වැඩි හරිය ගිල දමා කටු බටු ඉතිරි කර ගොස් තිබුණේය. මෙබඳු ඇට පොඩි කරන්නකුට අසු වීමට මගේ ආසාවක් නැත....

ස්වදේශිකයෝ බියෙන් උමතු වූහ. ඇදිරි වැටුණු විගස ඔවුහු අපේ කුඩාරම් වෙතට රොක් වී ගිනි මැල ගසා රෑ තිස්සේ මැලය අවුළුවමින් සිටියහ. ආදි කල්පික මිනිසා තුළ කුරිරු වන සතුන් කෙරෙහි පැවති බිය කෙබඳු දැයි මට ප්‍රත්‍යක්ෂ විය. රාත්‍රියේ කිප වරක් ම

සිංහයාගේ ගර්ජනය ඇසුණේය. ඌ ගොරවන විට ආදී මුතුන් මිත්තන් තුළ වූ භීතිය මා තුළ ද ඇති වෙයි. මගේ ලේ කැලඹී හදවතේ ගැස් ම මොහොතකට නැවතෙයි. මට දුවන්නට නො සිතෙයි. එතැන ම ගුළි වී වැතිරෙන්නට හෝ වැලි මීයකු මෙන් පොළව යටට යන්නට ඇත්නම් හොඳ යැයි සිතෙයි. එහෙත් වැග් සිංහයා ගේ ගර්ජනය ගණන් ගත්තේ නැත. ඔහු කුඩාරම තුළට වී තමාගේ වැඩෙහි යෙදුණේ ය. එදා උදේ කෑමෙන් පසු ඔහු මා වෙතට අවුත් මෙසේ කීවේය.

'හෙට උදේ මම කැළේට යනවා. ස්වදේශිකයන් කියනවා පරණ අඩි පාර විල දක්වා වැටී තියෙන බව. ඇතුන් දිය බොන තැන වාඩියට වැඩිපුර ඈත නෑ. ඒත් උන් නිතර නිතර ගොදුරු බිම් වෙනස් කරනවා. කැළෑවේ උන් කඩා කාපු හරියේ දැන් ආයෙත් ලියලලා. ඒකෙන් තේරෙන්නෙ උන් ඈතට ගිහින් තියෙන වගයි. අපි උන් හොයන්න යන්න ඕනෑ.

'ඔබ දන්නව නේද සිංහයෙක් මේ පැත්තට ආ බව? කොහොමවත් තුවක්කුවක් නැතුව යන්න එපා.' යි මම කීවෙමි.

'මම වන සතුන්ට බය නෑ. මම දන්නවා උන් මෙල්ල කරන හැටි.' සිනාව යටපත් කරන්නට තැත් කරමින් වැග් කී ය.

'එහෙනම් ඔබ තුවක්කුවක් අරන් යන්නෙ නැද්ද?' මම ඇසීමි. වැග් හිස වැනුවා පමණකි.

ජූලි 2.

මේ අතර පුදුම දෙයක් සිදු විය. රෑ නැවතත් සිංහයා ගේ ගර්ජනය ඇසුණේය. මම බ්‍රාන්ත වීමි. මගේ බඩ දහලන්නට විය. පපුව හිතල විය. පසු දා උදේ මම මගේ කුඩාරම ළඟ මුහුණ සෝදමින් සිටියෙමි. වැග් අනෙක් කුඩාරමෙන් එළියට ආවේය. ඔහු පුදු පාට ෆ්ලැනල් සූට් එකක්ද, හෙල්මට් තොප්පියක් ද, ශක්තිමත් බූට් සපත්තු ද ඇඳ සිටියේය. ඇදුම් පැළඳුම් සියල්ල විශේෂ ගමනකට සුදුසු ඒවා විය. එහෙත් ගමන් මලොගුවක් හෝ රයිපලයක් හෝ ඔහු වෙත නො වී ය. මම ඔහුට සුබ උදෑසන් පැතුවෙමි. ඔහු මට හිස නමා ආචාර කර ඉදිරියට ගියේය. ඔහු ඉතා පරික්ෂාකාරී ලෙස අඩිය තියන බව මට පෙනුණේය. ටිකින් ටික නිසැක බව පළ කරමින් ආ ඔහු අන්තිමේ දී පුරුදු කඩිසර ගමනින් යන්නට පටන් ගත්තේ ය. කන්දෙන් පහලට බැස යන පාරේ බෑවුම පටන් ගන්නා තැනට ආ ඔහු අත් දෙක ඉහළට ඔසොවා ගත්තේය. ඊට පසු සිදු වූ විස්මය ජනක සිදුවීම දුටු ස්වදේශිකයෝත් මමත් පුදුමයෙන් කෑ ගසන්නට වීමු. අත් පා විහිදගෙන සිටි ඔහු ගේ ශරීරය ඔන්චිල්ලාවක කැරකැවෙන සර්කස් ක්‍රීඩකයකු ගේ සිරුර මෙන් භ්‍රමනය වන්නට පටන් ගත්තේය. භ්‍රමන වේගය ක්‍රමයෙන් වැඩි විය. මොහොතක් ඔහුගේ ශරීරය ගුවනේ හරස් අතට පිහිටයි. ඊලඟ මොහොතේ හිස පහළට හා පා ඉහළට හැරෙයි. සැණෙකින් කරකැවී දෙපයින් සිටගනී. මේ කරණම් ගැසීම නො නැවතී සිදුවෙයි. හිස සහ පය තැන් මාරු

කරමින් සිදුවන මේ කරකැවීම ක්‍රමයෙන් වේගවත් වී ඔහුගේ ශරීරය නොා නැවතී කරකැවෙමින් ඉදිරියට යන එක ම නොපැහැදිලි චක්‍රයක් මෙන් දිස් වෙයි. ඔහු ගේ කඳ ඒ චක්‍රයේ නාභිය විය. කන්දෙන් පහළට ගොස් තැනිතලා බිමේ දී කරණම් කීපයක් ගසා නැවතුණු ඔහු කෙලින් සිට සාමාන්‍ය ගමනින් කැළෑව දෙසට යන්නට විය.

මට මෙය තේරුම් ගන්නට බැරි විය. ස්වදේශිකයනට මට තරම් වත් බැරි විය. ඔවිහු පුදුමයට පමණක් නොව භීතියට ද පත් වූහ. ඔවුනට තමන් දුටු දෙය මනුෂ්‍යත්වය ඉක්මවූවකු ගේ ප්‍රාතිහාර්යයක් විය. මට නම් මේ කරණම් ගැහීම වැග් නිතර ම ඉදිරිපත් කරන විදියේ තවත් අමුතු දස්කමක් බවට සැකයක් නැත.

දස් කම් දැක්වීම කොහොම වුවත් වැග් මේ වතාවේ නම් ඕනෑවාට වැඩිය නිර්භීත වූ බව මට සහතික ය. බල්ලා අස්වාභාවික දෙයට බය වෙන බව මම දනිමි. මස් කටුවක් අස් ලොමකින් බැඳ බල්ලා ඉදිරියේ දාන්න. ඌ කටුව ගන්නට එන විට එය ටිකින් ටික අදින්න. මස් කටුවට පණ ඇවිත් යැයි සිතන බල්ලා වලිගය උඩ තියාගෙන දුවනු ඇත. නමුත් වැග් ගේ ගුවන් කරණම් දකින සිංහයාත් එසේ බය වේවිද?

කෙසේ වුවත් මේ අවස්ථාවේ වැග් ගේ ආරක්ෂාවට ක්‍රියා කළ යුතු යැයි මට සිතිණ.

මම වහාම රයිපලයක් ගෙන නිර්භීත කමින් සහ බුද්ධිමත් කමින් වැඩි ස්වදේශිකයන් හතර දෙනකුට රයිපල් හතරක් දී ඔවුන් ද කැටුව වැග්තර් පස්සෙන් යාමට පිටත් වීමි. ඇතුන් යාමෙන් සෑදුණු තරමක් පළල් පාරෙහි ඉදිරියට ගමන් කළ ඔහු අප එන බව නොදත්තේය. දහස් ගණන් ඇතුන් එහා මෙහා යාමෙන් පාර හොඳට පෑදී තිබුණේය. හරහට වැටුණ කදකින් හෝ වියලුණු අකුල්වලින් හෝ පාර අවහිර වී තිබුණේ කීප තැනක පමණි. වැග් එවැනි බාධකයන් හමු වූ විට ඕනෑවට වඩා හුහක් ඉහළට අඩිය උස්සා පුදුමාකාර පිම්මකින් බාධකයට උඩින් ඈතට පැන්නේය. ඔහු ගේ සිරුර ඉස්සරහට බර වී යලි කෙළින් වූ පසු නැවත පුරුදු ලෙස ගමන් කෙළේය. අපි ටික දුරක් ඔහු පස්සේ ගියෙමු. ඇතින් සහන් එළියක් දිස් විය. පාර කෙමෙන් පළල් විය. අපි එළිමහන් ප්‍රදේශයකට පැමිණියෙමු.

වැග් එළිමහනේ මද දුරක් ගමන් කෙළේය. හදිසියෙන්ම තියුණු ගෙරවිල්ලක් ඇසුණි. එය කෝප වූ හෝ හය වූ හෝ ලොකු සතකු ගෙන් පමණක් ආ හැකි හඬකි. එහෙත් එය සිංහයා ගේ ගර්ජනයට වෙනස් ය. ස්වදේශිකයෝ සතා ගේ නම රහසින් කීය. එහෙත් එය මට නොවැටහිණ. ඔවුන් ගේ හැසිරීමෙන් සහ කතාබහෙන් ඔවුන් බෙහෙවින් බිය පත් ව සිටින බව තේරුම් ගතිමි. අනතුර ඉව වැටුණු ඔවිහු මා කිට්ටුවෙන් ම ගමන් කළ හ. එළිමහනට ආ විට පුදුම දර්ශනයක් මා නෙතට හමු විය.

මට දකුණු පැත්තේ කැළෑවට යාර දහයක් පමණ ඈතින් දස හැවිරිදි ළමයකු පමණ ඇති ගොරිල්ලා පැටවෙක් බිම හිඳගෙන උන්නේය. ඌට නුදුරින් දුඹුරු පාට මහ ගොරිල්ලාත් ගොරිලි ධෙනුවත් සිටියහ. තැනිතලා බිමේ ඉදිරියට ගිය වැග් ගොරිල්ලන් දුටුවේ පැටවා සහ ලොකු ගොරිල්ලා අතරට ගිය පසු ය. ගොරිල්ලා වැග් දැක යළිත් රෞද්‍ර ලෙස ගෙරෙව්වේය. එය මා මොහොතකට පෙර කැළෑවේ දී ඇසූ හඬ ම ය. දැන් වැග්ට ද සතුන් පෙනේ. ඔහු ගොරිල්ලා දෙස කෙළින් ම බලාගෙන ඉදිරියට ගියේය. පැටවා ඔහු දැක යටි උගුරෙන් කෑ ගහමින් දුවගෙන ගොස් අසළ වූ ගහකට බඩ ගෑවේය.

පිරිමි සතා නැවතත් තර්ජනාත්මක හඬක් නැඟී ය. සාමාන්‍යයෙන් ගොරිල්ලෝ මිනිසා මහ හැර යති. එහෙත් සටන් කිරීමට බල කරනු ලැබුවොත් උන් ගේ නිර්භීත කමටත් රෞද්‍ර කමටත් සීමාවක් නැත. මිනිහා පසු බැස නො යන වග පිරිමි ගොරිල්ලා දැන ගත්තේය. ඌ පැටවාට අනතුරක් වේයැයි හයින් එකපාරට ම ඉදිරියට පැන සටනට සැරසී සිටගත්තේ ය. රූපාකාරයෙන් මිනිසාට සමාන මේ භයංකර සතා තරම් රෞද්‍ර වෙනත් සතකු කැළෑවේ ඇත් දැයි මම සැක කරමි. පිරිමි සතා මධ්‍යම ප්‍රමාණයේ මිනිසකු තරම් ලොකු ය. නමුත් පපුව මිනිසකු ගේ මෙන් දෙගුණයක් විශාල ය. කඳ පමණට වඩා ලොකු ය. බාහු යුග්මය ලී කොට මෙන් දැඩි ය. අත් පා බොහෝ දිග ය. ඉදිරියට නෙරූ ඇහි බැම යට

ඇති රෞද්‍ර ඇස් ද නියවන විට පෙනෙන ලොකු දිලිසෙන දත් ද නිසා ඌ දැකීමටත් බියකරු ය.

පිරිමි ගොරිල්ලා ලොම් සහිත අත මිට මොලවා කොතරම් තදින් තමාගේ පපුවට පහර දුන්නේ දැයි කිවහොත් ඉන් හිස් පිප්පයකට ගසන්නාක් මෙන් දෝංකාර ශබ්දයක් නැහුණේය. ඉන්පසු ඌ කෑ ගසමින් දකුණු අත බිම ගසා වැග් දෙසට පැන්නේය.

මා බය වූ තරම කියනොත් උර හිස මත වූ රයිපලය අතට ගන්නට වත් බැරි විය. ගොරිල්ලා වැග් වෙතට ළඟා වීමට ගතවූයේ මොහොතකි. එහෙත් එවිට ම තවත් අපූරු දෙයක් සිදු විය.

මහා වානරයා කිසියම් නොපෙනෙන බාධකයක තදින් හැපී බිම පෙරළුණේය. වැග් බිම ඇද නොවැටී පිනුම් කාරයකු මෙන් අත් දෙපසට විදහාගත් ගමන් ම ගුවනේ කරණම් ගසන්නට පටන් ගත්තේ ය. වානරයාට සිදු වූ අබග්ගය නිසා උගේ ක්‍රෝධය උත්සන්න විය. ඌ දනි පනි ගා නැගිට යළිත් වැග් වෙතට පැන්නේය. මෙවර ද ඌ වැග් ගේ ඇහේ ගෑවෙන්නට වත් අසමත් ව නොපෙනෙන දැඩි දෙයක හැපී ඇද වැටුණේය. පිඹින්නට ද කටින් පෙණ උතුරුවන්නට ද පටන් ගත් ඌ තමා ගේ දැත් විදහා වැග් බදගත්තේය. එහෙත් වැග් ස්පර්ශ කිරීමට ඌට බැරි විය. වැග් සහ ගොරිල්ලා අතර නොපෙනෙන ශක්තිමත් අවහිරයක් ඇති බව පෙනුණේය. ගොරිල්ලා ගේ අත ක්‍රියා කළ හැටියෙන් එය

ගෝලාකාර දෙයක් බව මට සිතාගත හැකි විය. ඇහැට නොපෙනෙන වාතේ මෙන් ශක්තිමත් බෝලයක්.... එහෙනම් මේකයි වැග් ගේ අලුත් ම යොයාගැනීම.

වැග් සම්පූර්ණයෙන් ම ආරක්ෂා සහිත බව මට දැන් විශ්වාස ය. ඒ නිසා කවද වත් දකින්නට නොලැබෙන මේ අපූරු ක්‍රීඩාව නැරඹීමට බලවත් ආසාවෙන් යුතු ව මම සූදනම් වීමි. ක්‍රීඩාව වඩ වඩා වේගවත් වන විට ස්වදේශිකයෝ සතුටින් ඉපිලී නටන්නට පටන් ගත්හ. ඔවිහු තුවක්කු පවා ඉවතට වීසි කළහ.

ගොරිලි ධෙනුව ටික වේලාවක් වියරු ලෙස සටන් වැදී සිටි සිය සහකාරයා දෙස උනන්දුවෙන් බලා සිටියා ය. ඊට පසු ඇ සටන් කාමී බව පළ කරන මහා හඬක් නහා උගේ උදව්වට ඉදිරිපත් වූවාය. එතැන් සිට සටන වෙනස් ආකාරයක් ගත්තේය. කෝපයෙන් උමතු වී ගිය ගොරිල්ලෝ දෙදෙනා දෙපසින් සිට අදෘශ්‍යමාන බෝලයට පහර දෙන්නට වූහ. එය නියම පා පන්දුවක් මෙන් එහාටත් මෙහාටත් වීසි වුණේය. ගොරිල්ලන් උද්යෝගිමත් ක්‍රීඩකයන් ලෙසින් පා පන්දු ගසන විට පන්දුව ඇතුළේ එක් ඉරියව්වකින් රැඳී සිටීම සෙල්ලමක් නොවේ.

කරකැවෙන කුඩුවක දැමූ ලේනකු මෙන් වැග් බෝලය ඇතුළේ සිට එයත් සමග වේගයෙන් කරකැවුණ නමුත් ඔහු ගේ කඳ සැම විට ම කෙළින් තිබුණේය. ඔහු කඳ කෙළින් තබාගෙන ඉන්නේත් අත් දෙ පසට විහිදු

සිටින්නේ ත් මන්දැයි මට දැන් වැටහේ. බෝලය ඇතුළේ දී අනතුරක් නොවීමට ඔහු දෑත සහ දෙපය බෝලයේ ඇතුළු බිත්තියට තද කරගෙන සිටී. බෝලයේ කටුව අතිශයින් ශක්තිමත් විය යුතු ය. ගොරිල්ලන් ගේ පහරවලින් ඇතැම් විට බෝලය උඩ ගොස් බිම වැටෙන නමුත් එය නො බිඳන්නේ ඒ නිසා විය යුතු ය. එහෙත් වැග් ටිකින් ටික වෙහෙසට පත් වන බව මට පෙනේ. දෑත් සහ දෙපය එසේ තද කරගෙන බොහෝ වේලා සිටීම පහසු නො වේ. හදිසියෙන් ම වැග් නැමී බෝලයෙහි අඩියට වැටෙනු මම දුටුවෙමි.

දැන් කරුණු බරපතල අතට හැරිගෙන යයි. දැන් ඉතින් අපි නරඹන්නන් ලෙසින් පමණක් සිටීම ප්‍රමාණවත් නො වේ. මම කෑ ගසා ස්වදේශිකයන්ට තුවක්කු ගන්නට අණ කෙළෙමි. අපි සැම දෙනා ම බෝලය දෙසට දිව්වෙමු. මා කියන තුරු වෙඩි නො තැබීමට ස්වදේශිකයනට අණ කෙළෙමි. බැරි වෙලාවත් ඔවුන් අතින් වැග්ට වෙඩි වැදේ යැයි මම බිය වීමි. බෝලය වෙඩි උණ්ඩ වැළැක්වීමට සමත් දැයි මම හරි හැටි නො දැන සිටියෙමි. සමහර විට වැග්ට හුස්ම ගැනීම සඳහා සෑදූ හිල් බෝලයේ පිට කටුවෙහි තිබිය හැකි ය. එබඳු හිලකින් උණ්ඩයක් ඇතුළට ගියොත් වැග්ට අනතුරු විය හැකි ය.

ගොරිල්ලන් ගේ අවධානය අප වෙත යොමු කරවා ගැනීමට අපි පුළුවන් තරම් හයියෙන් කෑ ගැසීමු. අපේ උත්සාහය සඵල විය. පළමුවෙන් ම අප දෙසට

හැරුණේ පිරිමි ගොරිල්ලා ය. ඌ තර්ජනාත්මක ලෙස ගිගුරුවේය. ගිගුරුමෙන් පළක් නො වූ බව දුටු ඌ අප දෙසට එන්නට පටන් ගත්තේ ය. ඌ බෝලයේ ඉසව්වෙන් ඉවත් වූ වහාම මම වෙඩි තැබුවෙමි. උංඩය ගොරිල්ලා ගේ පපුවට වැදුණේය. දුඹුරු පාට ලොම් අතරින් ගලන ලේ පාර මම දුටුවෙමි. ඌ කෑ ගසමින් තුවාලය අතින් වසා ගත්තේය. ඊට පසු ඌ මා දෙසට දුවන්නට විය. මම දෙවෙනි වෙඩිල්ල ද තැබීමි. එය උගේ උර හිසට වැදුණේය. මේ වන විට මා ළඟට ආ ඌ එක පාරටම බිම ඇද වැටුණේය. ඌ රයිපලය තදින් ඇද උදුරාගෙන මගේ ඇස් ඉදිරිපිට දී ම දෙකට කැඩුවේය. එයින් සෑහීමට පත් නොවූ ඌ එය මස් කටුවක් මෙන් හපන්නට තැත් කෙළේය. ඊට පසු වැනි වැනී අඩි කීපයක් ඉදිරියට ගොස් බිම ඇද වැටුණේය. උගේ අත් පා ගැහෙන්නට පටන් ගත්තේය. නමුත් ඌ තුවක්කු කෑලි දෙක තදින් අල්ලාගෙන සිටියේය. ගොරිලි ධෙනුව මේ අතර කැළෑවට පැනගත්තා ය. 'ඔබට හුගක් තුවාල වුනාද?' වැග් ඇසී ය. ඔහු ගේ කට හඬ බොහෝ දුරින් එන එකක් මෙන් ඇසුණේය. ගොරිල්ලා ඇගේ තදින් හැපීම නිසා මගේ කන ඇසීම අඩු වෙලා ද?

උඩ බැලූ මම වැග් නැගිට සිටිනු දුටුවෙමි. දැන් ඔහු මට කිට්ටුව සිටින නිසා ඔහු ගේ ශරීරය වටේ අඳුරු පටලයක් ඇති බව මම දුටුවෙමි. වඩාත් පරීක්ෂාකාරිව බලන විට මට පෙනුණේ හැබෑ පටලයක් නොවන බව පැහැදිලි විය. බෝලය සෑදී ඇත්තේ සම්පූර්ණයෙන්

විනිවිද පෙනෙන ද්‍රව්‍යයකිනි. පටලයක් මෙන් පෙනුනේ බෝලය මතුපිට ගොරිල්ලා ගේ අත් වැදීමෙන් සහ සටනේ දී මඩ තැවරීමෙන් ඇති වූ පැල්ලම් ය.

මා මේ පැල්ලම් දිහා බලා සිටින බව තේරුම් ගත් වැග් සිනා සී මෙසේ කීවේය.

'පස තෙත් ව හෝ මඩ සහිත ව තියෙන විට මතුපිට පැල්ලම් ඇති වී බෝලය පේන්න පටන් ගන්නවා. ඒ වුණත් වැලි හරි කොළ රොඩු හරි එයට ඇලෙන්නෙ නෑ. ඔබට අමාරු නැත්නම් නැහිටින්න. අපි ආපසු යමු. මම මහ දී මගේ මේ අලුත් සොයා ගැනීම ගැන විස්තර කරන්නම්.'

මම නැගිට වැග්නර් දිහා බැලුවෙමි. ඔහුටත් ටිකක් අමාරු වී තිබේ. ඔහු ගේ මුහුණ ටිකක් තැලී තිබුණේය.

'ඒක සුළු දෙයක්. නිකම් සීරීමක් විතරයි. මේ සේරම මට පාඩමක්. මෙයින් පැහැදිලි වෙන්නේ පසා කරන්න බැරි බෝලයක් ඇතුළට වෙලා වත් අප්‍රිකානු කැළෑ පසු කර යන්න බැරි බවයි, රයිපලයකුත් නැතිව. කවුද හිතුවෙ මට පා පන්දුවක් ඇතුළෙ ඉන්න වෙයි කියල?'

'එහෙනම් මම කීවා හරි?'

'සත්තකින් ම හරි. දැන් මේ අහන්න. ඔබ කියවල තියෙනවද ඇමෙරිකන්වරුන් සොයා ගත් විදුරුමෙන් විනිවිද පෙනෙන ලෝහ වර්ගය ගැන? නැත්නම් ලෝහ වගේ ම ශක්තිමත් විදුරු ගැන? ඒවා යුද අහස් යානා සෑදීමට පාවිච්චි කරනවාලු. සතුරාට නො පෙනෙන නිසා එහි ප්‍රයෝජනය පැහැදිලියි. ඒවාගේ ම නියමුවාටත් සියල්ල පේනවා. ඉතින් මා කල්පනා කළා. මටත් විනිවිද පේන බලකොටුවක් සාදා ගැනීම ගැන. මට වන සතුන් ගේ ජීවිත නිරීක්ෂණය කරන්නට එහෙම බලකොටුවක් ඕනෑ කළා. ඒ එක්කම බළකොටුව උන්ගේ පහර දීම්වලින් රැකගන්න ඕනෑ. මේ පිළිබඳ බොහෝ පර්යේෂණ කළ මම අන්තිමේ දී ජයගත්තා. මේ බෝලය සෑදුවේ රබර්වලින්. අහා.... මිනිස්සු මේ ප්‍රයෝජනවත් ද්‍රව්‍යයෙන් හැකි සෑම වැඩක් ම ගන්න උත්සාහ කරල තියෙනවා. මට සුළුවන් වුනා රබර් විදුරු වගේ විනිවිද පේන – වානේ වගේ ශක්තිමත් ද්‍රව්‍යයක් බවට පත් කරන්න. අද අපට මුහුණ පාන්නට සිදු වූ තරමක අමිහිරි සිදුවීම් නොවන්නට – ඔබ නියම මොහොතේ දී ආවෙ නැත්නම් ඒවා වඩාත් අමිහිරි වන්න තිබුණා. මම හිතනවා මෙය මගේ ඉතාම සාර්ථක සොයා ගැන්ම බව. කවුද හිතුවෙ මෙහි දී ගොරිල්ලන් මුණ ගැහේවි කියල? ඔතැන තරමක් කැළෑව බව ඇත්ත. ඒත් ගොරිල්ලන් සාමාන්‍යයෙන් ඉන්නෙ මීට වැඩිය ඝන කැළෑවල.'

'ඉතින් ඔබ කොහොමද එක තැනකින් තව තැනකට යන්නෙ?'

ඒක බොහොම සුළු දෙයක්. ඔබට පේන්නෙ නැද්ද? මම බෝලයේ ඇතුළු පැත්තේ කටුවට අඩිය තියනකොට මගේ බරට බෝලය ඉස්සරහට යනවා. බෝලයේ පිට පැත්තේ කෝණාකාරව එක් වෙන සම කොටස් දෙකකින් සෑදුණ හුස්ම ගන්න හිල් තියෙනවා. මම බෝලයට ඇතුළු වෙලා විනිවිද පේන රබර්වලින් ම සෑදු පටියක් ඇදලා ඒක වහගන්නවා. අඩුපාඩුවකට තියෙන්නෙ පල්ලම්වල දී ඒක වේගයෙන් පෙරළී යන්න පටන් ගන්නවා. එවිට පෙරළීමට ඔරොත්තු දෙන ලෙස ශරීරය ක්‍රියා කරවන්නට මට සිදුවෙනවා.

7

නොපෙනෙන විලංගු

ජූලි 20.

දින පොතේ සටහන් කරන්නට තරම් දෙයක් බොහෝ දිනකින් සිදු නො වී ය. අලි රංචුව බොහෝ ඈතට ගොස් ඇති බව පෙනේ. අපි අවට පරීක්ෂා කෙළෙමු. අලුත් අඩි සටහන් සොයා ගැනීමට හැකි වූයේ දවස් කීපයකට පසු ය. ඊට දවස් දෙකකට පසු උන් දිය බීමට යන ජලාසය සොයාගන්නට ස්වදේශිකයනට හැකිවිය. ස්වදේශිකයෝ ඇතුන් ඇල්ලීමට පළපුරුදු අය ය. ඔවිහු එයට බොහෝ ක්‍රම දනිති. එහෙත් වැග්ට තමාගේ ම උපක්‍රම තිබුණේය. සේවකයන් ලවා ලොකු. ලෑලි පෙට්ටියක් කැළයට ගෙන්වාගත් ඔහු එතුළින් අදෘශ්‍යමාන කිසියම් දෙයක් ඉවතට ගන්නට පටන් ගත්තේය. ඔහු පෙට්ටියට අත දමා ඉන් කිසිවක් ගෙන පිටතින් තබයි. එහෙත් ඒ ගන්නා දෙය වාතය මෙන්ම

ඇසට නොපෙනෙයි. ස්වදේශිකයෝ ඔහු කරන දේ ගැන අන්ධ විශ්වාසමය හයකින් යුතුව බලා සිටියහ. ඔවුන් වැඟ ගුප්ත බලයක් ඇති මන්තරකාරයෙකි යි සිතන්නට ඇත. එහෙත් ඇතුන් ඇල්ලීම සඳහා වූ කිසියම් දෙයක් පෙට්ටියෙන් ඉවතට ගන්නා බවත් එයත් අර බෝලය සෑදූ ද්‍රව්‍යයෙන් ම සාදා ඇති බවත් මම සිතිමි.

මා කුතුහලයෙන් දැවෙමින් සිටින බව දුටු වැඟ 'එන්න, අත ගා බලන්න' කී ය. මා ගොස් අත පත ගාන විට අහල් බාගයක් පමණ මහත ඇති කඹයක් අතට අසු විය.

'මේකත් රබර් ද?' මම ඇසීමි.

'ඔව්, රබර්වල ගිණිය නොහැකි තත්වයන් ගෙන් එකක්. මේ වැඩේට ම මම වානේ වැනි ශක්තිමත් – පහසුවෙන් නැවෙන – ඇසට නොපෙනෙන කඹයක් එයින් සෑදුවා. අපි මේකෙන් තොංඩු හදලා ඇතුන් යන එන පාරේ දනවා. අපට පහසුවෙන් එකෙක් අල්ලා මේච්චල් කරගන්න හැකි වේවි.' වැඟ කී ය.

නො පෙනෙන කඹවලින් තොංඩු හද ඇතුන් යන එන පාරේ දැමීම ලේසි වැඩක් නො වී ය. බොහෝ විට අපි අප දැමූ කඹවලම පය පැකිළී වැටුණෙමු. රෑ වන විට තොංඩු ඇටවීම අවසාන විය. ඊට පසු ඇතුන් එන තුරු නිහඬ ව බලා සිටියෙමු.

එය ඉතා කදිම රාත්‍රියකි. ඉඳ හිට පදුරු සෙලවෙන හඬින් ද සතුන් සුසුම්න හඬින් ද වනයේ නිහැඩියාව බිඳෙයි. අතරින් පතර ලොකු සතකුට අසු වූ පුංචි සතකු ගේ මර ළතෝනිය ඇසෙයි. ඇතැම් විට එකට ගුලි ගැසී නිදන ස්වදේශීන් කොක්සන් දී සිනා සෙන හඬ ද ඇසෙයි.

සෙමෙන් සෙමෙන් අලි රංචුව පැමිණියහ. රංචුවේ නායක ඇතා සෙස්සනට මදක් ඉදිරියෙන් ආවේය. ඌ නො නවත්වා හොඬ වැල ඉදිරියට වනයි. කැළයෙහි ඇති දහස් ගණන් ගඳ සුවඳවල ඉව ඌට දැනේ. ඒවා වර්ග කොට අන්තරායකර ගඳ සුවඳ තෝරාගැනීමට ඌට පුළුවන. අපේ නො පෙනෙන තොංඩුවලට යාර කීපයක් කිට්ටුවට ආ ඇතා වහා ම නැවතී මා කවදත් නොදුටු විරූ තරමට හොඬ වැල දිග ඇද්දුවේ ය. ඌ තමාට දැනෙන්නේ මොන විදියේ ඉවක් දැයි විමසා බලයි. ඇතැම් විට අපේ සිරුරුවල ඉව ද ඌට දැනෙන්ට පිළිවන, ස්වදේශීන් ගේ කීම පරිදි අපි දහදිය ගඳ යන්නට විලෙන් නා ඇදුම් පවා සෝදගෙන සිටියෙමු.

ඇතාට අප ඉව වැටිලා තියෙන හැඩයි. මම හිතනවා ඌට ඉව දැනුණේ රබර් වලින් ය කියල. මම කලින් හිතුවෙ නෑ රබර් ඉව ඌට දැනෙයි කියල. වැග් ශබ්ද නො නහා කී ය.

තමාට නුපුරුදු සුවඳක් තේරුම් ගන්නට බැරුව ඇතා වික්ෂිප්තව සිටින බව පැහැදිළි ය. මෙය මොන

විදියේ අන්තරායකට සම්බන්ධ ද යන අවිනිශ්චිත භාවයෙන් යුතුව ම ඌ තව ටිකක් ඉදිරියට ගියේ ය. අඩි කීපයක් ඉදිරියට තබත් ම පළමුවන තොංඩුවට උගේ ඉස්සරහ කකුලක් අසු විය. ඌ කකුල ගස්සා ඇද්දේ ය. තොංඩුව තව තවත් තද විය. පතුලට මදක් ඉහළින් හම තෙරපී විලංගුව තද වන හැටි අපට පෙනුණේ ය.

වැග්නර් ගේ කඹය කෙතරම් වේගවත් ඇදීමකට වුවත් ඔරෙත්තු දෙන එකක් බව ඔප්පු විය.

අපි අපේ ජයග්‍රහණය ගැන ප්‍රීති වෙමින් සිටින අතර බලාපොරොත්තු නොවූ දෙයක් සිදු විය. ලණුවේ අනෙක් කොන බැඳ තිබුණු විශාල ගස පුපුරා පොරොවකින් කැපුවාක් මෙන් කැඩී ගියේ ය. ඇතා ගේ පස්සා පැත්ත බිම ඇතුණේ ය. ඌ වහාම දනිපතිගා නැගිට ගිහිය පළ කරන කුංච නාදයක් නහමින් පලා ගියේ ය.

'වැඩේ වැරදුණා.' වැග් මිමිණුවේ ය. 'අලි මීට පස්සෙ අපේ තොංඩු දිහාවට එන එකක් නෑ. ඒවා ඉවෙන් දැනගන්න උන්ට පුළුවන්. දැන් ඉතින් රසායන ක්‍රමයකින් මේ ගඳ ඉවත් කරන්න ඕනෑ... හ්ම්.... ගඳ.... ඔව් යි තමාට ම කියා ගනිමින් වැග්නර් කල්පනා වෙහි නිමග්න විය.

'හරි... මොකද බැරි? ඔව්.... අපිට ගෑස් පහර.... දීමක් කළ හැකියි.... අපිට ඕනෑ උෆ සිහි නැති කරන්නට විතරයි. අපි ගෑස් වෙස් මුණු දගන්නවා. ගෑස් ටැංකියක් මේ කැළෑ පාර දිගේ ම ගේන්න ඕනෑ..... ඒත්... ඔව්.... ඊටත් ලේසි විදියක් තියෙනවා.

වැග්නර් හිටි හැටියේ හඬ නහා සිනා සෙන්නට පටන් ගත්තේය. ඔහුට අලුත් අදහසක් පහළ වූ බව නිසැක ය.

'හරි.... හරි.... දැන් අපට තියෙන්නෙ උන් වතුර බොන්න යන තැනක් හොයන එක විතරයි. මෙතනට නම් උන් ආයෙත් එන එකක් නෑ.'

8

මත් වූ ඇත්තු

ජූලි 21.

ස්වදේශිකයෝ ඇතුන් දිය බීමට එන ජලාසයක් සොයාගත් හ. සතුන් දිය බී කැළෑවට ගිය හැටියේ අපි වැඩ ඇරඹීමු. අපි ඇදුම් උනා විලට බැස විලෙන් කුඩා කොටසක් වෙන් වන සේ එකිනෙකට ගැටෙන්නට ලොකු ලී කොට සිටෙව්වෙමු. එය කුඩා පොකුණක් වැනි විය. පොකුණේත් විලේත් ජලය එකිනෙකට මිශ්‍ර නොවන පරිදි ලී කොට අතරේ කිරි මැටි බදමයක් තැවරුවෙමු.

'දැන් අපූරුයි' වැග් ප්‍රීතියෙන් කී ය. දැන් අපට තියෙන්නෙ පොකුණේ වතුර මත් පැන් බවට පත් කිරීම පමණයි. මා ළඟ ඒකට කදිම ක්‍රමයක් තියෙනවා. ඒක මද්‍යසාරයටත් වැඩිය හොඳින් වැඩ කරනවා.'

පැය කීපයක් සිය රසායනාගාරය තුළට වී සිටි වැග් බාල්දියක් පුරා කිසියම් දියර වර්ගයක් ගෙනාවේ ය. ඔහු එයට කීවේ 'අලි වොඩ්කා' කියා ය. ද්‍රවය පොකුණට දමා හොඳින් කලවම් කළ අපි හැම දෙනා ම ගස්වලට නැඟී බලාගෙන සිටියෙමු.

'ඒත් උන් වොඩ්කා බොයිද?' මම ඇසීමි.

'මම හිතනවා උන්ට ඒවා රහ වැටෙයි කියලා. වලස්සු නම් වොඩ්කාවලට හරිම කැදරයි. ඇත්තෙන්ම උන් හරිම බේබද්දෝ වාගෙ.... ස්.... ස්.... ස්.... මොක්කු ද එනවා....'

අප සිටියේ විලට කිට්ටුවෙන් පිහිටි ලොකු ගසක අතු අතරේ ය. පැන් බීමට එන හැම සතකු ම අප පසු කර යා යුතු ය. වනය නමැති පොර බිමෙහි නිතර රහ දැක්වෙන බොහෝ ජවනිකා මෙහි ද රහ පා ඇති බව අවට විසිරී තිබෙන වන සතුන් ගේ ඇට කටුවලින් පෙනේ. 'සඳන්නා' තණ බිම් මෙතැනට කිට්ටු ය. එහි තණ කන සත්තු නිතර දිය බීමට මෙහි එති. වැග් ගේ සංඥුව අනුව බැලූ අපට වල් ඌරු රංචුවක් දුර එනු පෙනිණ. දැවැන්ත වල් ඌරෙක් ඊරියක් සහ පැටවුන් අට දෙනකු පිරිවරාගෙන විල කරා ආවේ ය. මුළු පවුල ම ජලාශය වෙත ගියහ. ඒ සමගම ඒ රැළේ ම යැයි සිතිය හැකි තවත් ඊරියෝ පස් දෙනෙක් ආහ. මහ ඌරා පොකුණේ එක් තැනෙක දිය ඉදුල් කර හොම්බ උස්සා තහයෙන් පිඹ වෙන තැනකට ගියේ ය. එතැනිනුත් දිය තොල ගා බැලූ ඌ නොසතුට පළ කරමින් හිස වැනුවේය.

'ඌ බොන්නෙ නෑ' මම වැග්ට කොඳුරා කීමි.

'බලමු. ඌ පුරුදු වේවි.' යි වැග් සෙමින් උත්තර දුන්නේ ය.

ඔහු නිවැරදි ය. මහ ඌරා හිස වැනීම නතර කර බීගෙන බීගෙන ගියේ ය. එහෙත් ඊරි නො බීවා ය. පැටවුනටද නො බොන්නට අවවාද කරන්නාක් මෙන් පෙනුණි. එහෙත් ටික වේලාවකින් ඈටත් වොඩ්කා රස වැටුණි. ඌරු රංචුව ම එයට වහ වැටී බඩ පුරා බිවූහ. පළමුවෙන් ප්‍රතිපල දැක්වූවෝ පැටවු ය. ඔව්හු කෑ ගසන්නටත් එකිනෙකා ගේ ඇහට පනින්නටත් දුවන්නටත් පටන් ගත්හ. ඇතැම්මු පස්සා ගාත්වලින් කෙළින් සිටගත් හ. බිම රෝල් වූ හ. කරනම් ගැසුහ. ඊරියෝත් පැටවුත් අන්තිමේ දී බිම පෙරළී නිදන්නට වන්හ. එහෙත් මහ ඌරා කලබල කාරී විය. ඌ මහ ගස වෙත දුව ගොස් එයට කොතරම් තදින් පහර දුන්නේ ද කිවහොත් එහි පොත්තේ ඇමුනුණ උගේ දළ ගලවාගත්තේ අමාරු වෙනි.

ඌරා ගේ විගඩම් කෙරෙහි අවධානය යොමු කර සිටි අප නොදැනුවත්ව ම අලි රංචුව පැමිණියහ. ඔවුහු අඩි ගමනින් සන්සුන් ලෙස ආහ. සර්කස් රඟ බිමක යන ඇත් රංචුවක් මෙන් ගස වටේ ගියහ. උන් දුසිම් දෙකකටත් වැඩි ය. මෙතරම් විශාල ගණනක් වල් ඇතුන් අප නැඟ සිටි ගස යට සිටිනු දැකීම නිසා මගේ සිතේ බියක් ද උපනි.

අලි රංචුව එන විට වෙරි වූ ඌරා පැන දුවනු වෙනුවට බිහිසුණු ලෙස ගොරවා ඊ තලයක වේග-හියෙන්

ඉදිරියට ආවේය. නායක ඇතා පුදුමයට පත්ව තමා දෙසට දුවගෙන එන්නට තරම් නිර්භය ඌරු තඩියා දෙස කුහුලින් බලා සිටියේය. ඌරා උගේ දළින් ඇතාගේ කකුලට පහර දුන්නේය. ඇතා හොඬ වැල අකුළා හිස පහත් කර තමාගේ දළින් ඌරා වලට වීසි කෙළේය. ඌ මඩ ගොඩේ දහලා යළි ඉවුරට ඇදී සටනට ධෛර්යය ලබා ගැනීමට මෙන් තව බීම උගුරු කීපයක් බී නැවතත් ඇතා දෙසට දිව්වේය. මේ වතාවේ වඩාත් පරික්ෂාකාරී වූ ඇතා ඌරා එන තුරු දළ පහත් කරගෙන සිටියේය. වේගයෙන් එන ඌරා ගේ සිරුර ඇතා ගේ දළෙහි ඇමිණී ගියේය. ඇතා හිස සලා පණ අදින ඌරා බිම දමා පයක් ඔසොවා පෑගුවේය: උගේ සිරුර පොඩි පට්ටම් විය.

කිසිවක් සිදු නුණාක් මෙන් නායක ඇතා සන්සුන් ලෙස ජලාසය කරා ගමන් කෙළේය. ඌ තද නින්දේ සිටි ඊරියන් ගේ සහ ඌරු පැටවුන් ගේ සිරුරු නොපෑගෙන ලෙස ඒවා මහ හැර ගොස් හොඬවැල දියෙහි එබුවේය. සිදු වන්නේ කුමක් දැයි දැන ගැනීමට ඇති ආසාව නිසා අපේ කුතුහලය අන්තිම අංශකයට නැංගේය.

ඇතා බීම උගුරක් ගෙන යළි සොඬ ඔසොවා පොකුණෙහි අනෙක් තැන්වල ඇති ජලයෙහි රස බලන්නට මෙන් මතු පිට ජලය සොඬින් අත පත ගාන්නට පටන් ගත්තේය. අනතුරුව පොකුණෙන් පිට තැනකට හොඬවැල එබුවේය. එහි ජලයට අපේ අලි වොඩ්කා මිශ්‍රවී තිබුණේ නැත.

'ඔක්කොම ඉවර වගෙයි' මම රහසින් කීමි. එවිට ම සිදුවූ දෙය නිසා මට කෑ ගැසෙන්නට ම ගියේය. නායක ඇතා පළමු කැනට ම ගොස් 'වොඩ්කා' ගිජු ලෙස බොන්නට පටන් ගත්තේය. අනෙක් ඇත්තු ද නායකයා අනුව අවුත් බොන්නට පටන් ගත්හ. අපේ පොකුණ එතරම් විශාල නො වී ය. ඉඩ මදිකම නිසා සමහර ඇතුනට ඉන් පිටත පිරිසිදු ජලය බීමට ද සිදුවිය.

බීගෙන බීගෙන යන විට නායක ඇතා ගේ බඩ විශාල ලෙස බිම්බී එන හැටි මම දුටුවෙමි. පැය බාගයක් ගත වන විට පොකුණෙන් බාගයක් හිස් විය. පැයක් යන විට ඔවිහු අඩියේ තිබූ බීම ස්වල්පය උරා බොමින් සිටියහ. අඩි ගැහීම ඉවර වෙන්නට පෙර පවා ඔවිහු වැනෙන්නට වූහ. එකෙක් දියේම ඇද වැටුණේය. ඌ කෑ ගසා නැගිටින්නට තැත් කරන විට යළිත් ඇදගෙන පෙරළුණේය. ඌ හොඬ වැල විල් ඉවුර උඩ තබා මහ හඬින් ඝොරවන්නට වූ විට ගස්වල කොළ පවා සෙලවී ඒවායේ ලැග සිටි කුරුල්ලෝ ඉගිළ ගියහ.

නායක ඇතා මහ හඬින් කෑ ගසමින් ජලාසයෙන් ඉවතට ගියේය. උගේ හොඬ වැල කඩ මාල්ලක් මෙන් එල්ලා වැටුණේය. ඌ තාලයකට පැද්දි පැද්දී හෙමින් එහාට මෙහාට ගමන් කෙළේය. උගේ අනුචරයෝ එකිනෙකා වෙඩි කෑවුන් මෙන් ඇද වැටුණාහ. 'වොඩ්කා ටිකක් වත් බීමට අවස්ථාවක් නොලත් ඇත්තු තමන් ගේ රංචුවට මේ වේගෙන යන විපත පුදුමයෙන් බලා සිටියහ. මත් නො වූ ඇත්තු සංවේගයෙන් කුංචි නාද

කරමින් 'බේබද්දන් වටේට ගමන් කළහ. ඔවුහු ඇතැම් විට වැටී සිටියවුන් ඔසවන්නට ද උත්සාහ කළහ. එක් ලොකු ඇතින්නක් නායක ඇතා ළඟට කිට්ටු වී තම හොඬින් උගේ ඔළුව අත ගෑමෙන් සංවේගය පළ කළාය. මේ කරුණාවන්ත ක්‍රියාවට සහ අනුකූලතාවට උත්තර දීමක් වශයෙන් ඌ දුබල ලෙස වලිගය වැනුවේය. හදිසියෙන් ම ඌ හොඬ වැල ඔසවා මහ හඬ නහා බිම පෙරළුණේය. මත් නොවූ ඇත්තු දුකින් මෙන් ඌ වටා රැස්වූහ. නායක ඇතා නැතිව ආපසු යාමට ඔවුහු කැමැත්තක් නො දැක්වූහ.

'මත්නොවූ ඇතුන් නවතින්නට අදහස් කළොත් හරි කරදරයක් වේවි.' වැග හයියෙන් කීය. 'අපට වෙඩි තියන්න වෙන්න පුළුවනි. බලමු කොහොමටත් මොකද වෙන්නෙ කියල.'

මත් නොවූ ඇත්තු අමුතු විදියේ ශබ්ද කරමින් හොඬ වැල් වනමින් එක්තරා අන්දමක සාකච්ඡාවක් කළහ. ටික වේලාවක් මෙය පැවතුණි. වෙන නායකයකු තෝරාගත් ඔවුහු තම සගයන් ගේ 'මළ සිරුරු' එහි ම තිබියදී පෙරහැරක් මෙන් පෙළ සැදී වනයට ගමන් කිරීමට පටන් ගත්තේ බැස යන හිරු රැස් වැදී බටහිර අහස ලේ පැහැ රැගත් වෙලාවේ ය.

෭

රිං ඇතකු වෙයි.

දැන් අපි ගසින් බැසිය යුතු වෙලාව පැමිණ ඇත. මම හාත්පස පිරික්සා බැලුවෙමි. විශාල ඇත්තු ද ඒ අතරේ ලොකු කුඩා වල් ඌරෝ ද පැත්ත වැටී නිදති. මේ මත් ගතිය හුහක් වෙලා පවතී වි ද?

ශල්‍යකර්මය කිරීමට පෙර ඇතුන් ගේ මත පහව ගියොත් කුමක් වේවි ද? මගේ බිය වැඩි කරන්නට මෙන් ඇත්තු වරින් වර ඔවුන්ගේ හොඬවැල් සෙල වූහ. ඇතැම්මු නින්දේ ම වේදනාවෙන් කෑ ගැසූහ.

වැග් ගසින් බට වහා ම මොහොතකුදු අපතේ නොයවා වැඩ පටන් ගත්තේය. ස්වදේශීන් නිදන ඌරන් මරද්දී අපි සැත් කම පටන් ගතිමු. වැග් නායක ඇතා ළහට ගොස් විෂ බීජ නසන ලද කුඩා පිහියක් බැගයෙන් එලියට ගෙන උගේ සමේ කැපුමක් සාදා හම පිට පෙරළා ඔළු කටුව කියතකින් ඉරන්නට පටන්

ගත්තේය. ඌ වරක් හෝ දෙවරක් හොඬ වැල ගැස්සුවේය. මම බයේ ගැහුණෙමි. වැග් මා අස්වැසුවේය.

'බය වෙන්න එපා. මගේ නිදි බෙහෙත ගැන මට විශ්වාසයි. ඇතා පැය තුනක් නිදගනීවි. ඒ කාලය තුළ මොළය ඵලියට ගන්න පුළුවන්. ඊට පස්සෙ උගෙන් අනතුරක් නෑ.'

ඔහු පරිස්සමින් කපාලය ඉරා නළල් කටුව ඵසවීය. ඇතා ගේ ඇහැටත් කනටත් අතර පිහිටි අල්ලක් පමණ වූ තැනක් පෙන්වා වැග් මෙසේ කී ය.

'අලියෙක් මරන්න පුළුවන් මෙන්න මේ පුංචි තැනට වෙඩි තැබීමෙන් පමණයි. මම දැනට ම රිං ගේ මොළයට කියල තියෙනව මෙතන පරිස්සම් කර ගන්න කියල.'

වැග් ඇතා ගේ ඔළුවෙන් මොළය ඉවතට ගත්තේය. එහෙත් මේ වේලාවේ දී බලාපොරොත්තු නොවූ දෙයක් සිදු විය. ටිකක් සෙලවුණු මොළය රහිත ඇතා අප ඉමහත් පුදුමයට පත් කරමින් නැගිට අඩි කීපයක් ඉදිරියට ගියේය. ඌ ඇස් හොඳින් ඇරගෙන සිටියත් තමා ඉදිරියේ ඇති කිසිවක් ඌට පෙනුණේ නැත. වැතිරී සිටින තමාගේ සගයින් මග හැර යාමට කිසි උත්සාහයක් නොකළ නිසා ඌ පය පැකිළී බිම ඇද වැටුණේය. උගේ හොඬත් කකුලුත් ගැහෙන්නට පටන් ගත්තේය. මම අපගේ සියලු මහන්සිය අපතේ යනැයි කණගාටු වීමි.

වැග් සෙලවීම නතර වන තුරු බලා සිටියා පමණි. 'දැන් ඇතා මැරිලා. මොළය නැතුව මොන සතකුට වත් ජීවත් වෙන්න බෑ. නමුත් අපි ඌට පණ දෙනවා. ඒක අමාරු නෑ. මට දෙන්න රිං ගේ මොළය.... පරෙස්සමෙන්.... විෂ බීජ ඇතුළට නොයන්න බලාගන්න.'

මම අත් හොඳින් සෝදගෙන අප ගෙන ආ ඇත් මොළ කුඩුවෙන් රිං ගේ මොළය ඉවතට ගෙන එය වැග්ට දුනිමි. වැග් එය ඇතා ගේ හිස් කබලට ඇතුළු කෙළේය.

'ගානට හරිද?' මම ඇසීම්.

'ටිකක් පුංචියි' ඒකට කමක් නෑ. ඊට නරකයි මොළය කුඩුවේ පමණට වැඩිය වැඩුනා නම්, දැන් තමයි වැදගත් ම වැඩේ. නහර කොන් මහන එක. මම එකතු කරන සෑම නහරයක ම රිංගෙ මොළයයි ඇතාගෙ ශරීරයයි සම්බන්ධ කරාවි. දැන් ඔබ ටිකක් නිවාඩු ගන්න. ප්‍රශ්න ඇසීමෙන් මට බාධා කරන්න විතරක් එපා.'

වැග් ඉතා වේගයෙන් සහ අතිශය ප්‍රවේශමෙන් වැඩේ කරගෙන ගියේය. ඔහු ගේ ඇහිලි කඩිනමින් වැඩ කළේය. ඇස් දෙක එකම ලක්ෂ්‍යයකට යොමු වී තිබුණේය. එසේ වෙන්නේ යම් කිසි කරුණක් ඔහුගේ අති විශේෂ අවධානයට ලක් වූ විට පමණකි. ඔහු ගේ මොළයේ පැති දෙක ම එකිනෙක පාලනය කරමින් එක ම වැඩක් කරන බව ඉන් පැහැදිලි වෙයි. අන්තිමට ඔහු

නළල් ඇටය මොළයට උඩින් තබා එය ලෝහ ගාංචුවකින් සවි කර උඩින් සම අතුරා මැසුවේය.

'දැන් හරි අගෙයි. සුව වුණාම කැළල මිස වෙන මොකුත් පේන්නෙ නෑ. මම හිතනවා ඒකට නම් රිං මට සමාව දේවි කියා.'

රිං සමාව දෙන්න.... ඇත්තෙන් ම දැන් ඇතා නොව රිං ය. නැත්නම් රිං ඇතකු වී සිටී. මම මිනිස් මොළයක් සහිත මේ පුදුම ඇතා දෙසට තවත් කිට්ටු වී උගේ ඇරී තිබෙන ඇස් දෙස පුදුමයෙන් බැලීමි. ඒවා තව ම පණ නැතිවාක් මෙන් පෙනේ.

'රිං ගේ මොළය සම්පූර්ණයෙන් සවේතනිකයි. ඒත් ඇස් රිං ගේ කිවයුතු ද. ඇතා ගේ කිවයුතු දැ යි මට සිතාගන්නට බැරි විය. නිකං වීදුරු ඇස් වගෙයි. මොකද එහෙම වෙන්න කාරණය?' මම ඇසීමි

'ඒක පැහැදිලි කරුණක්. මොළයෙන් එන නහර මැහුවට තවම ඒවා ශරීරයේ නහර සමඟ පැහිලා නෑ. නහර කොන් එකට පැහෙන තුරු හෙලවෙන්න එපා කියල මම රිංට අවවාද කළා. පෑහීම ඉක්මන් වීමට කළ හැකි හැම දේ ම කළා.' වැග් උත්තර දුන්නේ ය.

ඉර බැස ගියේය. ස්වදේශිකයෝ විල් තෙර ගිනි ගොඩවල් ගසා උරු මස් පුළුස්සාගෙන අහිරුවියෙන් කෑහ. සමහරු අමුවෙන් ද කෑහ. බීමත් ව වැටී සිටි ඇතෙක් හදිසියේ ම මහ හඬින් නාද කරන්නට විය. වැග්

සහ මම ඉක්මනින් පදුරුවලට මුවා වීමු. ස්වදේශිකයෝ ද එසේ කළහ. ඇත්තු එකිනෙකා නැඟිට වැනි වැනී ගමන් කළහ. ඔව්හු සැත් කමින් පසු තවමත් නිදන නායක ඇතා වෙතට ගොස් උගේ ඇහ උඩ හොඬ තබා පිරික්සමින් ඇත් බසින් සාකච්ඡාවක් කළහ. දැන් ඇස් පෙනීම සහ කන් ඇසීම ලැබී තිබේ නම් රිං ට කුමක් සිතෙනවා ඇද්දැයි මට කල්පනා විය. අවසානයේ ඇත්තු යන්නට ගියහ. අපි අපේ 'ලෙඩා' වෙතට ගියෙමු.

'නිශ්ශබ්දව ඉන්න. මට උත්තර දෙන්න එපා.' වැග් කථා කරන්නට පුළුවන් එකකුට මෙන් ඇතාට කීය. 'ඔබට ශක්තිය තිබෙනොත් ඇසිපිය ගහන්නට පමණක් ඉඩ දීමට මට පුළුවන්. දැන් ඔබට මම කියන දේ තේරෙනවා නම් දෙවරක් ඇසිපිය ගහන්න.'

ඇතා දෙවරක් ඇසිපිය ගැසුවේය. 'බොහොම හොඳයි.... අද ඔබ ඔහොම ම නිදගෙන ඉන්න ඕනෑ. මම හෙට ඔබට නැඟිටින්න ඉඩ දෙනවා. වන සතුන් අවිත් ඔබට කරදර කරන්න පුළුවන් නිසා අලි පාර වහල දාන්න ඕනෑ. රෑ තිස්සෙ අපි ගිනි මැල ගහනවා.'

ජූලි 24.

අද ඇතා පළමු වරට නැගිට්ටේය. 'ජයවේවා!' කියමින් වැග් ඔහුට සුබ පැතී ය. 'අපි ඔබට කියන්නෙ මොකද? අපි ඔබේ රහස හෙලි නොකළ යුතුයි. ඒ නිසා රිං නොකියා අපි ඔබට කියනවා 'සාපියන්ස්' කියල. කැමති ද?'

ඇතා හිස වැනුවේය. 'අපි මෝර්ස් කෝඩ්' එකෙන් අදහස් හුවමාරු කරගනිමු.' වැග් තව දුරටත් කී ය.

'තිතක් වෙනුවට හොඬේ අග තුඩ උඩු අතට නවන්න. ඉරක් වෙනුවට පැත්තට නවන්න. ඔබට පහසුනම් ශබ්ද සංඥා කරන්නත් පුළුවනි. තිතක් වෙනුවට කෙටි ශබ්ද – ඉරක් වෙනුවට ටිකක් දිග ශබ්ද, දැන් හොඬෙන් සංඥා දෙන්න.'

ඇතා නුහුරු ලෙස හොඬ වැලේ තුඩ වනන්නට විය. එය නිසි සේ ක්‍රියා කළ නොහැකි අවයවයක් මෙන් සෑම අතට ම වැනුණේ ය.

'ඔබ ඒකට තව පුරුදු වෙන්න ඕනෑ. ඔබට කවදාවත් හොඬ වැලක් තිබුණෙ නෑ නොවැ.... බලන්න ඇවිදින්න ටිකක්.'

ඇතා ඇවිදින්නට පටන් ගත්තේ ය. උගේ පස්සා ගාත් ඉස්සරහ ගාත්වලට වඩා ඌට කීකරු බව පෙනුණේය.

'මට පේනවා ඔබට අලියෙක් වෙන්න පුරුදුවිය යුතු බව.' වැග් විස්කර කෙළේය. 'ඔබේ මොළයෙත් ඇත් මොළයෙත් වැඩි වෙනසක් නෑ. ඒ වුනත් කකුල්, හොඬ සහ කන පාවිච්චි කරන්න ඉක්මනින් ඉගෙනගන්න වේවි. ඇත්තෙන් ම ඇතාගෙ සහජ ශක්ති, උත්පත්තියෙන් ම ලැබී ඇති අවුරුදු කෝටි ගණනක ඇත් පරම්පරාවේ අත්දැකීම් වල සාරාංශය යි. නියම ඇතෙක් දන්නව ඌ

හය වෙන්න ඕන මොනවටද, සතුරන් ගෙන් ප්‍රවේසම් වෙන්නෙ කොහාම ද, කෑම සහ වතුර ලබා ගත හැක්කේ කොහෙන්ද යනාදී දේවල්. ඒවා ගැන ඔබට දැනීමක් නැහැ. අනෙක් ඇතුන් සහජයෙන් ලැබූ පළපුරුදු ඔබ අත්දැකීමෙන් ලබාගන්න ඕනෑ. ඒත් සාපියන්ස්, ඔබ බය වෙන්න ඕන නෑ. අපි නිතර ම ඔබත් සමග ඉන්නවා. ඔබට හොඳට සනීප වුණ හැටියේ අපි ඔක්කොම යුරෝපයට යමු. ඔබ කැමති නම් ඔබේ උපන් බිම වූ ජර්මනියෙම වාසය කරන්න පුළුවනි. නැත්නම් අපට ඔබත් එක්ක සෝවියට් දේශයට යන්න පුළුවනි. ඔබට එහේ සක්වෝද්‍යානයේ ඉන්න පුළුවනි. ඒත් කියන්න දැන් කොහාමද ඔබට දැනෙන්නෙ?'

සාපියන්ස්ට හොඬ අඟ චලනය කිරීමට වඩා හොඬින් පිඹීමෙන් සංඥ නිපදවීම පහසු බව හෙළි විය. ඔහු හොඬින් හති ලන්නාක් වැනි කෙටි ශබ්ද ඉපදවීමට පටන් ගත්තේය. වැග් එය අසා සිට මට මෙසේ පරිවර්තනය කෙළේය. (මම ඒ දවස්වල මෝර්ස් කෝඩ් එක නොදැන හිටියෙමි.)

'මගෙ පෙනීම කලින් තරම් හොඳ නෑ. මා උස නිසා මට දුර පේන එක හැබැයි – එහෙත් දර්ශන පථය බොහොම සීමා වෙලා. කන් ඇහීමත් ගඳ සුවඳ දැනීමත් පුදුම විධියට තියුණුයි. මේ ලෝකයේ මෙච්චර ශබ්ද සහ ගඳ සුවඳ තිබෙන බව මම හිතුවෙ නෑ. පුදුම සියුම් ගඳ සුවඳවල් දහස් ගණනක් මගේ නාසයට දැනෙනවා. ගණන් කරන්න බැරි තරම් පුදුම ශබ්ද රාශියක් මට

ඇහෙනවා. මා හිතනවා ඒ ශබ්ද හඳුන්වන්න මිනිසුන් ගේ භාෂාවල වචන නැත කියා. කුරුමිණියන් සහ කම්බි පණුවන් ගස්වල පොතු විදගෙන යාම පවා මට ඇහෙනවා. ඉතින් ඒ ශබ්දය හැදින්වීමට දිය යුතු වචනය කුමක් ද?'

'ඔබ දියුණු වේගන එනවා සාපියන්ස්' වැග් කී ය. සාපියන්ස් තව දුරටත් ඔහු ගේ අලුත් හැඟීම් විස්තර කෙළේය. 'මේ ගඳ සුවඳ දැනීම – එහෙම නැත්නම් ඉව – අනිත් මට දැනෙන දේ පිළිබඳ කිට්ටු විස්තරයක් වත් ඔබට කියන්න මට පුළුවන් කමක් නෑ. ඔබට තේරුම් ගන්න පුළුවන් සැම ගසකට ම – සෑම සතකුට ම – සෑම ද්‍රව්‍යයකට ම විශේෂ වූ ගඳක් හෝ සුවඳක් හෝ තිබෙන බව විතරයි' කියමින් ඇතා සිය හොඬවැල පොළොවට කිට්ටු කර හුස්ම ඉහළට ඇද්දේය. 'ඔය පොළොවේ සුවඳ' ඌ තවත් ඉව කරගෙන ගියේය. 'මේ තණ කොළවල වෙන සුවඳක්, තව.... මම දන්නෙ නෑ. ඒ සුවඳ එන්නෙ කොහෙන් ද කියල? ආ.... ඔව්. මෙන්න තඹ කම්බි කැල්ලක්.... මේක මෙතන දන්න ඇත්තෙ ඔබයි නේද වැග්නර්?'

'ඒක වෙන්නෙ කොහොම ද? දැනීමේ තියුණු කම පහළ වෙන්නෙ අරමුණු ගැනීමේ ඉන්ද්‍රියවල තියුණු කම නිසා ම නොව මොළයේ ක්‍රියාකාරිත්වය ද නිසයි. ඉතිං සාපියන්ස් – රිංට ඇතාගේ ඉන්ද්‍රියයන් තිබුණත් මිනිස් මොළයකුයි ඇත්තෙ' මම කීම්.

'ඔව්, රිං ගේ මොළය සම්පූර්ණයෙන් පුරුදු කරන ලද්දක් නිසා ඇතකු ගේ බුද්ධියේ තියුණු කම පිළිබඳ හැඟීම එයටත් තියෙනවා. තවමත් ඒ හැඟීම නියම ඇතකු ගේ ප්‍රමාණයට වඩා අඩු ඇති. එහෙත් රිං ගේ ශ්‍රවණ ඉන්ද්‍රියය සහ ආඝ්‍රාණ ඉන්ද්‍රියය දැනටත් අපට වඩා තියුණුයි. ඒ නිසා අපට වඩා දැනීමේ ශක්තියකුත් ඔහුට තියෙනවා.'

වැග් ඇතා දෙසට හැරී මෙසේ කීය: 'සාපියන්ස් මා හිතනවා ආපහු වාඩියට යනකොට අපි ඔබේ පිට උඩ නැඟී යාම ඔබට බරක් නෙවෙයි කියා...'

සාපියන්ස් ත්‍යාගශීලී ලෙස යෝජනාවට කැමති වී හිස සැලුවේය. අපි අපේ බඩුවලින් වැඩි හරිය ඔහු ගේ පිට උඩ පැටෙව්වෙමු. ඔහු වැග්නර් සහ මා හොඩින් ගෙන තමා ගේ පිට උඩ තබාගත්තේය. අපි පිටත් වීමු. ස්වදේශිකයෝ අප පස්සේ පයින් ආහ.

'මම හිතනවා සුමාන කීපයකින් සාපියන්ස්ට හොඳින් සනීප වේවිය කියා. ඊට පස්සෙ ඔහු බොන් නුවරට අප ගෙන යාවි. එතැන් සිට අපි තැවෙන් යනවා.'

අපි කඳුගැටය උඩ වාඩියට ගියෙමු.

'මෙහෙ ඔබට ඕනෑ තරම් කොළ ආහාර තියෙනවා.' වැග්නර් සාපියන්ස්ට කී ය. ඒත් වාඩියෙන් වැඩිපුර ඇත යන්න එපා. රෑට නම් යන්නම එපා නියම අලියෙකුට නම් ලේසියෙන් මුණ දෙන්න හැකි – නමුත් ඔබට අනතුරු දයක බොහෝ දේ ඇති වෙන්න පුළුවන්.'

ඇතා හිස සොලවා කිට්ටුව පිහිටි ගස්වල අතු සොඩින් කඩා කන්නට පටන් ගත්තේය.

හදිසියෙන් ම වේදනාවෙන් කෑ ගසන්නට පටන් ගත් ඇතා සොඩ අකුලාගෙන වැග් වෙත දුව ආවේය.

'මොකද? මොකද?' වැග් ඇසුවේය.

ඇතා හොඬ වැල වැග් ගේ මුහුණට ම ලං කෙළේය. 'අයියෝ...' යි වැග් සංවේගයෙන් කෑ ගැසුවේය. ඔහු මට කථා කොට ඇතා ගේ හොඬ අග ඇහිල්ලක් වැනි කොටස පෙන්නුවේය. 'මේ පොඩි ඇහිල්ල අන්ධයකු ගේ ඇහිල්ලටත් වැඩිය හැඟීම් සහිතයි. ඇත්ත වශයෙන් ම ඇතා ගේ ඉතාම හැඟීම් සහිත ඉන්ද්‍රියයත් එයයි. මේ බලන්න අපේ සාපියන්ස් උගේ ඇහිල්ලෙ කටුවක් ඇණගෙන.'

වැග් පරිස්සමින් කටුව ඇද දමා ඇතාට අවවාද කෙළේය.

'ඔබ බොහොම පරෙස්සම් වෙන්න ඕනෑ. හොඬ වැල තුවාල වුණු ඇතා ලෙඩෙක්, ඔබට වතුර බොන්නවත් බැරි වෙයි. වතුර තිබහ වුණාම හොඬ වැල පාවිච්චි නොකර ගහට හරි විලට හරි බැහැල කටින් ම බොන්න වෙයි. මේ හරියේ කටු පදුරු හුහක් තියෙනවා. තව ටිකක් ඈතට යන්න. ඔබට ඉක්මනට අනතුරක් නැති ගස් වර්ග හඳුනාගන්න පුළුවන් වේවි.'

10

ඇතාගේ කතාව

'මම දින පොත කියවා ඉවරයි' ඩෙනිසොව් කී ය. 'හොඳයි මෙන්න එහෙනම් ඉතුරු හරිය' කියමින් වැග්නර් ඇතා කියූ තොරතුරු අනුව තමා මෙතෙක් ලියූ සටහන් ගොන්න ඩෙනිසොව්ට පෙන්වීය.

'ඔබ දින පොත කියවන විට ඇතා තමාගේ කතාන්තරයේ ඉතුරු හරිය මා සමග කීවා. මා මෙතරම් වෙහෙසින් බිහි කළ මිනිස් ඇතා නොහොත් ඇත් මිනිසා කොංගෝ වනයේ දී ම නැති වුණා. ඌ සොයා ගැනීමේ සියලු බලාපොරොත්තු සුන් වූ තැන මම යුරෝපයට ආවා. අන්තිමේ දී ඌත් කොහොම හරි යුරෝපයට එන්න පාර හොයාගෙන තියෙනවා. කරුණාකර මේ සටහන් ටික කියවා මට ටයිප් කර දෙන්න' කියමින් වැග් සිය ලඝු ලේඛන සටහන් ඩෙනිසොව් ට දුන්නේය.

ඩෙනිසොව් සටහන් පොත ගෙන ඇතා විසින් ම කියන ලද කථාන්තරය හෙම්හිට කියවා ටයිප් කරන්නට පටන් ගත්තේය. පහත දැක්වෙන්නේ එම කතාවයි.

* * * *

මහාචාර්ය ටර්නර් ගේ දෙවනියා ලෙස ජීවිතය ඇරඹූ මම මගේ ජීවිත කාලයෙන් කොටසක් අප්‍රිකානු වනාන්තරයේ වන ලැහැබ්වල ගත කරන්නට සිදු වෙතැයි සිහිනෙනුත් නොසිතුවෙමි. ඇතකු වශයෙන් මා ලත් අත්දැකීම් සියල්ල කීම අමාරු වුවත් සිදුවීම් ඇති වූ පිළිවෙලින් ඒවායේ කෙටි සටහනක් කිමට මම උත්සාහ කරමි.

මම එදා රෑ වාඩියට නුදුරු වූ තණ බිමක සරුවට වැඩුණු තණ පඳුරු කඩා කමින් සිටියෙමි. ඒවා කෑමට මා ආසා කළ නිසා තවත් තණ සෙවීමට මම කැළෑව ඇතුළට ගියෙමි. එය දීප්තිමත් හඳ එලිය සහිත රාත්‍රියක් විය. කණමැදිරියෝ ද නිශාචර පක්ෂීහු ද ඔබ මොබ පියාසර කළහ. මම සෙමින් ඉදිරියට ගියෙමි. මගේ දැවැන්ත ශරීරයේ බරක් මට දැනුණේ නැත. මම හැකි තරම් අඩුවෙන් ශබ්ද නැගෙන සේ ක්‍රියා කෙළෙමි. වන සතුන් ඇසුරෙන් හමා එන සුළඟ මගේ නාසයට දැනුණේය. එහෙත් ඒ කුමන සතුන් දැයි මම නොදැන සිටියෙමි. වනයේ ඕනෑම ලොකු සතකුට වඩා මා ශක්ති සම්පන්න බවත් සිංහයා පවා මට වඩා දුර්වල බවත් මම දැන සිටියෙමි. එහෙත් පැන දුවන මීයකු හෝ නරියකු වැනි කුඩා සතකු ගේ ශබ්දයෙන් පවා මම තැති

ගත්තෙමි. කුඩා වල් ඌරකු හමු වූ කල ඌ යන තුරුම මම මහ හැර සිටියෙමි. මගේ ඉමහත් ශක්තිය ගැන විශ්වාසයක් මා තුළ නො වී ය. ළඟ පාත මිනිසුන් ඉන්නා බව ද ඒ නිසා අවශ්‍ය වූ විට මගේ උපකාරයට ඒමට මිත්‍රයන් ඇති බව ද දැන සිටීම මට ඇති එකම සැනසිල්ල විය. මා තණ පඳුරක් කඩා ගන්නට සොඬ පහත් කරන විට හදිසියෙන් ම කුඩා වන සතකුගේ ඉවක් මට දැනුණේය. එවිට ම පඳුරු අතරේ සර සර ගාන හඬක් ද ඇසුණේය. මම හොඬ වැල ආරක්ෂා කර ගැනීම සඳහා රවුමට හකුළාගෙන අවට විපරම් කර බැලීමි. දෙළ පාර ළඟ පඳුරක් අස්සේ සැහවී, සිටි කොටියෙක් හදිසියේ ම මගේ ඇසට ලක් විය. ඌ මා දෙස කෑදර ලෙස ඇස් ඔරවා පනින්ට හරි බරි ගැහෙමින් සිටියේය. තව මොහොතක දී ඌ මගේ බෙල්ලට පනිනවා ඇතැයි මට සිතිණ. මට කුමක් සිදු වී දැයි නොදනිමි. මා ඇතකු ලෙස සිතන්නට පුරුදුව නො සිටියා හෝ මගේ මිනිස් හැඟීම් වැඩියෙන් බලපැවැත්තුවා හෝ විය හැකි ය. කෙසේ වුවත් බියෙන් උමතු වූ මම වෙව්ලමින් දුවන්නට වීමි.

මා දුවන පාරේ පඳුරු පොඩි පට්ටම් විය. වන සත්තු කැළැව බිඳගෙන පළා ගියහ. ඉන් මගේ බිය තව තවත් වැඩි විය. කොංගෝ වනයෙහි වෙසෙන හැම සතකු ම මා පසු පස එළවා එන කලෙක මෙන් මම බොහෝ දුර දිව්වෙමි. අවසානයෙහි උග්‍ර බාධකයක් නිසා මට නවතින්නට සිදු විය. මා ඉදිරියෙහි වූයේ ගඟයි. මට පීනන්නට බැරි ය. නැතහොත් මිනිසකුව

සිටියදී මම පිනන්නට නොදැන සිටියෙමි. එහෙත් කොටියා තවමත් පස්සෙන් එළවතැයි සිතූ මම දියට පැන ගොඩ දී දුවන විට කරන්නාක් මෙන් කකුල් ක්‍රියා කරවීමි. මා පිහිනන බව මට දැනුණි. ජලයේ දී කලබල ගතිය පහ වී සිත මදක් සන්සුන් විය. එහෙත් තවමත් මා තුළ වූ හැඟීම නම් මා ගොඩට පා තැබූ හැටියේ මා පිටට පනින්නට සූදානම් වූ බඩ ගිනි කාර රුදුරු වන සතුන් ගෙන් මුළු කැළෑවම පිරී ඇති බව ය. ඒ නිසා මම දිගට ම පීතුවෙමි. කාලය පැයින් පැය ගෙවී ගියේය. ඉර උදා වී ඇති මුත් මම තවමත් පිනමින් සිටියෙමි. ගඟේ මිනිසුන් නැගී යන බෝට්ටු තිබුණේය. එහෙත් මම මිනිසුනට භය නොවීමි. ඔව්, එක බෝට්ටුවකින් වෙඩි ශබ්දයක් එන තුරු ම මම මිනිසුනට භය නොවීමි. ඒ සමඟ ම දෙවැනි වෙඩි හඬක් ද ඇසුණේය. එක පාරට ම මගේ බෙල්ල පිටු පස මීමැස්සෙකු දස්ට කළාක් මෙන් මට දැනුණේ ය. හිස හරවා බැලූ මට ඉංග්‍රීසිකාරයකු මෙන් හැඳගත් සුදු මිනිසකු පෙනුණේය. මට වෙඩි තියන මිනිහා ඔහු ය. අහෝ... මිනිසුන් ද, වන සතුන් තරමට ම භයානක ජාතියක් බව මට දැන් පෙනේ.

දැන් ඉතින් මා කළ යුත්තේ කුමක් ද? වෙඩි තැබීම නවත්වන ලෙස ඉංග්‍රීසිකාරයාට හඬ ගා කියන්නට මට ඕනෑ විය. එහෙත් මට පුළුවන් වූයේ හීන් උස් හඬක් නහන්නට පමණි. ඉංග්‍රීසිකාරයා නැවතත් ඉලක්කය ගත්තොත් මා මැරේවි. ඔබට මතක නේද ඔබ මට කියා දුන් ඇතකුට මරණීය තුවාල කළ හැකි ඇහැටත් කනටත් අතරේ මොළය පිහිටි තැන ගැන? මම

හැකි තාක් වේගයෙන් ඉවුරට පීනන ගමන් ඔබේ අවවාදය මතක් වී එතැනට වෙඩි උංඩ නොවදින ලෙස හිස හරවාගෙන ගියෙමි. මා ගං ඉවුරට නගින විට වෙඩි පහරට හොඳ ඉලක්කයක් වෙන්නට ඉඩ තිබුණ නමුත් මගේ ඔළුව කැළයට හරවා ගත් නිසා මා බේරුණි. ඉංග්‍රීසිකාරයා අලි දඩයමේ නීති රීති හොඳින් දැන සිටි නිසා මගේ පසු පසට වෙඩි තබා උංඩ අපතේ හැරියේ නැත. ඔහු වෙඩි තැබීම නැවැත්තුවේ සමහර විට මගේ මුහුණ ඔහු දෙසට හරවන තුරු විය හැක. මම වන සතුන් ගැන තව දුරටත් තැකීමක් නොකර කැළයට වැදුණෙමි.

කැළෑව එන්න එන්න ම ඝන විය. විශාල වැල් නිසා පාර අවහිර විය. ඒවායේ පැටලැවීම නිසා මට ඉදිරියට යන්නට බැරි විය. මම බොහෝ සෙයින් වෙහෙසට පත් වී සිටියෙමි. වෙන දෙයක් වෙන්න කියා මම පැත්ත වැටී වැතුරුණෙමි. අලියකු වුවත් නැතත් වේලාවේ හැටියට කළ යුතු දෙය එයයි. තද වෙහෙස නිසා මට නින්ද ගියේය.

මම භයානක හීනයක් දුටුවෙමි. මහාචාර්ය ටර්නර් ගේ දෙවෙනියා වූ විශ්ව විද්‍යාල කථිකාචාර්ය වරයකු වූ ද මම බර්ලින් නගරයේ අන්ටර්ඩෙන් – ලින්ඩන් හි මගේ කන්තෝරු කාමරයෙහි සිටියෙමි. ඒ කදිම ගිම්හාන රාත්‍රියකි. අහසෙහි හුදකලා තරුවක් දිලිසෙමින් තිබෙන බව අඩක් ඇරුණු ජනේලයෙන්

පෙනුණේය. ලයිම් ගස්වල සුවඳ සුළඟේ පාවී ආවේ ය. පුංචි මේසය උඩ නිල් වැනිසියන් වීදුරු බඳුනක ඉම්හිරි සුවඳැති රතු කානේෂන් පොකුරක් විය. මේ මනහර සුගන්ධය අතරට අනාරාධිත අමුත්තකු සේ, කටුක – අම්හිරි කලු මිදිවල වැනි ගඳක් ආවේය. එය වනසතකුගේ ගඳක් ලෙසට මට දැනුණි. මේ වෙලාවේ මට නිදිමත ඇති වී මගේ හිස ඉදිරියෙන් වූ පොත් ගොඩ මතට නැමුණි. ඊට පසු මම මඳ වේලාවක් අඩ නින්දේ නිදගතිමි. එහෙත් ලයිම් මල්වලත් කානේෂන්වලත් සුවඳට මුසු වූ වනසතුන් ගේ ගඳ මට තවමත් දැනේ. ඊටපසු මම තව භයානක සිහිනයක් දුටුවෙමි. මම ඝර්ම කලාපික වනාන්තරයක ඇතකු බවට පත් වී සිටිනවා දුටුවෙමි. වනසතුන් ගේ ගඳ තවත් දැඩි වී මට පීඩා කෙළේය. මම අවදි වීමි. නැත්නම් අවදි වන බව සිහිනෙන් දුටිමි. එය සිහිනයක් නොවී ය. අපුලියන් ගේ 'රන්වන් කොටලුවා' නම් කථාවෙහි එන 'ලුෂියස්' කොටලුවකු වූවාක් මෙන් මම ද හැබෑ ඇතකු බවට පත් වී සිටියෙමි. එකම වෙනස නම් ලුෂියස් ඉන්ද්‍ර ජාලයෙන් කොටලුවකු වූ අතර මා නවීන විද්‍යාවෙන් ඇතකු වීම යි.

'මට කකුල් දෙකේ සතකු කෙරෙන් හමා ආ සුළඟක් දැනුණි. එය අප්‍රිකානු ස්වදේශිකයකු ගේ ඉවකි. සුදු මිනිසකු ගේ ඉවක් ද ඊට මිශ්‍රව තිබුණි. එය ඇතැම් විට බෝට්ටුවෙහි සිට මට වෙඩි තැබූ සුද්දා ගේ විය හැක. එහෙනම් ඌ තාමත් මා පස්සේ.... සමහර විට සුද්දා පදුරක් අස්සේ සැහවී සිට මගේ කණටත් ඇහැටත් අතර

ඇති මාරක නිලයට තුවක්කුව එල්ල කොට කුරුමානම අල්ලනවා විය හැකි ය.

'මම උඩ විසි වී නැගිට්ටෙමි. ඉව ආවේ දකුණු අත පැත්තෙනි. ඉතින් මා වම් අත පැත්තට දිවිය යුතු ය. මම දෙපයට වෙර දී පදුරු බිඳ පෙරලාගෙන දිව්වෙමි. ඊට පසු ලුහුබඳින්නන් ගෙන් බේරීමට ඇතුන් කරන කපටි කමක් මම ද කෙළෙමි. මේ ප්‍රයෝගය මට ඉගැන්නුවේ කවිදැයි කිව නොහැක. මහා ඝෝෂාවක් කරමින් ම දුරක් ගිය පසු ඇතා සම්පූර්ණයෙන් නිශ්ශබ්ද වෙයි. ලුහුබඳින්නා කන් දී සිට කිසි ශබ්දයක් නැති නිසා ඇතා ගමන නවත්වන්නට ඇතැයි සිතයි. නමුත් සැබවින් ම ඇතා පළා යයි. ඌ ඉතා පරෙස්සමෙන් ඉතා හෙමින් අතු දෙපසට නවමින් හොර බළලකු මෙන් නිහඬ ව ගමන් කරයි. මම ද මේ ප්‍රයෝගය කෙළෙමි.

'මට ආපසු හැරී හොඬෙන් ඉව අල්ලා බැලීමටවත් ධෛර්යයක් ලැබුණේ සැතපුම් දෙකක් පමණ දිවූ පසු ය. මට තවමත් මිනිසුන් ගේ ඉව වැටෙයි. ඒත් ඔවුන් සැතපුමක් පමණ ඈත් විය යුතු ය. මම දිගටම දිව්වෙමි.

'යළින් රාත්‍රිය පැමිණියේය. හුස්ම ගන්නටවත් බැරි තරම් උණුසුම දැඩි ය. දසත පැතිර තිබූ දැඩි අඳුර නිසා මගේ භය තවත් වැඩි විය. භය සෑම අතින් ම අවුත් අඳුර මෙන් ම මා වෙලාගත්තේය. මා ආරක්ෂාව සඳහා කොහාට පලා යන්න ද? මට කුමක් කළ හැකි ද? නතරව සිටීම ගමන් කිරීමටත් වඩා භයානක බව

මට සිතුණි. මම හිත තද කර ගෙන වෙහෙස නොබලා ඉදිරියට අඩිය තැබීමි.

'ටික වෙලාවක් යන විට මා අඩිය තබන තැන්වල වතුර කැලතෙන්නට පටන් ගත්තේය. තව අඩි කීපයක් ගිය තැන මා ඉවුරක සිටින බව වැටහුණි. කුමන ඉවුරක් ද? ගඟක ද? විලකද? මම නැවතත් පීනන්නට තීරණය කෙළෙමි. දියේ දී අඩු ගණනේ සිංහයන් ගේ සහ කොටියන් ගේ පහරවලින් ආරක්ෂා විය හැකි යැයි මට සිතිණ. පුදුමයකට මෙන් නොගැඹුරු දියේ පත්ලෙහි මගේ අඩි වැදුණේය. එතැන් සිට මම ගමන් කෙළෙමි. මම දෙළ පහරවල් ඔයවල් සහ වගුරු බිම් පසු කොට ගමන් කෙළෙමි. කුඩා සත්තු තණ අතරේ සිට සු-සු ගැහ. ලොකු ගෙම්බෝ භය වී ඉවතට පැන ගියහ. රෑ තිස්සේ ඉබාගාතේ ගමන් කළ මා සම්පූර්ණයෙන් වල් මත් වී ඇති බව උදේ මට වැටහිණ.

'දවස් කීපයක් ගත වන විට කලින් මා තදින් භය වූ බොහෝ දේවලට භය නොවී ඉන්නට මම පුරුදු වීමි. කලින් මගේ හම විදින්නට ආ මැස්සනට පවා මම භය වීමි. සමහර විට හොඬ වැලේ තුඩේ ඇනුණු කටුව පිළිබඳ මතක මගේ බියට හේතු වන්නට ඇත. එහෙත් කැළෑවේ ඇති කිසි ම කටුවක් මගේ හමට හානියක් කරන්නට තරම් තියුණු හෝ තද නොවන බව මම කෙමෙන් අවබෝධ කෙළෙමි. මගේ දැඩි හම යුද්ධ ඇඳුමක් ලෙසින් මා ආරක්ෂා කෙළේය. මුල් දවස්වල මම අහම්බෙන් පෑගුණ විසකුරු සර්පයකුට පවා බිය වීමි.

මෙය පළමු වරට සිදු වූ දින සර්පයා මගේ කකුල වෙලාගෙන දෂ්ට කිරීමට උත්සාහ කෙළේය. මගේ දැවැන්ත අලි හදවත භීතියෙන් කම්පා විය. එහෙත් සර්පයා මට කිසි හානියක් කිරීමට අපොහොසත් බව වහා ම මට අවබෝධ විය. ඊට පසු ඉක්මනින් පාරෙන් ඉවත් නොවන සර්පයන් පාගා මරා දැමීම මට විනෝදයක් විය.

තවමත් මා භයට පත් කරන සුලු දේවල් තිබුණේය. රාත්‍රියේදී සිංහයා සහ කොටියා වැනි ලොකු වන සතුන් විසින් පහර දෙනු ලැබීමට මම භය වීමි. සටනෙහි දී මට ඔවුනට වඩා වාසි තිබුණේය. එහෙත් මට සටන් පිළිබඳ පෞද්ගලික අත්දැකීම් නො වී ය. සටනට පොළඹවන සහජ ආශාව ද ප්‍රමාණවත් ලෙසින් මා තුළ නොවී ය. දවල් කාලයේ දී මම දඩයක්කාරයනට – විශේෂයෙන් සුදු මිනිසුන්හට භය වීමි. ඔවුහු සියලුම වනසතුනට වඩා භයානක ය. මම ඔවුන් ගේ උගුල් වලට වත්, මළ පුඩුවලට වත්, බොරු වලවලට වත් බිය නොවීමි. ගිනිගොඩවල් ගැසීමෙන් මා භය කිරීම ද සෝෂා කිරීමෙන් ගාල්වලට පැන්නීම ද පහසු නො වී ය. මට ටිකක් වත් තර්ජනයක් වූයේ හඳුනාගත නොහැකි පරිදි ආවරණය කරන ලද වලවල් ය. ඒ නිසා මම නිතර ම සෝදිසියෙන් පරීක්ෂා කර බලා ගමන් කෙළෙමි.

සැතපුම් කීපයක් ඈතින් පිහිටි ගමක් වුවද මගේ ඉවට දැනෙයි. මම නිතර ම මනුෂ්‍ය වාසයෙන් ඈත් වී

සිටීමට උත්සාහ කෙළෙමි. විවිධ ස්වදේශික ගෝත්‍ර පවා මට ඉවෙන් වෙන් කොට හඳුනාගත හැකි විය. සමහර ගෝත්‍රිකයෝ මට ඉතා අන්තරායකාරී වුහ. සමහරු තරමක් අනතුරුදායක වූහ. සමහරුන් ගෙන් කිසි අනතුරක් නොවී ය.

දවසක් මා සොඬ විදහාගෙන සුළඟ ඉව කරද්දී මට අමුතු ම ඉවක් දැනුනේය. එය වන සතුන් කෙරෙහි එන්නක් දැයි නිශ්චය කිරීම පවා මට අපහසු විය. එය වැඩිපුර ම මිනිස් ගඳකට හුරු විය. මම ඕනෑකමින් විපරම් කෙළෙමි. වනය ගැන දැනගත හැකි හැම තොරතුරක් ම දැන ගැනීමට මම ආසා කෙළෙමි. මට අනතුරු දායක දේවල් ගැන දැනගැනීමට ඕනෑ විය. නැවක් කොම්පාසුව අනුව යන්නාක් මෙන් මම ද අර ඉව අනුව ගියෙමි. එය රාත්‍රියේ ස්වදේශිකයන් තදින් නිදගන්නා වේලාවක් විය. මා ඉදිරියට යන විට ඉව වඩාත් තදින් දැනෙන්නට විය. මම කිසිවෙකුට නොදැනෙන තරම් නිශ්ශබ්දව සෝදිසියෙන් ඉදිරියට ගමන් කෙළෙමි.

එළිය වැටෙන විට මම කැළෑවේ ඉමකට පැමිණියෙමි. මා ඉදිරියට එළිමහන් බිම් කඩක් විය. සනව වැඩුණු අකුලකට මුවා වී මම ඒ දෙස බලා සිටියෙමි. දීප්තියෙන් අඩු සඳේ සුදුමැලි රැස් උල්වූ මුදුන් ඇති පුංචි පැල්පත්මත වැටී තිබුණේය. මධ්‍යම ප්‍රමාණයේ මිනිසකුට වුවද මේ විදියේ පැලක සිටිය හැක්කේ ඇත නියාගෙන පමණකි. සියල්ල නිහඬ ව පැවතුණේය.

බල්ලෙක් වත් බිරුවේ නැත. මම යටි සුළඟ පැත්තෙන් කිට්ටු කෙළෙමි. ළමයින් සෑදූ සෙල්ලම් ගෙවල් වැනි මේ පුංචි පැල්පත්වල කවුරු වාසය කරත් දැයි මම පුදුමයෙන් සිතුවෙමි.

'එක පාරට ම මිනිසකු වැනි පුදුම සතෙක් පොළොවේ ගුලකින් අමාරුවෙන් මතු වී ආවේය. ඔහු නැහි සිට සිහින් හඬින් සිවුරුවම් බෑවේය. එයට පිළිතුරු වශයෙන් තව එකෙක් අත්තකින් බිමට පැන්නේය. තව දෙන්නෙක් ගුහාවකින් මතු වී ආහ. ඔවුහු අඩි පහක් පමණ උස ඇති ලොකු පැලක් ළඟට රැස් වී කිසියම් සාකච්ඡාවක් කළහ. හිරු ගේ පළමු රැස් අහසේ බැබලෙන විට මම පිග්මින් දුටිමි. පිග්මි යනු මේ පුදුම මිනිසුනට ව්‍යවහාර කරන නමයි. ලෝකයේ කුඩා ම මිනිසුන් වූ පිග්මින් ගේ ගමකට මා ඇවිත් ඇති බව මට වැටහුණේය. ඔවුන් ගේ සම දුඹුරු පාටය. හිසකේ රතු පාටට හුරු ය. ඔවුන් ගේ සිරුරු ශෝභනය. එහෙත් අඩි තුනකට හෝ හතරකට වඩා උස නැත. ඇතැම් අයට ඝන වූ ද රැළි වැටුනා වූද රැවුළු ඇත. ඔවුහු උස් හීන් හඬින් – වේගයෙන් කථා කළහ.

'මා භය වූ නමුත් එය කදිම දර්ශනයක් විය. මේ අහුටු මිට්ටන් නිසා මා තුළ ඇති වූ තරමේ භයක් යෝධයන් හමුවීමෙන් වත් මට ඇති නොවේ. ඇත්තෙන් ම සුදු මිනිසකු හමු වුනානම් මීට හොඳයැයි මට සිතුණි. මේ පුංචි පිග්මිවරු අලියා ගේ අති භයානක සතුරෝ ය. ඇතකු වීමට පෙර මම මෙය දැන සිටියෙමි. ඔවුහු

දුන්නෙන් විදීමට ද හෙල්ල දමා ගැසීමට ද අති දක්ෂයහ. ඔවුහු විෂ පෙවූ හී තලවලින් විදිති. ඉන් එකක් වැදීමෙන් ඇතකුට මරණය පවා සිදුවේ. ඔවුහු හොරෙන් පිටුපසින් බඩ ගා අවුත් ඇතා ගේ බල නහරය කැපෙන්නට පිහිය දමා ගසති. ඔවුන් ගේ ගම් වටේට විෂ පෙවූ උල් සිටුවා තබති.

'මම වහාම ආපසු හැරී එද කොටියා පැන්න වෙලාවේ දිවූ තරම් වේගයෙන් දිවුවෙමි. පිග්මින් කෑගසන හඬ ද වේගයෙන් ලුහුබැඳීමක හඬ ද මට ඇසුණි. එළිමහන් බිමක නම් මට පහසුවෙන් ඔවුන් පසු කර දුවන්නට තිබුණි. එහෙත් කැළෑව මැදින් දුවද්දී මට බොහෝ අවහිරවලට මුහුණ දෙන්නට සිදු විය. පිග්මිහු වදුරන් මෙන් කඩිසර වූහ. කටුස්සන් මෙන් පහසුවෙන් ගමන් කළහ. කිසිවෙක් වෙහෙසට පත් නොවූහ. ඔවුහු කිසි අවහිරයක් නොසලකා වේගයෙන් දිවූහ. මට කිට්ටු කළ ඔවුහු හෙල්ල කීපයක් මා වෙත දමා ගැසූහ. එහෙත් ඝන කැළෑව නිසා ඒවා මගේ ඇහේ වැදුණේ නැත. මම හති ලමින් දිවිවෙමි. එහෙත් පිග්මිහු කිසි පැකිළීමක් වත් පසු බැසීමක් වත් නැතිව මා පසු පස එළවා ආහ

'ඇතකු වී ජීවත් වීමත් එතරම් පහසු දෙයක් නොවන බව මේ කටුක අත්දැකීම්වලින් මට තේරුම් ගියේය. ඇතකු වැනි විශාල සහ ශක්තිමත් සතකු ගේ ජීවිතය පවා පැවැත්ම සඳහා ඉස්පාසුවක් නැතිව කෙරෙන සටනකි. ඇතකු අවුරුදු සීයක් හෝ ඊට වැඩි කාලයක් හෝ ජීවත් වීම ඉතා අඩමාන දෙයක් බැව් මට

සිතුණි. ඔවුනට ඇති සියලු කරදර නිසා ඔවුන් මිනිසුන්ටත් කලින් මැරී යන බව සිකුරු ය. එහෙත් ඇතැම් විට කැළයේ සිටින සතුන් මා මෙන් මේවා ගැන කරදරයට පත්වන එකක් නැත. මගේ මිනිස් මොළය මේ කරුණු පමණට වැඩියෙන් ගණන් ගනී. සෑම වේලාවේ ම මරණය මා පසු පස එලවාගෙන එන නිසා ජීවත් වීමට වඩා මැරෙන එක හොඳ යැයි ඇතැම් විට මට සිතුණේය. එහෙත් මා ජීවත් වීමේ බලාපොරොත්තු අත්හැර දැමිය යුතු ද? මා නැවතී මගේ කකුල් දෙකේ වධකයන් ගේ විෂ පෙවූ හෙල්ල සහ ඊතලවලට මුහුණ දිය යුතු ද? එය කරන්නට ඔන්න මෙන්න කියා තිබියදී මගේ අදහස වෙනස් විය. මගේ බලවත් විස්මයට හේතු වන පරිද්දෙන් අලිරංචුවක ඉතා බලවත් ඉවක් මට දැනුනේය. මට අඩු ගණනේ වල් අලින් අතර වත් ආරක්ෂාව සොයාගත හැකි වේවිද?

වනයෙහි ඝන බව ක්‍රමයෙන් තුනී වී එය සවන්නා තණ බිමක් බවට පත් විය. මෙහි අතරින් පතර පිහිටි තනි ගස් නිසා මගේ සතුරන් ගේ ඊ පහරවලින් මම තවමත් ආරක්ෂාව ලබමි.

මම කෙළින් නොදුවා වංගු සහිත ව දිවිවෙමි. පිග්මින්හට කැළැවේ දී තිබූ වාසිය මෙහිදී නොවී ය. උසට වැඩුණු පැළෑටි සහ තණකොළ මට බාධාවක් නොවූ අතර ඔවුනට ඒවායින් බේරී දිවීම අපහසු විය. තව ම අලි රංචුව පේන තෙක් මානයක නැති වුවත් උන් ගේ ඉව නම් වැඩිවෙමින් දැනුණි.

උගුල් වල අසුවූ ඇතුන් ගැඹුරු වලවල්වල වැටී සිටින සැටි අතර මග දී මම දුටිමි. උන්ගේ පෙනුම වැල්ලේ ලැග සිටින කිකිළියන් බඳු විය. වරින් වර අලි බෙටි ගොඩවල් ද හමු විය. ඈත රුක් ගොමු අතරේ විශාල අලි රංචුව දිස් විය. උන් ගෙන් සමහරු බිම ලැග සිටි අතර සමහරු නැගිට හොඬෙන් ගස්වල අතු සලමින් සිටියහ. සමහරු ගහේ වැතිර සිටියහ. මා යටි සුළඟින් දුව ආ නිසා ඇතුනට මගේ ඉව නො දැනුණේය. මගේ අඩි ශබ්දය ඇසුණු විට අනතුරක් පිළිබඳ හැඟීමක් උන් අතර පැතිර ගියේය. ඊට පසු ඇති වූ කලබැගෑනිය ඔබට සිතා ගන්නටවත් බැරිය. ඇත්තු නොසන්සුන් ලෙස කුංචනාද කරමින් ගං ඉවුරට රොක් වූහ. නායක ඇතා සිරිත් පරිදි රංචුවට ආරක්ෂාව දීම පසෙක තබා දුව ගොස් ගහට පැන අනෙක් ඉවුර බලා පීනන්නට පටන් ගත්තේය. ඇතින්නෝ පැටවුනට ආරක්ෂාව සැලසීමට උත්සාහ කළහ. රංචුවේ පසු භාගය ආරක්ෂා කිරීමත් ඇතින්නට භාර විය. මාගේ හදිසි පැමිණීම නිසා උන් බියපත් වීද නැතහොත් මගේ පළායාමට හේතු වූ කාරණයටත් වඩා බියකරු අනතුරක් ඉව වැටීම උන් ගේ වියරු පළායාමට හේතු වී දැයි මට කිව නොහැක.

මම දියට පැන්නෙමි. පුළුවන් වැර යොද ඇතින්නන් හුහ දෙනකුට ඉස්සර වීමි. මා ලුහුබැඳ එන බියකරු අහුවූ මිට්ටනුත් මාත් අතර අලි රංචුව සිටින සේ උන්ට ඉස්සර වීමට මම හැකි තරම් වෙර දැරීමි. එහෙත් ඇතින්නන් හැර අනෙක් හැම දෙනා ම එසේ කිරීමට වෙර දරන බව මට පැහැදිලි විය. පිඟමින් ගහ

වෙත දුව එනු මට ඇසිණ. ඔවුන් ගේ හඬ ඇතුන් ගේ කෑංචා නාදය සමග මුසු විණ. කිසියම් භයානක දෙයක් සිදු වන බව දැනුණි. නමුත් එය කුමක් දැයි බැලීමට මම බිය වීමි. ගහෙන් එතෙර වූ මම එළිමහන් බිම හරහා හැකි තාක් වේගයෙන් දිවීමි. කුරු මිනිසුන් සහ දැවැන්ත තිරිසනුන් අතර ගහෙහි වූ සටන කෙසේ කෙළවර වී දැයි මම නොදනිමි.

අලි රංචුවත් සමග මම බොහෝ වේලා දිවීමි. මා බොහෝ වෙහෙසට පත් ව සිටි නිසා ඔවුන් සමඟ දිවීම දුෂ්කර විය. එහෙත් ඔවුනට පසු නොවීමට මම අධිෂ්ඨාන කරගතිමි. ඇත්තු මාත් උන්ගේ රංචුවට ඇතුළත් කරගන්නට කැමති වුවහොත් මගේ ආරක්ෂාව සහතික වනු ඇත. ඔවුහු මට වඩා හොඳින් මේ ප්‍රදේශයේ තත්ත්වයත් ඔවුන් ගේ සතුරන් පිළිබඳ තොරතුරුත් දනිති.

11

අලි රංචුව සමග

බොහෝ දුරක් ගිය පසු නායක ඇතා නතර විය. ඌ අනුව සෙස්සෝ ද නතර වූහ. අපි සියලු දෙනා ම ආපසු හැරී බැලුවෙමු. ලුහුබැඳීම ඉවර ය. අපට කිට්ටුවෙන් ම දුවගෙන එන්නට හැකි වූයේ පැටවුන් දෙදෙනකුට සහ එක ඇතින්නකට පමණකි.

රැළෙන් මහ හැරුණු අන්තිමයාත් පැමිණෙන තුරු ඔවිහු නිශ්ශබ්ද ව සිටියහ. ඔවුන් මා සිටින බව වත් ගණනකට නොගත් බව පෙනුණි. ටික වේලාවකට පසු උන් ගෙන් එකෙක් දෙන්නෙක් මා ළඟට පැමිණ හොඬ මා දෙසට හරවා ඉව ඇල්ලූහ. ඔවිහු මා දෙස බලමින් ඇවිද්දහ. මගෙන් කිසිවක් අසන්නාක් මෙන් සිහින් ශබ්ද කළහ. එහෙත් මට ඒවාට පිළිතුරු දිය නොහැකි විය. ඔවුන් කළ ශබ්ද මා ගැන කැමැත්තෙන් කළ ඒවා ද අකමැත්තෙන් කළ ඒවා දැයි කියාවත් මට තේරුම් ගත නොහැකි විය.

'සියල්ලට ම වඩා මා භය වූයේ නායක ඇතාට ය. වැග්නර් ශල්‍යකර්මය කිරීමට පෙර මාද නායක ඇතකු වී සිටි බව මම දැන සිටියෙමි. මේ ඒ රංචුව ම නම් අලුත් නායක ඇතා නායකත්වය ගැන ආරාවුල් කරන්නට පටන් ගත්තොත්? මා ළඟට ම ආ විශාල වූ ද ශක්තිමත් වූද නායක ඇතා ගේ දළ බැරි වීමකින් මෙන් මගේ ඇහේ වැදුණු විට මම අතිශයින් ම බියට පත් වීමි. එහෙත් මම යටහත් පහත් ව සිටියෙමි. දෙවන වර ද ඌ මට සටනට අභියෝග කරන්නාක් මෙන් දළ ඇහේ හැප්පී ය. මම එය ගණන් නොගෙන පැත්තකට වීමි. ඊට පසු ඇතා හොඬ වැල රවුමට අකුළා එය කටේ ඔබා තොල්වලින් යම්තම් තද කර ගත්තේය. මෙය ඇතුන් භය හෝ පුදුමය පළ කරන ක්‍රමය බව මම පසුව දැනගකිමි. නායක ඇතාට මගේ යටහත් පහත් කම වටහා ගත නොහැකි විය. මා කෙරේ කෙසේ හැසිරිය යුතු දැයි ඔහුට සිතාගන්නට බැරි විය. ඇතුන් ගේ භාෂාව නොදත් මම ද, මේ මට සුබ පතන සැටි යැයි සිතා එසේ ම හොඬ වැල අකුළා කටේ ඔබා ගතිමි. ඇතා හීන් හඬක් නගා පසෙකට විය.

'සෑම අලි ශබ්දයක් ම මම ක්‍රමයෙන් තේරුම් ගැනීමට පුරුදු වීමි. 'ගුරු ගුරු' ගාන සිහින් හඬ සහ සිහින් 'කෑස්' ගාන හඬ යන දෙක ම සතුට පළ කිරීමට යි. මහ ගිගුරුම් හඬකින් භය ප්‍රකාශ වෙයි. ඒ හඬ ම කෙටි වී නම් හදිසියේ බිය පත් වීමකි. මා මුලින් ම රංචුවට ආ විට ඇතුන් නැගුවේ එවැනි ශබ්දයකි. තුවාල වූ විටත් වේදනාවක් ඇති වූ විටත් උගුරෙන් ගැඹුරු

හඬක් නහත්. ගං ඉවුරේ දී පසු වූ එක් ඇතෙක් පිග්මින් ගෙන් පහර කා මෙබඳු හඬක් නැහුවේය. සමහර විට ඔහුට විෂ පෙවූ හීයකින් මරණීය තුවාල සිදු වෙන්නට ඇත. සතුරාට පහර දෙන විට යටි උගුරෙන් තියුණු හඬක් නහත්. ප්‍රධාන හැඟීම් පළ කිරීමට අලි භාෂාවේ තිබෙන මූලික වචන කීපයක් පමණි මා කීවේ. එහෙත් මේ වචනවල තවත් බොහෝ ප්‍රභේද ඇත.

'මා සාමාන්‍ය ඇතකු නොවන බව දැනගෙන ඇතුන් මා රැළෙන් පන්නා දමාවි යැයි මම බොහෝ භය වීම්. සමහර විට මගේ යම් කිසි අඩු පාඩුවක් ඇති බව ඔවුනට තේරුම් යන්නට ඇත. මා ගැන සානුකම්පික හැඟීමක් උන් ගේ සිතේ පහළ වූ බව පෙනුණි. මොළය එතරම් හොඳ නැති එහෙත් කාට වත් හිංසාවක් නැති බාලයකුට මෙන් ඔව්හු මට සැලකුහ.

'මම බොහෝ දුරට ඒකාකාර ජීවිතයක් ගත කෙළෙම්. අපි හැම තැන ම පේළියට ගමන් කෙළෙමු. උදේ දහයටත් එකොළහටත් අතර සිට සවස තුන පමණ වන තුරු අපි ගිමන් හැරියෙමු. ඊට පසු අපි ආහාර සොයා ගියෙමු. රාත්‍රියේ පැය කීපයක් විවේක ගත්තෙමු. අලි රංචුව බිම ලැග සිටින විට එකෙක් මුර කෙළේය.

'කෙසේ වුවත් මගේ ජීවිතයේ ඉතිරි කාලය අලි රංචුවේ ම ගත කිරීමට සිදු වීම ගැන හිත හදාගන්නට මට බැරි විය. මම මිනිසුනට බොහෝ ආසා කෙළෙම්. මා පෙනුමට ඇතකු වුවත් සාමාන්‍ය මිනිසුන් අතර සන්සුන් ලෙස නිදහසේ ජීවත් වීමට මම වඩා කැමති

වීම්. මට පහසුවෙන් සුදු මිනිසුන් කරා යන්නට තිබුණි. එහෙත් ඔවුන් දළ ලබාගැනීමට මා මරා දමනු ඇතැයි මම බිය වීම්. මිනිසුනට වටිනාකමක් නොපෙනෙනු සඳහා දළ දෙක පලුදු කර ගැනීමට මම බොහෝ වෑයම් කෙළෙම්. එහෙත් එය සපල වූයේ නැත. එක්කෝ ඇත් දළ නොකැඩෙන සුලු ය. නැත්නම් ඒවාට හානි කරන ආකාරය මා දැන සිටියේ නැත. මෙසේ මම මාසයක් පමණ අලි රංචුව සමඟ ඉබාගාතේ ගියෙමි.

එක දවසක් අප එලිමහන් පෙදෙසක තණ කමින් සිටියෙමු. තෙරක් නොපෙනෙන සවන්නා තණ බිම සෑම අතට ම විහිදී තිබුනි. මම රංචුව මුර කෙළෙමි. එය හඳ නැති තරු එළිය සහිත රැයක් විය. අලි රංචුව බොහෝ දුර නිහඬ ව සිටියහ. රාත්‍රී කාලීන ගඳ සුවඳ හොඳින් ඉව කිරීම සඳහා මම ටිකක් ඈතට ගියෙමි. එහෙත් මට දැනුණේ නොයෙක් වර්ග වල තණ කොළ, කුඩා උරගයන් සහ අනතුරු දයක නැති පුංචි සතුන් පිළිබඳ ඉව පමණකි. හදිසියෙන් ම ඇතින් ලොකු එළියක් දිස්විය. මොහොතකින් එය නැති වී යළිත් ගිනි දැල් විහිදුවමින් ඇවිළෙන්නට පටන් ගත්තේය. ස්වල්ප වේලාවක් ගත විය. පළමු ගිනි දැල්ලට වම් පැත්තෙන් තව එලියක් දිස් විය. ටිකක් ඇතින් තුන් වැනි එලියක් ද හතර වැන්නක් ද පෙනෙන්නට විය. ඒවා මහ පාර දිගට දල්වා ඇති ලාම්පු මෙන් සම දුරින් පේලියට දැල්වුණේය. එවිට අනෙක් පැත්තෙන් ද එබඳු ම එලි පෙළක් දැල්වෙන බව පෙනුණේය. අපි ගිනි වැටවල් දෙකට මැදි වී සිටියෙමු. තව ටික වේලාවකින් මේ

වැටවල් දෙක අතර වූ මහ පාරේ එක් පැත්තක දඩයක්කාරයන් වෙඩි තියන්නටත් කෑගසන්නටත් පටන් ගන්නවා ඇත. දඩයක්කාරයනට අප මරා ගන්නට ඕනෑ නම් ලොකු බොරුවලවලුත් පණ පිටින් අල්ලා ගන්නට ඕනෑ නම් ලොකු ලී කොටවලින් තනන ගාලුත් අනේක් පැත්තේ සාදා ඇත. අප වලවල්වල වැටුනොත් අපේ කකුල් කැඩී මරා දැමීමට මිසක් වෙන දෙයකට සුදුසු නොවෙනවා ඇත. ගාල්වලට අසු වුණොත් අපට සදකාලික වහලුන් වීමට සිදු වෙනවා ඇත. ඇත්තු ගින්දරට බය ය. සෝෂාවෙන් තැති ගනිති. ඒ නිසා සොෂාවත් ගින්නත් නැති දිසාවකට දිව යති. එහි මරණය හෝ සදකාලික වහල් බව හෝ උන් පිළිගන්නට සැරසී සිටී.

'මුළු අලි රංචුවෙන් ම මේ කරුණු දැන සිටියේ මා පමණකි. නමුත් එසේ දැන සිටීම මට වාසියක් ද? මා කුමක් කළ යුතු ද? මා ගින්දර දෙසට යා යුතු ද? ගියොත් එහි දී මට ආයුධ ගත් මිනිසුන් හමු වනු ඇත. සමහර විට මා ඔවුන් ගෙන් බේරී යාමට තරම් වාසනාවන්ත වෙන්නට පුළුවන. එහෙත් එවිට මට රංචුවෙන් වෙන් වූ තනි අලියකු ගේ ජීවිතය ගත කරන්නට සිදුවේ. ඉකිමනින් හෝ පමා වී හෝ වෙඩි උණ්ඩයකට – විෂ පෙවූ හී තලයකට නොහොත් රුදුරු වනසතකු ගේ දත්වලට ගොදුරු වී මැරෙන්නට මට සිදු වනු ඇත.

'කුමන තීරණයක් ගනිම් දැයි මම දෙගිඩියාවෙන් සිටියෙමි. එහෙත් හැඟීමක් නැතිව ම මා එක් පියවරක්

ගෙන තිබුණේය. කුලප්පු වී පලා යන අලි රංචුවේ තදබදයට අසු වී එදෙසට ඇදී නොයාම පිණිස මම රංචුවෙන් ටිකක් ඈතට වී සිටියෙමි.

දැන් දඩයක්කාරයෝ කෑ ගසමින්, බෙර වයමින්, කස පුපුරුවමින්, තලා පිඹිමින් සහ වෙඩි තබමින් මහ සෝෂාවක් කරති. ඇත්තු කුලප්පු වී එහෙ මෙහෙ දුව පනිමින් හඬ නඟන්නට වූහ. දඩයක්කාරයන් ගේ සෝෂාව ටිකින් ටික කිට්ටුවට ආවේ ය. ගිනි වැටවල් දෙක ද ටික ටික එකිනෙකට කිට්ටු විය. අපට දුව පනින්නට ඇති ඉඩ කඩ වඩ වඩා පටු විය. ඇත්තු කෑංචා නාදය නවතා එක් අතකට දිවුවෝය. එහෙත් දඩයක්කාරයන් වඩාත් තදින් සෝෂා කරන්නට වූ කළ ඔවුහු අනෙක් අතට දිව්වෝය... මරණය තව ම ඉතා කිට්ටු නැති බව සැබෑය. දඩයම දවස් ගණනක් තිස්සේ කෙරෙනවා ඇත. එවිට ඇතුනට බොරුවලවල් සහ ගාල් කරා යාමට සිදුවීම නොවැළැක්විය හැකි ය.

එහෙත් මම ඇතුන් සමඟ නොගොස් තනිව ම නැවතුණෙමි. අලි රංචුව සන්ත්‍රාසයෙන් උමතු කළ භයානකත්වය මගේ ඇත් නහර දිගේ පැතිර ගොස් මගේ මිනිස් මොළයට ද කා වැදුනේය. භය මගේ සිහි නුවණ සම්පූර්ණයෙන් වසා ගත්තේ ය. මම රංචුව පස්සේ දුවන්නට ම සැරසුණෙමි. එහෙත් මම මගේ ඇත් භය මැඩ පැවැත්විය යුතුය. මා විනාශය කරා ඇදගෙන යන්නට තැත් කරන මස් ලේ සහ ඇටවලින් පිරුණු මේ දැවැන්ත ශරීරය ජය ගත යුතුය.

'හිතුවක්කාර' ලොරි රියදුරෙකු මෙන් ක්‍රියා කරමින් මම මගේ මොළය නැමති සුක්කානම් රෝදය කරකවා 'ලොරිය' ගහට ඇල්ලුවෙමි. ජලය මහ හඬින් කැලති මල් වෙඩිල්ලක් මෙන් දිය පහරවල් අහසට විහිදී ගොස් නිසල විය. ශීතල ජලය මගේ කකියන ඇත් ලේ සිසිල් කෙළේය. දැන් මගේ ඇත් පාද බුද්ධියේ 'තෝන් ලනුවෙන්' පාලනය කෙරේ. ඒවා කීකරු ලෙස දැන් ගහ පත්ලේ ඔබ මොබ යයි.

'මට හිපපොටේමසකු මෙන් සම්පූර්ණයෙන් වතුරේ ගිලෙන්නට සිත් විය. මේ සාමාන්‍ය ඇතකු නම් කවදුවත් කරන්නට නොසිතන දෙයකි. එසේ දියේ ගිලුණු මට හොඬ අගින් හුස්ම ගත හැකි ය. මම එසේ කෙළෙමි. එහෙත් වතුර නිසා ඇස්වලටත් කන්වලටත් අපහසුවක් දැනුනේය. මම හිස ඔසොවා කන් දුනිමි. දඩයක්කාරයන් තවත් කිට්ටුවට ඇවිත් ය. මම යළිත් දියේ ගිලුනෙමි. දඩයක්කාරයෝ මා ගැන නොදැන එතැන පසු කර ගියහ.

'පසුගිය ටික කාලය තුළ මට විඳ දරාගත නොහැකි තරම් භය සහ කරදර ඇති වී තිබේ. ඒ නිසා මොනවා වුවත් දඩයක්කාරයනට අසු නොවන්නට මම සිතා ගතිමි. මම කිසියම් කම්හලක් හමුවනතුරු කොංගෝ ගහ පහළට පීනන්නට සිතාගතිමි. ස්ටැන්ලි පූල් සහ බොන් නුවරවල් අතර එබඳු කම්හල් කිපයක් ඇත. මම ගොවිපලකට හෝ කම්හලකට ගොස් මා වල් අලියෙකු නොවන බව මිනිසුනට පෙන්වීමට මට කළ හැකි සෑම දේ ම කරමි. මා පුරුදු ඇතකු බව ඔවුනට පෙන්නූ කල ඔවුන් මා මරා දමන හෝ ඵලවන එකක් නැත.

12

අලියා අලි මරුවනට මෙහෙ කරයි.

මම ඉක්මනින් ම කොංගෝ ගඟේ ප්‍රධාන හැඩ පාර අල්ලාගෙන පහළට පීනන්නට පටන් ගතිමි. දවල් කාලයේ ඉවුරට කිට්ටුවෙන් පීනුවෙමි. එහෙත් රාත්‍රියේ දී ගඟ මැදට ගොස් හැඩ පාරේ පාවුනෙමි. ගඟේ මේ කොටසේ නැව් යාත්‍රා කළ හැක. වනචාරී ගෝත්‍රිකයෝ ගං ඉවුරට එන්නට බය ය. ඒ නිසා මගේ ගමන ආරක්ෂා සහිත විය. මම මාසයක් පමණ මෙසේ පීනුවෙමි. මේ මාසය තුළ මට සිංහයකු ගේ ගර්ජනාව ඇසුණේ එක් වරක් පමණ ය. වරක් මම හිපපොටේමසකු සමග ඉතා අප්‍රිය ජනක හමුවීමකට – නැහැ – ඝට්ටනයකට මුහුණ පෑවෙමි. එය සිදු වූයේ රාත්‍රී කාලයේ ය. ඌ නාස් පුඩු විතරක් උඩ තියාගෙන ගඟ දියෙහි පා වෙවී සිටියේය. මම පිනද්දී ඌ ඉන්නා බව නොදැන නැවක් හිම කන්දක හැපෙන්නාක් මෙන් මේ අශෝභන සත්තා ගේ ඇහේ හැපුනෙමි. හිපපොටේමසා දිය යට ගොස් උගේ මොට්ට හොම්බෙන් මගේ බඩට ඇන්නේය. මට බලවත්

වේදනාවක් දැනුණි. මම ඉක්මනින් ඇතට පීනුවෙමි. හිපපොටේමසා දිය මතු පිටට විත් පිඹිමින් මා පසු පස එළවා ආවේය. එහෙත් මට ඌ පසු කර යාමට හැකි විය.

'මම අනතුරක් නැතිව 'ලුකුන්හි' නගරය තෙක් පීනුවෙමි. එහි ලොකු බෙල්ජියම් කර්මාන්ත ශාලාවක් තිබේ. මුදුනේ ලෙලදුන් කොඩියෙන් මම එය හඳුනා ගතිමි. රාත්‍රියේ මම ගහෙන් එගොඩ වී කැළෑවට වැදුණෙමි. අද පාන්දර ම කැළෑවෙන් පිට වී ආචාර කරන්නාක් මෙන් හිස සලමින් ගෙයක් දෙසට ගියෙමි. හිස සැලීමෙන් වැඩක් නො වීය. ලොකු මුර බල්ලෝ දෙන්නෙක් රෞද්‍ර ලෙස බුරමින් මා වෙත කඩා පැන්නාහ. සුදු කමිසයක් ඇඳගත් මිනිහෙක් ගෙයින් පිටට අවුත් මා දුටු වහාම යළිත් ගේ ඇතුළට ගියේය. නීග්‍රෝ මිනිස්සු කීප දෙනෙක් කෑ ගසමින් මිදුල හරහා දුව ගොස් ගෙතුළට වැදුණහ. ඊට පසු රයිපල් වෙඩි ශබ්ද දෙකක් ඇසුණේය. මා තුන් වැන්න ඇසෙන තෙක් බලා නොසිට ආපසු හැරී දුවගෙන ගොස් කැළෑවට වැදුනෙමි.

'එද රෑ මම 'තුනීමතේ' ගස් පිහිටි කැළෑවක හෙමිහිට ගමන් කෙළෙමි. මධ්‍යම අප්‍රිකාවේ මෙබඳු කැළෑ සුලභ ය. එහි ගහ කොළ අඳුරු නිල් පාට ය. බිම මඩ සහිත ය. තද වැස්සකින් පසු රාත්‍රිය ශීතල ය. සැහැල්ලු සුළඟක් හැමී ය. අනෙක් ඇතුනට මෙන් ම මට ද තෙත් ගතිය එතරම් රුචි නොවේ. වහින විට හෝ

වටාපිටාව තෙත්ව ඇති විට සිරුර උණුසුම් වීම සඳහා ඇවිදීම මගේ සිරිත ය.

'මා හෙමින් හෙමින් පැය කීපයක් ගමන් කළ පසු මට ඈත වාඩියක ගිනි මැලයක් දිස් විය. මා හිටියේ බොහෝ දුරට කැළෑ බද පෙදෙසක ය. එක ම නිග්‍රෝ ගමක් වත් කිට්ටුවක තිබුණේ නැත. ගිනි මැලය දල්වන ලද්දේ කවුරුන් විසින් දැයි සිතමින් මම ගමන් වේගය ටිකක් වැඩි කෙළෙමි. කැළෑව අවසාන විය. මා ඉදිරියේ මිටි තණ පඳුරු සහිත සවන්නා තණ බිම් ය. මේ හරියේ ළඟදී ලැව් ගින්නක් හටගන්නට ඇත. ගින්නෙන් පසු තණ පඳුරු තව ම ඒවායේ නියම උසට වැඩී නැත. කැළෑවෙන් සැතපුම් බාගයක් පමණ ඔබ්බෙහි ගරා වැටුණු පරණ පැල්පතක් විය. එහි පසෙක ගිනි මැලයක් දල්වා තිබුණේය. ගිනි මැලය ළඟ මිනිස්සු දෙදෙනෙක් වූහ. ඔවුන් යුරෝපියන් ලෙස පෙනුණි. ඉන් එකෙක් ගිනි මැලයට උඩින් එල්ලන ලද තාවිච්චියක වූ කෑම හැඳිගාමින් සිටියේය. කඩවසම් සිරුරක් ඇති තුන් වැන්නෙක් – ඔහු උඩු කය නිරුවත් වූ ස්වදේශිකයෙකි. ගින්නට නුදුරින් ලෝකඩ පිළිමයක් මෙන් නැගිට සිටියේය.

'මම මිනිසුන් දෙස ඇස් යොමු කරගෙන හෙමින් හෙමින් ගිනි මැලය දිහාවට ගියෙමි. ඔවුන් මා දුටු හැටියේ මම හීලෑ ඇතකු පිට උඩ බඩු පැටවීමේදී කරන්නාක් මෙන් දන ගැසුවෙමි. හෙල්මට් තොප්පියක් දමාගෙන සිටි පුංචි මිනිහා රයිපලයක් ඇද වෙඩි

තියන්නට සැරසුණේය. එවිට ම ස්වදේශිකයා කැඩිච්ච ඉංගිරිසියෙන් මෙසේ කෑ ගසන්නට පටන් ගත්තේය. 'වෙඩි තියන්න එපා... බානා[1] උෆ හොඳ හීලෑ ඇතෙක්.' මෙසේ කියමින් ඔහු මා දෙසට දුව ආවිය.

'අහකට පලයන්. නැත්නම් උඹේ ඔළුව හිල් කරනවා. ඒයි උඹ – මොකක්ද උඹේ නම' සුදු මිනිහා කුරුමානම ගනිමින් කෑ ගැවේය. ස්වදේශිකයා අහකට නොගොස් 'මි–පෙ–පෝ' යි උත්තර දුන්නේය. ඔහු වෙඩි උංඩයෙන් මා ආරක්ෂා කරන්නට මෙන් මට තවත් කිට්ටු විය.

'බානාට පේන්නෙ නැද්ද? උෆ හීලෑ එකෙක්.' ඔහු මගේ හොඬ වැල අත ගාමින් කීවේ ය.

'අහකට පලයන් වදුරා' රයිපලය ගත් සුද්ද මොර දුන්නේය. 'මම උෆට වෙඩි තියනවා – එකයි... දෙකයි –'

'බකලා නවත්තපන් වෙඩිල්ල.' අනෙක් සුදු මිනිහා කීවේය. ඔහු උස හින්දැරි අයෙකි.

'මි–පෙ–පෝ හරි. අපි දැන් ඕනෑ තරම් ඇත් දළ එකතු කරගෙන තියෙනවා. ඒවා මතාඩි නුවර තරම් ඇතට ගෙනියන එක ලේසි වැඩක් නොවෙයි. පොඩි වියදමකින් ඒක කරන්න බෑ. මේ ඇතා හීලෑ එකෙක් බව ඇත්ත. උගෙ හාම්පුතා කවුරු වුවත් උෆ මේ රෑ කොයි විටියට ආවත් අපට කමක් නෑ. අපිට උගෙන්

1 මහත්තයා

ලොකු ප්‍රයෝජනයක් ගන්න පුළුවනි. ඇතෙකුට ටොන් එකක බර ඔසවන්න පුළුවන්. එතරම් බරක් ගෙන වැඩි දුර යන්න අමාරු වුවත් අපි කියමු ටොන් බාගයක් කියල, කොහොමටවත් බර ගෙන යන්නත් තිහ හතළිහකගේ වැඩ එක ඇතෙකුට කරන්න පුළුවන්. බලපන් අපට පැන්සයක් වත් වියදම් වෙන්නෙ නෑ. වැඩේ ඉවර වුණාට පස්සේ ඌ මරල මේ වටිනා දළ දෙකත් අපේ බඩු ගොඩට එකතු කරගන්න පුළුවන්. තේරුණාද?

'බකලා කීප වරක් ඉලක්කය ගන්නට තැත් කරමින් නොඉවසිලිමත් ව අසාගෙන සිටියේය. ඔහු ගේ සහකාරයා ඇතා ගෙන් වැඩේ ගැනීමේ ලේසිය සහ බඩු ගෙන යන්නත් කුලියට ගැනීමේ දී දරන්නට වෙන වියදම ගැන පැහැදිලි කළ විට ඔහු එකඟ වී රයිපලය පහත දැම්මේය.

'ඒයි, උඹ, මොකක් ද උඹේ නම' ඔහු ස්වදේශිකයාට යටි ගිරියෙන් කෑ ගැසී ය.'

'ම්-පෙ-පෝ' යි පුරුදු පිළිතුර ලැබුණි. බකලා ස්වදේශිකයා අමතන සෑම විටක ම පුරුද්දක් වශයෙන් ඒ වචන ම පාවිච්චි කරන බවත් ම්-පෙ-පෝ ට තම නම උච්චාරණය කිරීමට අමාරු නිසා 'ම්' යන්න බරකොට කියන බවත් මම පසුව තේරුම් ගතිමි.

'මෙහෙ වරෙන් - ඇතා මෙහාට ගනින්.'

'ම්-පෙ-පෝ කළ සංඥාවට අනුව මම කැමැත්තෙන් ම ගිනි මැලය පැත්තට ගියෙමි.

'අපි මොකක් ද ඌට කියන නම? 'කට්ටියා' කියමු. හොඳ නේද කොක්ස්? මූ හාම්පුතා ගෙන් කට්ටි පැනල ආපු එකෙක්.'

මම කොක්ස් දිහා බැලීම්. ඔහු ගේ කැපී පෙනුණ පාට නිල් ය. ඔහුගේ නාසය අමතක නොවන සුලු එකකි. එය නිල් පාටින් සායම් කළ එකක් වැනි ය. ඔහු තම නිල් පාටට හුරු ශරීරය මත කර ඇරපු සායම ගිය නිල් කමිසයක් ඇඳ සිටියේය. කමිස අත් වැලමිට දක්වා හකුලා තිබුණි. ඔහු ගේ ගොරෝසු කට හඬත් රකාර බහුල ගොත ගසන කථා ලීලාවත් නිලට හුරු යයි මට සිතුණි. නිල් කමිසයේ සායම අඩු වී තිබුණාක් මෙන් ම බැරෑඬි කට හඬේ ද ශක්තිය අඩු වී තිබුණි.

'බොහොම හරි, අපි ඌට 'කට්ටියා' කියමු.' ඔහු බකලා ගේ අදහස අනුමත කෙළේය.

ගිනි ගොඩ ළඟ කඩමාලු පොට්ටනියක් සෙලවුණේය. එයින් ඉතා පහත් හඬින් ශබ්දයක් පිට විය. 'ආ උඹ තාම පණ පිටින් ඉන්නවද? මම හිතුවා උඹ මළයි කියල.' බකලා නොසැලකිලි ලෙස කඩමාලු පොට්ටනියට කී ය.

'පොට්ටනිය යළින් සෙලවුණේය. ඉන් ලොකු අතක් පසෙකට දික් වුණේය. ලොකු කඩවසම් මිනිහෙක් ඉදගත්තේය. බිම ගසාගත් අත් දෙකේ ආධාරයෙන් සිටි ඔහු ගේ කඳ ටිකක් දෙපැත්තට වැනුණේය. රතු පාටට හුරු රැවුල බොකුටු වී තිබුණේය. මළ මිණියක මෙන්

සුදුමැලි වූ මුහුණ නිසා ඔහු තද බල ලෙස ලෙඩින් සිටි බව පැහැදිලි විය. සිය අඳුරු ඇස් මා වෙත යොමු කළ ඔහු සිනා සුණේය.

'පාදඩයෝ තුන් දෙනාට තව එකෙක් එක් වෙලා යි ඔහු කීය. 'සුදු හම – කළු ආත්මය. කළු හම – සුදු ආත්මය අවංක මිනිහා එක්කෙනයි – ඌ බකුබාවෙක් මෙසේ කී ඔහු යළිත් අසරණ ලෙස බිම පෙරළුනේය.

'ඌ තාමත් විකාරෙන් දෙඩවනවා' බකලා කීය.

'උගේ විකාරෙ අපට නින්ද කරන එක යි.' කොක්ස් කීය. 'ඌ කියන්නෙ තේරවිලි – එක අවංක මිනිහලු. ඌ බකුබාවෙක් ලු. මි-පෙ-පෝ ගෝත්‍රයේ එකෙක්. උගෙ දත් ඒකට සාක්කි යි. උඩු ඇන්දේ ඉස්සරහ දත් දෙක ගලවා දල. ඒක බකුවා සිරිත. එතකොට ඌ විතරයි අවංක මිනිහා! අපි ඔක්කොම තක්කඩි – බ්‍රවුනුත් ඇතුළුව. උගෙ හම අපටත් වැඩිය සුදුයි. ආත්මය අපටත් වැඩිය කළු වෙන්න ඕනෑ. බ්‍රවුන්, උඹත් තක්කඩියෙක් යකෝ.' බකලා කී ය.

ඒත් බ්‍රවුන් කතා කෙළේ නැත.

'ඌට ආයෙ සිහිය නැහැ.'

'ඌ මැරෙනව නම් ඒක වැඩියමත් හොඳයි. උගෙන් දැන් අපට වැඩක් නෑ. ඌ අපට අවහිරයක් විතරයි.' බකලා පහත් හඬින් කීය.

'ඒත් සනීප වුණොත් බ්‍රවුන් අපි දෙන්නෙකුට වැඩිය වටිනවා.' කොක්ස් කීය.

'ඒක මහ ණයක් බං – ලොකු වන්දියක්. උඹට තේරෙන්නෙ නැද්ද වැඩි එකා ඌ බව?'

බ්‍රවුන් අසිහියෙන් ම මොනවා දෝ කොදුලේ ය. සාකච්ඡාව නිම විය.

'ඒයි උඹේ නම මොකක්ද?'

'මි–පෙ–පෝ'

'මි–පෙ–පෝ ඇතාට විලංගු දල ගහක බැඳපන්. ඌ පැනල යන්න බැරි වෙන්න.'

'නෑ ඌ යන්නෙ නෑ.' මි–පෙ–පෝ මගේ කකුල අතගාමින් උත්තර දුන්නේය.

'පසුද උදේ මම මගේ අලුත් ස්වාමීන් දෙස හොඳ හැටි බැලුවෙමි; හැමට ම වඩා මා කැමති වූයේ මි–පෙ–පෝ ට ය. ඔහු නිතර ම සතුටින් සහ සිනා මුහුණින් සිටියේය. ඉස්සරහ දත් දෙක නැති නිසා මදක් විරූපී වුවත් ඔහු ගේ දත් සුදු පාටින් දිලිසුණේය. මි–පෙ–පෝ ඇතුනට බොහෝ කැමති එකෙකි. ඔහු මා හොඳ සැළකිල්ලෙන් බලාගත්තේ ය. මා හොඳට අතුල්ලා නැවිවේය. ඔහු විශේෂයෙන් මා උදෙසා ම සොයාගත් රසවත් පලතුරු සහ ගඩා ගෙඩි වර්ග ගෙනවුත් මට කෑගි කෙළේය.

බ්‍රවුන් තවමත් ලෙඩෙකි. ඒ නිසා ඔහු මෝන විදියේ කෙනෙකු දැයි මට තවමත් හරි හැටි දැන ගත්නට බැරි විය. ඔහුගේ මුහුණ මගේ සිත් ගත්තේ ය. තමා ගේ සගයනට ඔහු කෙළින් කථා කරන හැටි ද මගේ සිත් ගත්තේය. එහෙත් බකලා සහ කොක්ස් ගැන මගේ හිතේ බලවත් නොකැමැත්තක් විය. විශේෂයෙන් ඉරි ගිය කිළුටු ඇඳුම් ඇඳ සිටින බකලා ගැන ඉතා පුදුම අප්‍රිය හැඟීමක් මා තුළ විය. මේ ඇඳුම් ඉතා හොඳ රෙදිවලින් හොඳින් කපා මහන ලද පොහොසත් දේශ සංචාරකයකුට පමණක් තිබිය හැකි ඒවා ය. බකලා ගේ ඇඳුම් මෙන් ම කුඩාරම ද කිසියම් වංක ක්‍රමයකින් ඔහු විසින් ලබාගත් එකකැයි මම සිතුවෙමි. සමහර විට ඒවා ප්‍රසිද්ධ බ්‍රිතාන්‍ය දේශ ගවේශකයකු ගෙන් සොරකම් කර පසුව ඔහු මරා දමන්නට ඇත. අගනා රයිපලය ද ඉංගිරිසිකාරයකුට අයිති ව තිබුණු එකක් විය යුතු ය. එපමණක් නොව ඔහු විශාල රිවෝල්වරයක් ද බිය උපදවන ප්‍රමාණයේ පිහියක් ද ඔහු ගේ පළල් පටියේ සවි කරගෙන සිටියේය. රටක්, ගමක් හෝ නියම රක්ෂාවක් නැති පාදඩයකු වූ ඔහු පෘතුගීසි නැත්නම් ස්පාඤ්ඤ ජාතිකයෙකි.

මලානික නිල් පැහැති පෙනුමකින් යුත් කොක්ස් ඒකාන්තයෙන් ම තම රටේ නීතියට විරුද්ධ ව ආ ඉංගිරිසිකාරයෙක් විය යුතු ය. තුන් දෙනා ම සියලු නීති වලටත් දේශ සීමා ව්‍යවස්ථාවලටත් පටහැනි ව ඇත් දළ එකතු කිරීම සඳහා හොරෙන් ඇතුන් දඩයම් කරන්නෝය.

'මි-පෙ-පෝ ඔවුනට පාර පෙන්වන්නා ලෙස මෙන් ම උපදෙස් දෙන්නා ලෙස ද ක්‍රියා කෙළේය. ඔහු තරුණයකු වුවද ඇතුන් පිළිබඳ සියළු කරුණු ගැන විශේෂඥයකු බව ඇත්ත ය. ඔහු අලුත් ක්‍රම දැන සිටියේ නැත. පරම්පරාවෙන් පැවත ආ ක්‍රම ඔහු භාවිතා කෙළේය. ඇතුන් කොහොම මරාගත්තත් අනෙක් අයට කම් නැත. ගිනි වලල්ලක් මැද දැවෙන්නට සැලැස්වීමෙන් ද අඩියේ තියුණු හුල් ඇති බොරු වලවල්වලට පැන්නීමෙන් ද පස්සා ගාතයේ බල නහරය කැපීමෙන් ද වෙනත් නොයෙක් දරුණු ක්‍රමවලින් ද දස වද දී ඔවුහු ඇතුන් මැරූහ. ඒ සඳහා ඔවුනට මි-පෝ-පෝ බොහෝ ප්‍රයෝජනවත් විය.

13

කට්ටියා ගේ කට්ට කම්

'දැන් බ්‍රවුන් ගේ අසනීපය සුව අතට හැරී ඇත. එහෙත් ඔහුට තාම අලි දඩයමේ යා නොහැක. දිනක් කොක්ස් සහ බකලා මා පිට නැඟී කලින් ද මැරූ ඇතකු ගේ දළ රැගෙන එන්න යාමට පිටත් වූහ. අපි කැළෑවේ සැතපුම් කීපයක් ඇතට ගියෙමු. තමන් කියන දෙය තේරුම් යන තව කෙනෙකු ඇතැයි නොසිතා ඔවුහු නිදහසේ කතා කරමින් ගියහ. ඔවුනට මා නිකම් බර අදින සතකු පමණි.

'වොකලට් පාට වඳුරා – මොකක් ද උඹට කියන්නෙ මී-පෙ-පෝ. උඹට පොරොන්දුවේ හැටියට පහෙන් පංගුවක් දෙන්න වෙනවා. ඉතිරි හරිය උඹයි මමයි බ්‍රවුනුයි අතරේ කුනට බෙදගන්න වෙනවා. හිතාපන් ඇත් දත් රාත්තලක් මාර්ක්ස් 40 ටත් 50 ටත් අතර ගණනක් වටින බව.'

'එච්චර ගන්න අමාරුයි. උඹට බිස්නස් තේරෙන්නෙ නෑ. මෘදු ඇත් දත්, තද ඇත් දත් කියල ඇත් දළ ජාති දෙකක් තියනවා. පළමු වෙනි වර්ගය මෘදු ඇත් දත් කිවට හරි තදයි; සිනිඳුයි. ඒවා බිලියඩ් බෝල පියානෝ යතුරු සහ පනා හදන්නට ගන්නවා. ඒවා තමයි වැඩිය වටින්නෙ. එහෙත් මේ හරියෙ ඇතුන්ට ඒ ජාතියෙ දළ නෑ. ඒවා ලබාගන්න පුළුවන් නැගෙනහිර අප්‍රිකාවේ ඇතුන් ගෙන් විතරයි. මෙහෙ ඇතුන් ගෙන් ලැබෙන්නෙ තද ඇත් දත්. විනිවිද පෙනෙන ඒවා. වැඩි ඔපයකුත් නැහැ. ඒවා කුඩ මිටි, හැරමිටි, ලාබ පනා එහෙම හදන්න ගන්නවා. හැබැයි අපට පුළුවන් මේ ඇත් දත් තොගේ ම නැගෙනහිර අප්‍රිකාවට ගෙන ගියොත් නම් – එක ඇතෙක් වත් නොමරා – මෘදු ඇත් දත් ගානට විකුණන්න.

'ඉතින් අපි මොකට ද මෙච්චර මහන්සි වෙලා මේ වැඩේ කරන්නෙ?'

'නිකම්ම නොවෙයි කවුරුහරි ලාබෙ ගනීවි. අපි හතර දෙනා ම දඩයම් කරල ලැබුණු හරිය දෙකට බෙද ගත්තොත් නම් එක් කෙනෙකුට සෑහෙන ප්‍රයෝජනයක් ලැබේවි.'

'මම ඒක දැනටමත් හිතල ඉවරයි.'

'උඹ හිතන්න ඕන නෑ. උඹ ඕනෑ වැඩේ දෙන්නයි. බ්‍රවුන් තව දවසකින් දෙකකින් නැගිටීවි. ඊට ඉස්සෙල්ලා උගෙ ගනුදෙනුව බේරන්න ඕනෑ. පරය, ගොනෙක් වගෙ ශක්තිමත්. මී-පෙ-පෝ වදුරෙක් වාගෙ කඩිසරයි. අපි උන් දෙන්නා ගෙන් ම එක පාර නිදහස් වෙන්න ඕනෑ.

ඒක කරන්න පුළුවන් රැටයි. වැඩි පරෙස්සමට අපි බොන්න දෙමු. දෙන්නාට ම සැහෙන්න බීම අපි ළඟ තියෙනවා.'

'බලමු.'

'ආ මෙතන තමයි...'

අවාසනාවන්ත ඇතා ගැඹුරු වලේ පැත්ත පෙරළී සිටියේය. උගේ බඩ යකඩ පතුරකට කැපී නිල් වී තිබුණේය. ඌ එවිටත් පණ පිටින් සිටියේය. බකලා ඌට වෙඩිල්ලක් තබා මරා වලට බැස කොක්ස් සමඟ ඇත් දළ පොරවෙන් කපන්නට පටන් ගත්තේය. ඒ වැඩේට ඔවුන්ට මුළු දවස ම ගත විය. ඔවුන් ඇත් දළ කඹවලින් මා පිට බැඳගෙන ආපසු යන්නට පිටත් වන විට බටහිර අහසේ හිරු බැස යමින් තිබුණේය.

කඳවුර පේනතෙක් මානයේ දී කොක්ස් යළිත් උදේ නැවැත් වූ කතාව යළි පටන් ගත්තේය.

'මේක කල් දන්න කිසි ම කාරණයක් නැහැ. අද ම වැඩේ කරමු.' යි ඔහු කී ය.

එහෙත් කඳවුරට පැමිණි විට ඔවුනට බලාපොරොත්තු කඩ කර ගන්නට සිදු විය. බ්වුන් කඳවුරෙහි නොසිටීම ඔවුන්ගේ මහත් පුදුමයට හේතු විය. 'බානා' ට දඩයමේ යාමට තරම් සනීප නිසා ඔහු ගිය බවත් සමහර විට ඔහු එද රැට ආපසු නොඑන්නට ඉඩ ඇති බවත් මි-පෙ-පෝ කීය. බකලා සිතින් ඔහුට

ශාප කෙළේය. කෙසේ වුවත් මිනී මැරුම දවසකට කල් දමන්නට සිදු විය.

පසු ද උදේ කොක්ස් සහ බකලා ඇහැරෙන්නටත් පෙර බ්‍රවුන් කඳවුරට ආවේය. ඔහු මි-පෙ-පෝ වෙතට ගොස් ඔහු ගේ කරට අත දැම්මේය. ස්වදේශිකයා සිය සුදු පැහැති දත් පෙනෙන සේ මුව දල්වා සිනා සුණේය. බ්‍රවුන් ඔහුගේ අතින් අල්ලාගෙන මා ළඟට අවුත් මා පිට නගින්නට අණ කෙළේය. මි-පෙ-පෝ මට සංඥවක් කළ විට මම දණ ගැසුවෙමි. ඔවිහු මා පිටට නැංගා හ. මම ඔවුන් වනයේ සීමාව කරා ගෙන ගියෙමි.

'මට ඕනෑ ඒ ගොල්ලට තෑග්ගක් ගෙනියන්නයි. ඒ ගොල්ලගෙ හිතේ මම ලෙඩින් කියල. මට දැන් සනීපයි. මම මැරුව කදිම දළ තියෙන ඇතෙක්. මේක බකලාටත් කොක්ස්ටත් පුදුමයක් වේවි.'

ගං ඉවුරේ කෝපි පඳුරු ගොල්ලක පෙරළී තිබුණු අති විශාල ඇතකු ගේ ඉදිමුණු මළ සිරුර උඳ වන හිරු ගේ එළියෙන් මම දුටිමි.

'ඇත් දළ කපාගැනීම නිම වූ වහා ම අපේ ඉරණමට මූණ පාන්නට – අපි කඳවුර බලා පිටත් වීමු. බ්‍රවුන් සහ මි-පො-පෝ ඉක්මනින් ම මරු දකිනු ඇත. ටික දවසක් පමා වුවත් මටත් සිදු වන්නේ ඒ ටික ම ය. මට නම් ඔවුන් ගෙන් බේරී යන්නට ඉඩ තිබුණි. එහෙත් මට ඉක්මනින් ම අනතුරක් සිදු වන ලකුණක් නුවූ නිසා ද මම පළා යන්නට උත්සාහයක් නොකෙළෙමි.

මම විශේෂයෙන් මි-පෙ-පෝ ගැන කණගාටු වීමි. එහෙත් මා ඔවුනට මෙය කෙසේ දන්වන්නද? ඔවුන් මුහුණ පා සිටින අනතුරු ගැන ඔවුන් හට කියන්නට මට බැරිය. එහෙත් සමහර විට ඔවුන් කඳවුරට ගෙන යාම ප්‍රතික්ෂේප කිරීමට මට හැකි වනු ඇත.

මම වහා ම පාරෙන් ඉවතට හැරී කොංගෝ ගහට මූණ ලා ගමන් ගතිමි. ගංහාවට ළඟා වූ විට වෙනත් මිනිසුන් හමුවනු ඇතැයි ද එවිට අපට ශිෂ්ටාචාර මිනිසුන් වසන වෙනත් රටකට යා ගත හැකි වනු ඇතැයි ද මම සිතුවෙමි. එහෙත් මා අකීකරු වීමට හේතුව තේරුම් නොගත් බ්‍රවුන් තියුණු යකඩ උලකින් මගේ බෙල්ලට අනින්නට පටන් ගත්තේය. මට බොහෝ වේදනා ඇති විය. ඉංගිරිසිකාරයා ගේ උංඩයෙන් වූ තුවාලය සුව වීමට හුඟ කලක් ගත වූ බව මට සිහිවිය. මගේ බෙල්ලේ හම සිදුරු නොකරන ලෙස මි-පෙ-පෝ බ්‍රවුන් ගෙන් ඉල්ලා සිටින බව ද මට ඇසුණේය. එහෙත් බ්‍රවුන් ට් හොඳට ම කේන්ති ගොස් තිබුණ නිසා ඔහු වඩාත් තදින් හෙංඩුවෙන් අනින්නට පටන් ගත්තේය.

මා තමා ගේ අදහසට නම්මා ගන්නට සිතා මි-පෙ-පෝ සැනසිලි වදන් කියන්නට පටන් ගත්තේය. මට ඔහුගේ වචන තේරුණේ නැත. එහෙත් කට හඬෙහි ලීලාව නිසා ඔහු කියන දේ තේරුම් ගත හැකි විය. ඔහු නැමී මගේ බෙල්ල ඉම්බේය. අනේ අසරණ මි-පෙ-පෝ, තමා කරන ඉල්ලීමෙහි ප්‍රතිඵලය ඔහු දන්නවා නම්!

'මූව මරල වැඩේ ඉවරයක් කරපන් යැයි බ්‍රවුන් කෑ ගැසුවේය. කට්ටියාට බර අදින්න බැරි නම් උෆ දළට මිසක් වෙන දේකට ඕනෑ නැහැ. කෙළෙහි ගුණයක් නැති සතා කට්ටියා ම තමයි.... කලින් හාම්පුතාගෙන් කට්ටි පැන්න එක පුදුමයක් නෙමෙයි. දැන් අපෙනුත් පනින්න හදනවා. උන්දෑ අපෙන්නම් පනින්නෙ නැහැ. ඊට ඉස්සෙල්ල මම උගෙ කණටත් ඇහැටත් අතරෙන් උංඩයක් යවනවා.'

'මේ වචන ඇසෙන විට මම භයෙන් වෙවුලා ගියෙමි. පළපුරුදු අලි දඩයම් කාරයකු වූ බ්‍රවුන්ට අලියකු ගේ පිටේ හිඳ වෙඩි තිබ්බොත් පොඩ්ඩක් වත් වරදින්නට බැරි ය. මා මැරෙන්න ද? නැත්නම් ඔවුන් ඒකාන්ත මරණය කරා ගෙන යන්නද? මාව නොමරන්නැයි මි-පෙ-පෝ බ්‍රවුන්ට යාඥා කරනු මට ඇසේ. එහෙත් ඉංගිරිසිකාරයා මුරංඩු ය. ඔහු දැනට ම රයිපලය කරෙන් අතට ගෙන ඇත.

ඕනෑවට වඩා ප්‍රමාද නොවී වහා ම කඳවුර පැත්තට හැරුණෙමි.

'උඹ හිතන්නේ ඇතාට අපි කතා කරපු දේ තේරිල මං කරන්න යන දේ දැනගත්තයි කියල ද?' බ්‍රවුන් සිනා සෙමින් ඇසී ය.

මම යටත් පහත් ලෙස අඩි කීපයක් ගමන් කෙළෙමි. ඊට පසු එක පාරට බ්‍රවුන් සොඩින් ගෙන කරකවා ඉවතට දමා ගැසුවෙමි. ඉන් පසු මි-පෙ-පෝ

පිට උඩ සිටියදී ම මම කැළේට දුවන්නට විමි. බ්‍රවුන් කෑ ගසන්නටත් අවලාද කියන්නටත් පටන් ගත්තේය. ඔහුට එතරම් තුවාල නොවූ නමුත් අසනීප යෙන් දුර්වල ව සිටි නිසා ඉක්මනින් නැගිටින්නට අසමත් විය. මම එම අවසරයෙන් කැලයට පැන ගතිමි.

'මට මේ දෙන්නම බේරාගන්න බැරි නම් අඩු ගණනේ මි-පෙ-පෝ වත් බේරාගන්නවා' යි මම සිතුවෙමි.

එහෙත් මි-පෙ-පෝ ටත් කඳවුරේ සෙස්සන් සමග එකතු වන්නට ඕනෑ විය. ඔහු මාස ගණනක් තිස්සේ සිය ජීවිතය පවා අවදනමට කැප කොට ඇතුන් දඩයම් කළේ නිකම්ම නොවේ. ඔහුට ඇත් දළවලින් කොටස ලැබෙන්නට තිබුණේය. මට ඔහු සොඩින් අල්ලාගන්නට තිබුණ නමුත් ඔහු මගේ පිට උඩ සිට බිමට පනිතැයි සිතා එසේ නොකෙළෙමි. එහෙත් වදුරකු මෙන් කඩිසර මේ අප්‍රිකානු තරුණයා වෙත ක්‍රමයක් අනුගමනය කෙළේය. මා කැළෑව අද්දරින් යන විට ඔහු අත්තක් අල්ලාගෙන ගස්වල අතු අතරට පැන ගත්තේය. මි-පෙ-පෝ මට හොඬ දිගු කළ හැකි හරියෙන් උඩට ගියේය. එහෙත් මම ගස යට මදක් නැවතී සිටියෙමි. බ්‍රවුන් හෙමිහිට මා පසු පස බඩ ගා එන බව මට ඉව වැටුණේය. ඔහු මට වෙඩි තබන්නට පෙර මම පිම්මේ කැළෑවට පැන ගත්තෙමි.

මම මදක් නැවතී සිටියෙමි. ඔවුන් ගේ සද්දයක් නැත. ඔවුන් ආපසු යන්නට ඇති බව මට පැහැදිලි ය.

එහෙත් මට ඔවුන් මේ බියකරු ඉරණමට පත් වන්නට ඉඩ දී නිකම් සිටිය නොහැකි ය. මම වෙන පාරකින් ගොස් ඔවුනට පෙර කඳවුරට පැමිණියෙමි. අගනා ඇත් දල දෙකක් පිටේ බැඳගෙන ආරෝහකයන් නැතිව පැමිණි මා දුටු කොක්ස් සහ බකලා අතිශයින් පුදුමයට පත් වූහ.

'බ්‍රවුන් ගෙනුයි මි-පෙ-පෝ ගෙනුයි නිදහස් වෙන්න අලියි වල් සත්තුයි අපට උදවු කරලා වත් ද?' කොක්ස් බැම් ලිහන ගමන් ඇසීය.

එහෙත් ඔවුන් ගේ සතුට වැඩි කල් නොපැවතුණේය. ඉක්මනින් ම බ්‍රවුන් දෙස් දෙවොල් තබමින් ආවේය. මි-පෙ-පෝ ද ඔහු සමග විය. බ්‍රවුන් මා දුටු හැටියේ මා මරා දමන බව කියා දිවුරන්නට විය. මා ඔවුනට කල හිරිහැරය ඔහු විස්තර කෙළේය. මා වහාම මරා දමන්නට අනිත් අය කැමති කරවාගන්නට ඔහු උත්සාහ කෙළේය.මා මරා නොදැමීමේ වාසිය තක්සේරු කරන කොක්ස් එයට විරුද්ධ විය. ඔහුත් බකලාත් බ්‍රවුන්ට සුවය ලැබීම ගැනත් මෙතරම් වටිනා ඇත් දළ ජෝඩුවක් ද රැගෙන යළිත් ඔවුන් අතරට පැමිණීම ගැනත් ප්‍රීතිය ප්‍රකාශ කළහ.

14

මරුවෝ මරාගෙන මැරෙති.

'ඔව්හු වේලාසනින් නින්දට ගියහ. වෙහෙසට පත් වී සිටි බ්‍රවුන්ට තදින් නින්ද ගියේය. කොක්ස් ඔත්තු බලමින් සිටියේය. බකලා ඔහු ගේ ලොම් ඇතිරිල්ල මත වැතිරී අවදියෙන් සිටියේය. ඔහු වරින් වර ඔළුව උස්සා කොක්ස් දෙස විමසිලිමත්ව බැලුවේය. කොක්ස් සෑම විටක ම 'තව වෙලාව ආවෙ නෑ' කියන්නාක් මෙන් ඔළුව වැනුවේය.

'අව පක්ෂයේ නැමී සඳ කැළෑවට උඩින් පායා තිබුණි. එළිමහන් ප්‍රදේශය පුරා නොපැහැදිලි ආලෝකයක් පැතිර තිබුණි. අත දරුවකු ගේ දුක් බර කෑ ගැසීමක් බදු හඬක් ගැඹුරු නිහඬතාව තුළින් ඇසුණේය. එය සමහර විට වනයේ කිසි තැනෙක රුදුරු වන සතකු ගේ දත් වලට අසු වූ කුඩා සතකු නැගූ මර ළතෝනියක් විය හැකි ය. තද නින්දේ සිටින බ්‍රවුන් මේ හඬින් ද අවදි

නොවී ය. කොක්ස් හිස වනා සංඥුවක් කෙළේය. ඔහුගේ සෑම ඉරියව්වක් ගැන ම සෝදිසියෙන් සිටි බකලා තමා ගේ පිටු පස සාක්කුවෙහි වූ රිවෝල්වරයට අත යැව්වේය. දැන් මටත් ක්‍රියාකාරී වීමට වෙලාව පැමිණ ඇතැයි මම සිතුවෙමි. ඉන්දියානු ඇතුන් තමන් ගේ සතුරන් බය කිරීමට කරන දෙය මමත් කෙළෙමි. මම හොඬේ තුඩ පොළවට තබා තදින් පිම්බෙමි. අපූර්ව භයංකර නාදයකින් පළාත ම දෙවනත් විය. පිපිරීමකටත් ගෙරවීමකටත් පිඹීමකටත් අතරේ වූ ඒ නාදය මළවුන් පවා නැඟිටුවන්නකි. කොහොමටත් බ්‍රවුන් මැරී සිටියේ නැත.

'මොන පරයද බොල මෙතන හොරණ්ඩු පිඹින්නෙ?' කියමින් බ්‍රවුන් නිදිමත පෙරන ඇස් කරකවමින් හිස ඔසොවා බැලී ය. බකලා වහා බිම ඉඳගත්තේය.

'මොකද? උඹ ජවුසෙන් නටන්න හදනව ද?' බ්‍රවුන් ඔහු ගෙන් ඇසී ය.

'මම.... ආ..... අලිය මාව ඇහැරෙව්වා' යි ඔහු කී ය.

බ්‍රවුන් යළිත් නින්දට වැටුණේය. කොක්ස් යළිත් ඔත්තු බැලුවේය. මද වේලාවකට පසු බකලා රයිපලය ගෙන බ්‍රවුන් ළඟට ආවේය. මම යළිත් මුළු ශක්තියෙන් නාද කෙළෙමි.

බ්‍රවුන් නැඟිට මා වෙත දුව විත් අත්ලෙන් හොඬ වැලේ අගට ගැහුවේය. මම වහා හොඬ වැල අකුළාගෙන පැත්තකට වීමි.

'මම තෝ මරා දනවා, හොර තක්කඩියා.' කියමින් ඔහු මොර ගැවේය. 'මූ ඇතෙක් නෙමෙයි. යකෙක්. මී-පෙ-පෝ මූ මඩ වගුරකට පන්නාපං.... ආ... උඹ මොකද රිවෝල්වරයත් අරන් කරන්නෙ?' ඔහු කොක්ස් දෙස සැක සහිතව බලා ඇසී ය.

'මම මේ කට්ටියා පස්සෙ වෙඩි උංඩ කීපයක් යවන්න හදනවා' යි ඔහු කීය. බ්‍රවුන් යළිත් තැන්පත් විය. ඔහුට යළිත් නින්ද යාගෙන ආවිය. කොක්ස් මා දෙස රවාගෙන 'හොර ගෙඩියා.... තොට....' කියමින් මිට මොළවා සොලවමින් මට ශාප කරමින් මිමිනුවේය.

'ඌට වල් සතකුගේ ඉව වැටිල' මී-පෙ-පෝ කී ය. මේ අප්‍රිකානු තරුණයා මා නිවැරදිකාරයකු කරන්නට උත්සාහ කරයි. එහෙත් ඔහු කොතරම් සත්‍යයට කිට්ටු දැයි ඔහු ම නොදනී. ඇත්තෙන් ම මා හඬ නැහුවේ මට වල් සතුන්ගේ ඉව වැටුණු නිසා ය. වල් සත්තු.... ඔව්. කකුල් දෙකේ කෲර වල් සත්තු....

කොක්ස් අවසාන වරට බකලාට හිස වැනුවේ වටින් ගොඩින් එලිය වැටිගෙන එද්දී ය. කොක්ස් බ්‍රවුන් දෙසටත් බකලා මී-පෙ-පෝ දෙසටත් එක වර වෙඩි තබාගෙන, පැන්නාහ. මී-පෙ-පෝ පෙර යම් රෑ කුඩා සතකු නැහූ මර ළතෝනිය වැනි දුක් බර තියුණු හඬක් නැහුවේය. ඔහු නැහිට වෙවුලා යළිත් බිම ඇද වැටුණේය. ඔහු ගේ කකුල් වරින් වර තදින් ගැහුණේය. බ්‍රවුන් කිසි ශබ්දයක් නොකෙළේය. මේවා ක්ෂණයකින්

සිදු වූ නිසා මේ අවාසනාවන්තයන් දෙදෙනාට එය දැන්වීමට මට කාලයක් නොතිබුණේය.

මි-පෙ-පෝ වෙඩි පහරින් මළ නමුත් බ්‍රවුන්ට තවමත් පණ තිබුණේය. ඔහු දකුණු වැලමිට බිම ගසා ඉස්සී කොක්ස්ට වෙඩි තිබ්බේය. කොක්ස් බිම ඇද වැටුණේය. බ්‍රවුන් ඔහු ගේ සිරුරට වුවා වී බකලාට ද වෙඩිල්ලක් තිබ්බේය.

'ආ... ඔළුව රතු පාහරයා' යැයි කියමින් බකලා කෑ ගැසුවේය. ඔහු බ්‍රවුන් දෙසට තවත් වෙඩි පහරක් තබා පැන යන්නට හැරුණේය. අඩි කීපයක් ගිය ඔහු එ තැන ම කැරකැවී බිම ඇද වැටුණේය. එළිමහන ලේ ගඳින් පිරී ගියේය. බ්‍රවුන් ගේ ගොරොද්දෙ ඇදීම හැර සියල්ල මුළුමනින් නිහඬ විය. මම කිට්ටු වී ඔහු ගේ මුහුණ බැලීමි. ඔහු ගේ ඇස් මලානික වී තිබුණේය. ඔහු තව පාරක් ගැහී වෙඩිල්ලක් තිබ්බේය. එය මගේ දකුණු හිසේ යම්තම් ගෑවීගෙන ගියේය.

මම යළිත් ඉබාගාතේ යන්නට පටන් ගතිමි.

15

වාසනා උදව

මට පළමු වරට වාසනාව උදා වූයේ මා 'මතාඩි' නගරයට ළඟා වූ පසු ය. කොංගෝ නිම්නය මුහුදින් වෙන් කරන ගිරිකුළුවලට පිටුපසින් මළ හිරු බැස යමින් තිබුණි. ගඟට නුදුරු කැළයෙහි සිටි මගේ සිත ශෝකාකූල සිතුවිලිවලින් පිරී තිබුණි. අලි රංචුවත් සමඟ දඩයක්කාරයන් ගේ ගාල් වලට නොයෑම ගැන මම දුක් වීමි. එසේ ගියා නම් මට අද රටින් පිටුවහල් කරනු ලැබූවකු සේ ඉබාගාතේ යන්නට සිදු නොවනු ඇත. එක්කෝ මා මේ ලෝකයේ විඳි දුක් කෙළවර වෙන්ට තිබුණි. නැත්නම් මට අවංක වැඩකරන ඇතකු ලෙස ජීවත් වීමට අවස්ථාව උදා වන්නට තිබුණි. මට දකුණු පසින් ගං ඉවුර දිගට පඳුරු අතරින් බැස යන හිරු ගේ රැස් වැදී රතු පාටින් බැබලෙන නදිය දිස් වෙයි. වම් පසින් ළඟ පාත මිනිසුන් වාසය කරන බව කියා පාන පොත්තේ කැපුම් සහිත විශාල රබර් ගස් වෙයි.

තවත් යාර සියයක් පමණ ගමන් කළ මම ගොවිපළකට පැමිණියෙමි. එහි මයියොක්කා, ඉරිහු, කෙසෙල්, අන්නාසි, උක්, දුම්කොළ ආදිය වගා කර තිබුණි. උක් සහ දුම්කොළ පාත්ති අතරින් පරෙස්සමින් ගමන් කළ මම එළිමහන් පිට්ටනියකට පැමිණියෙමි. පිට්ටනිය මැද තරමක් ලොකු ගෙයක් විය. ගේ ළඟ කිසිවෙක් දක්නට නොවූහ. ගෙට නුදුරින් ළමෝ දෙදෙනෙක් – පිරිමි ළමයෙක් සහ ගැහැනු ළමයෙක් සෙල්ලම් කරමින් සිටියහ. ඔවුන් ගේ වයස අවුරුදු හත අටක් විය හැක.

පිට්ටනියට යන කුරු ම ඔවුන් මා දුටුවේ නැත. මම පස්සා ගාත්වලින් හිටගෙන උස් හීන් හඬක් නගමින් සිනහ උපදවන අයුරින් නැටුවෙමි. මා දුටු ළමෝ මවිත වී බලා සිටියහ. ඔවුන් බිය නොවී – නොදුවා සිටීම මගේ අති මහත් සොම්නසට හේතු විය. මම හොඳ හැටි පුහුණු කරන ලද ඇතකුටත් වඩා හොඳින් එහාට මෙහාට පැන පැන දක්ෂ ලෙස නැටුවෙමි.

පළමුවෙන් සතුට පළ කෙළේ පිරිමි ළමයා ය. ඔහු නොවත්වා ම මහ හඬින් සිනා සෙන්නට විය. ගැහැනු ළමයා තාලයට අත් පුඩි ගැසුවාය.

මම නටමින් සහ එහෙ මෙහෙ පනිමින් ද වරක් පස්සා ගාත්වලිනුත් වරක් ඉස්සරහ ගාත්වලින් නැගී සිටිමින් තනි කකුලින් සිටගෙන වටේට කරකැවෙමින්ද ඔවුන් සතුටු වන අයුරු රහ දැක්වීමි.

'මගේ හැසිරීම නිසා වඩ වඩා කුල්මත් වූ ළමෝ කිව්වුවට ම ආහ. හොඬ වැල මත නැගී ඔංචිලි පැදීමට ආරාධනා කරන්නාක් මෙන් මම පිරිමි ළමයා වෙතට හොඬ වැල දිගු කෙළෙමි. මද පැකිළීමකින් පසු මගේ වක් කළ හොඬ මත වාඩි වූ පසු මම ඔහු පැද්දුවෙමි. අනතුරු ව ගැහැණු ළමයා ද එසේම පැද්දුවෙමි. මේ නිදහස් සුදු ළමයින් දෙදෙනා සමග ඇසුරට වැටීම නිසා නොකිව හැකි තරම් ප්‍රීතියට පත් මම ඔවුන් සමග ක්‍රීඩා කිරීමට මුළුමනින් යොමු වීමි. ඒ නිසා ළමයින් ගේ පියා වූ උස කෙට්ටු මිනිහා මා වෙත ළඟා වන තුරු ම මම නොදත්තෙමි. කහ පාටට හුරු හමක් ද ගිලුණු ඇස් ද ඇති ඔහු සාර්මකලාපික උණෙන් පෙළී මෑත දී සුවය ලත් අයකු බව පෙනුණි. බලවත් ලෙස මවිතයට පත් ඔහු කතා කරගත නොහැකි ව බලා සිටියේය. 'තාත්තා...' යි පිරිමි ළමයා කෑ ගැසුවේය. 'බලන්න අපට හම්බ වෙච්ච හොයිටි-ටොයිටිගෙ හැටි...'

'හොයිටි-ටොයිටි' පියා සන්සුන් හඬින් එය ප්‍රතිරාවය කෙළේය. කුමක් කළ යුතු දැයි නොදැන ඔහු දෙඅත් ඔසොවාගෙන මා දෙස බලා සිටියේය. මම දනින් වැටී හොඬ අකුළා ඔහුට හස්ත්‍යාචාරය කෙළෙමි. ඔහු මගේ හොඬ වැල අත ගෑවේය.

'ප්‍රීතියෙන් ප්‍රමුදිත වූ මම 'හා... අන්තිමේ දී ජයගත්තා' යි සිතුවෙමි.'

ඇතා ගේ කතාව මෙතෙකින් හමාර ය. උෆට අවසාන වශයෙන් කුමක් සිදු වී ද යන්න වෙසෙසින්

සැලකිය යුතු දෙයක් නොවේ. කෙසේ වුවත් වැග්නර් ඩෙනිසොව් සහ ඇතා ස්විට්සර්ලන්තයේ උත්කර්ෂවත් විනෝද චාරිකාවක යෙදුණ බව නම් කිව යුතු ය. මුලදී රිං යාමට ආසාවෙන් සිටි ස්විට්සර්ලන්තයේ 'වැවේ' ප්‍රදේශයෙහි විවේකීව ගමන් කරන්නට හැකි වීම ඉමහත් ප්‍රදුමයක් ලෙස වූ ඔවුහු සැලකුහ. ඔහු සතුටින් ජිනීවා විලේ දිය නෑවේය. එහෙත් අවාසනාවකට මෙන් ඒ අවුරුද්දේ සීත කාලය තරමක් වේලාසනින් පැමිණීම නිසා සංචාරකයනට විශේෂ වැගනයක් යෙදූ දුම්රියකින් ආපසු බර්ලිනය බලා යාමට සිදු විය.

හොයිටි-ටොයිටි තමා ගේ රාත්තල් අට සීයේ ආහාර සලාකය අවංක ලෙස උපයා ගනිමින් ද බර්ලින් නගර වාසීන් පමණක් නොව මේ 'බුද්ධි දැවැන්තයා' දැක බලාගැනීමට ලොව දස දෙසින් බර්ලිනයට එන දස දහස් ගණන් විදේශිකයන් මවිතයට පත් කරමින් ද තවමත් බුෂ් සර්කසයෙහි රැහුම් දක්වයි. ස්ට්‍රෝම් හොයිටි-ටොයිටි මගින් දක්වන ලද අසහාය දස් කම් අනුකරණය කිරීමට ලොව පුරා ඇති සර්කසයන්හි කළමනාකාරවරු නිෂ්ඵල උත්සාහයක් දරති. හොයිටි-ටොයිටි මෙතරම් විශිෂ්ඨ බුද්ධිමතෙකු බවට පත් වූයේ කෙසේ ද යන්න ගැන විද්‍යාඥයෝ තවමත් කර්ක විතර්ක කරති. සමහරු එය ප්‍රයෝගයකැයි කියති. සමහරු අවස්ථානුරූප ව ඉබේ සිදුවන්නකැයි කියති. සමහරු එය සාමූහික මෝහනයකැයි කියති.

ජූං දැන් අතිශයින් ආචාර සම්පන්න ය. සේවය ගැන ඉමහත් උනන්දුවක් දක්වන ඔහු ඇතා ගැන ඉතා සැලකිලිමත් වෙයි. මේ සියල්ල හුත බලයකින් සිදුවන්නක් ය යන ගුඩ හැඟීමක් ඇතැම් විට ජූං තුළ ඇති වෙයි. එහෙත් ඔහු හොයිටි-ටොයිටි පිළිබඳ ව ගෞරව සම්ප්‍රයුක්ත භයකින් යුතුව හැසිරෙයි. හොයිටි-ටොයිටි හැම ද ම පුවත් පත රැගෙන ඒ දෙස පරීක්ෂාවෙන් බලා සිටී. දිනක් ඌ ජූං ගේ සාක්කුවේ තිබී කඩදසි කැට්ටමක් සොරකම් කර ගත්තේය. පසු දවසක ජූං දුටුවේ පුදුම දෙයකි. මුනින් අතට හරවා තිබූ බැරලයක් මත කැට්ටමේ කොළ විසුරුවා ඇතා තනියම බූරු සෙල්ලම් කරමින් සිටියේය. අනෙක් අය තමා බොරුකාරයෙකැයි කියනුවට බියෙන් ජූං මෙය කාටවත් නොකියා තමාට ම රහසක් කොට තබාගත්තේය.

*　　*　　*　　*

අකිම් අයිවනෝව්විච් ඩෙනිසොව්ගේ ලියවිලි අනුව මේ කථාව සකස් කර ගත්නා ලදී. මහාචාර්ය වැග්නර් පිටපත කියවා බැලීමෙන් පසු පහත සඳහන් කොටස එහි අගට එකතු කෙළේය.

"මේ සියල්ල සැබැවින් ම සිදුවූ දේ ය. එහෙත් මේ තොරතුරු ජර්මන් බසට නොපෙරළන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි. රිං ගේ රහස අඩු ගණනේ ඔහු කිට්ටුවෙන් ඇසුරු කළ අයට වත් රහසක් කොට තබාගත යුතුය.

අයි. ඇස්. වැග්නර්"

නිමි.

ප්‍රථම සෝවියට් විද්‍යා ප්‍රබන්ද ලේඛකයා වන *"ඇලෙක්සැන්ඩර් බෙලායෙෆ්"* තොමෝ සෝවියට් විද්‍යා ප්‍රබන්ධ ලේඛකයා ලෙස ද බොහෝ විචාරකයෝ සලකති.

1884 දී ස්මොලෙන්ස්කි හි උපන් ඇලෙක්සැන්ඩර් මූලික අධ්‍යාපනයෙන් පසු නීතිය සහ සංගීතය හැදෑරුවේය. විද්‍යාලීය ශාස්තෘ උපයා ගැනීම සඳහා වාදක මණ්ඩලයකට බැඳී සේවය කිරීමට අමතරව වේදිකා සැරයිලි සකසුවකු සහ ස්වාධීන පත්‍ර කලා වේදියකු ලෙසද කටයුතු කළ ගෙහෙම උපාධි ලාභයෙන් පසුද දිගටම ඒවා කර ගෙන ගියේය. 1925 දී නීති වෘත්තිය අත් ගළ බෙලායෙෆ් ජීවිතය ලේඛන කලාවට කැප කෙළේය.

1926 දී ජනප්‍රිය සාහිත්‍ය සඟරාවක කොටස් විශයෙන් පළ කරවන ලද ඔහුගේ ප්‍රථම විද්‍යා නවකතාව අතිශයින් සාර්ථක විය. එතැන් සිට 1942 ජනවාරියේ දී ඔහුගේ මරණය සිදුවන විටත් ඔහු විසින් ලියන ලද 50 කට වැඩි නවකතාවල පිටපත් දස ලක්ෂයක් අලෙවි වී නිබිණි.

'කුංවනාද' ඇලෙක්සැන්ඩර් බෙලායෙෆ්ගේ කතා ඒකතුවක් වන 'මහාචාර්ය වැග්නර්' ගේ පිටිත කතාව නම් පොතේ එන "HOITY-TOITY" නම් කතාවේ සිංහල අනුවාදයයි.

වරෙක විශිෂ්ටතම විද්‍යා ප්‍රබන්ධ අනුවාදය උදෙසා වූ ජනාධිපති සම්මානය දිනූ **ජේ. ඊ. ගුණසේකර** බෙලායෙෆ්ගේ කෘති කිහිපයක්ම පරිවර්තනය කොට ශ්‍රී ලාංකික පාඨකයින්ට පිළිගැන්විය.

1916 මාර්තු 26 වැනි දින පනාගොඩ ග්‍රාමයෙහි උපන් ජේ. ඊ. මූලික අධ්‍යාපනය ගමාර කොට අවසන් ගුරු විහාගයට පෙනී සිට 1934 වසරේදී සාමාර්ථය ලබා ගත්තේය.

පසුව බලවත් ලෙස රෝගාතුර වූ හෙතෙම වසර දහයක් ගිලන් ඇඳේ සිටීමෙන් පසු 1945 වර්ෂයේ දී ගුරු වෘත්තියට පිවිසියේය.

පනාගොඩ පාඨශාලාවේ උද්දීප්තිමත් වකවානුවක් පසු කරමින් රටට හිතැති පරපුරක් බිහිකිරීමට මහඟු ලෙස දායක වූ හෙතෙම සිය ප්‍රථම කෘතිය වන 'රවනාදර්ශය' එළි දැක්වූයේය.

නැවත ඉස්මතු වූ ශාරීරික දුබලතාවය හේතු කොට 1963 දී ගුරු සේවයට ආයුබෝවන් කී හේ සිය දිවිය ලේඛන කලාවට සහ සමාජ සේවයට කැප කළේය.

1980 දී පළවූ 'කුංවනාද' ගුණසේකරයන්ගේ කුඵදුල් විද්‍යා ප්‍රබන්ධ අනුවාදය වූ අතර ඒද සිට 1988 ඔක්තෝබර් මස 8 වන දින අපෙන් සදහටම සමුගන්නා තුරු අලුතන්‍ය විද්‍යා ප්‍රබන්ධ කිහිපයක්ම පාඨකයනට තිළිණ කළේය.

අද දිහද, ජේ. ඊ. විසින් අනුවාදිත නිර්මාණ ජනතාව විසින් ආදරයෙන් වැළඳ ගැනීම නොමයෙන සාහිත්‍ය සේවාවට පිදෙන උපහාරයක් වනු ඇත.

ISBN 955-9049-02-X

මිල රු. 100/-